

# ධම්ම පදට්ඨ කථා

# ගාථාසන්නය

# ධම්ම පදට්ඨ කථා

# ගාථාසන්නය.

රත්මලානේ

පරමධම්මචේතිය පරිවෙණාධිපති

ගණාචාර්‍ය වලානේ ධම්මානන්ද ස්ථවිරපාදයන් වහන්සේගේ හා

විද්‍යෝදය පරිවෙණ වාසී

ආචාර්‍ය ඤාණේශ්වර ස්ථවිරයන් වහන්සේගේ ද

ශිෂ්‍ය වූ

සූරියගොඩ සුමඞ්ගල සාමීන් විසින්

සම්පාදිතයි.

ඩී. සී. අළගියවන්න අප්පුහාමි විසින්

කොළඹ හුණුපිටියේ

ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

2442

1899.

# DHARMA PADARTHA KATHA GATHA SANNAYA.

OR

**AN ORIGINAL PARAPHRASE OF STANZAS OF**

DAMPIYATUWA


BY

SURIYAGODA SUMANGALA BHIKKHU

PUPIL OF

WALANE DHAMMANANDA MAHA THERA

*Principal of P. Dhamma Chetiya College*

Ratmalana, and of

MAHAGODA NANISSARA THERA

*Asst: Principal of Vidyodaya College.*


---


Printed and Published by

**D. C. ABHAYAWARDHANA**

at the

"Jinalankara" Press

HUNUPITIYA

COLOMBO.

---

**1899**

# Preface.

The Dhammapada Atthakatha or the Dhampiá Atuwáwa is a commentary on the Dhammapada compiled by the illustrious commentator Buddhagôsa Maha Thera, the author of Visuddhi Magga. The Dhammapada forms part of one of the 15 Books constituting the Khudgoth Sangi, which is amongst one of the Books of the Sútta Pitaka. The Dhammapada Atthakathà, which is now printed, is used by students in all the Pàli Colleges as a standard work for the study of the Pàli Literature. The Sinhalese Sovereign Silàmèghawarna has compiled a treatise giving explanatary notes on the difficult words found in the DhammapadaAtthakathà named "Getapada Vivarana" or a Vocabulary, which has been published.

The Maha Thera Dhammasèna has made a Sanne (paraphrase) of the Atthakathá known as "Ratanàvaliya," which has already appeared in print. These publications will prove to be of great assistance to the student of the Atthakathà. The Atthakathá comprises of Gàthàs (stanzas) that are culled from almost all the Books of the Sútta Pitaka For a transalation of and comments on these Gàthàs reference is at present made to the Books from which they are culled, which involves great difficulty and much trouble. In producing this work my endeavour has been chiefly to avoid such difficulties and afford greater facility to the student.

The compilation of this work has been greatly due to the solicitation of those, who have approved my Páli Poem entitled "Lakhana Sathaka," consisting of 125 verses describing the 32 characteristic features of the Lord Gautama Buddha and the physiognomical signs depicted in His body, and composed at the time I applied for the Upasampada (ordination.)

My best thanks are due to my Teachers and to those, at whose request this work has been prepared.

S. SUMANGALA,
Author.

P. Dhammachetiya College,
Ratmalana, 7th March 1899.

*THIS BOOK RESPECTFULLY*

*DEDICATED TO*

# THE VEN: H. SRI SUMANGALA

*HIGH PRIEST*
*PRINCIPAL OF*
*VIDYODAYA PARIVENA*

BY

THE AUTHOR

කොළඹ

මාලිගාකන්දේ විද්‍යෝදය පරිවේණාධි ස්වාමිවූ

පූ ජ්‍යා චා ර්‍ය

හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන

දකුණු බටහිරපලාත් සහිත ශ්‍රීපාදස්ථානයෙහි

ප්‍රධාන නායකස්ථවිර පාදයන් වහන්සේ විසින්

සමාදරයෙන් පිළිගන්නා ලදී.

# සංඥාපනය.

විසුද්ධ බුද්ධං සුවිසුද්ධදයකං
විසුද්ධ බුද්ධාවගතඞ්ග ධම්මං,
විසුද්ධ සඞ්ඝං හතපාප සඞ්ඝං
විසුද්ධි කාමො පණමාමි නිච්චං.

අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරපාදයන්වහන්සේ විසින් කරණලද දම්පියාටුවාව අසමදවාචාය්‍යීයන්වහන්සේලා දෙනමවිසින් ලිපිදොෂ නිරාකරණයෙන් සකස්කරදෙනලදින් පසුගියවර්ෂයෙහි මුද්‍රණයෙන් ප්‍රචලිතවිය. ඒ සම්බන්ධව දතමනාකරුණු එහි උපන්‍යාසයෙන් ප්‍රකාශවෙන බැවින් මෙහිදී අප විසින් වැඩිදුරකරුණු නොලියනුලැබේ.

එහි සඳහන්වූසේම පාලිභාෂාව ඉගෙණගන්නා ශිෂ්‍යයන්ට ගණවාචක ආචාය්‍යීවරයන් විසින් පාලිභාෂාභ්‍යාසයපිණිස ප්‍රථමකොට පුහුණුකරවනු ලබන මෙම දම්පියාටුවාව ශිලාමෙඝවණ්ණාභයකාශ්‍යප රජතුමන් විසින් කරණලද දමපියාටුවාගැටපදය ධම්සෙන මහාස්වාමින්වහන්සේ විසින් කරණලද රතනාවලිය යනාදි පරිවාරග්‍රන්ථාන්තරසම්පත්තීන් සංයුක්ත වීත් ආධුනිකයන්ගේ විත්තාභිලාෂා සමෘද්ධිය ප්‍රමාණකොට මේ සම්බන්ධව කටයුතුරවනා තවත් ශෙෂවූයෙන් අපටද මේ ව්‍යාපාරයෙහි යෙදෙන්ටවිය; එනම්: දමපියාටුවාවේ ඒ ඒ වස්තුකථාවන්හි අන්තරාන්තරයෙහි දීඝ මධ්‍යම සංයුක්ත අඞ්ගුත්තර යන නිකාය චතුෂ්කයෙන් හා ඛුද්දකනිකායට අයත් ධම්මපද උදාන සූත්‍රනිපාත ජාතක විමානවස්තු ප්‍රෙතවස්තු යනාදී පොත්වලින්ද උපුටාගන්නාලදුව ඒ ඒ තන්හි යෙදී තිබෙන තුන්සියයක් (300) පමණ ගාථාදෙශනාවලින් මෙම ධම්පදාර්ථකථාව සංකීර්ණවතිබේ. එසේ ඒ ඒ තැනින් උපුටා යොදාතිබෙනගාථා දෙශනාවන්ගේ පදාර්ථභාවාර්ථාවබොධය ආධුනිකයන්ට තබා වැඩිහිටියන්මත් දුෂ්කරවනු පුදුමනොවේ. එසේම අර්ථකථාදියක් හා සසඳනොබලා බුද්ධදෙශනාවලට අරුත්බිණීමද භයානක කරුණකි නුමුත් එක් එක් ගාථාවක්පාසා පෙල සොය සොයා අටුවා සොය සොයාත් එය නොකටහැක්කකි.

ආධ්‍යයන ආධ්‍යාපනයෙහිදී මේ නිසා සමහරු ලබන හිරිහැරය සැලකූ ශාසනසම්පත්තිකාමී සම්පරබුද්ධිමත් අසමඛිතෙෂී භවතුන් කීපදෙනෙක් විසින් මේ ධම්පදාර්ථකථාගාථාවන්ම සන්නයක්කරණු පිණිස අපට ආරාධනාකළහෙයින් ග්‍රන්ථකාරක පූර්වපණ්ඩිතානුගතව ධම්පදාර්ථකථාහුගේ පරිවාරග්‍රන්ථාන්තරසම්පත්තිය සම්පූර්ණකිරීම්වශයෙන් දීඝනිකායාදී ඒ ඒ ආගම හා තත්තදර්ථකථාවන්ද බලා මාවිසින්

මේ ගාථාසන්නය ලියා අසමදෘවාචාර්යයන්වහන්සේලාගේ උපදෙස්පරිද්වූ ශුද්ධියෙන් නිමවනලදී. මෙසෙසින් මෙය ධම්මපදගාථාසන්නයක් නොව දම්පියාටුවාවේකථාවස්තූන්හ් අතරතුරහිබෙන ගාථාවන්ට ලියූ සන්නයක් බවත් කථාවස්තු නාම දැක්වීමේදී ඒ ඒ ගාථාවලින් ප්‍රකාශකරණුලබන්නාවූ ජාතකාදීන්ගේ නාම නොව ඒ ඒ ජාතකාදීන් ගර්භකොට ඇතිධම්පදඅටුකථාවස්තූන්ගේ නාම දක්වනලද බවත් සැලකියයුතුයි. අපගේ මේ ධම්පදඅටුකථා ගාථාව්‍යාඛ්‍යාසෙහි අනිදුර්බොධ්‍යස්ථානයන්හි සමාසවිග්‍රහාදියත් ශිෂ්‍යයන්ගේ සුඛාවබොධය පිණිස අධොලිපි වශයෙන් යොදනලදී. සමහර ගාථාවන්හි නානාපාඨවශයෙන් දක්නාලැබුනැන් ආචාර්යයන්වහන්සේලාගේ මතයසේම මුද්‍රිත ධම්පදඅටුකථාවට වෙනස්වද යොදනලදී.

1 වෙනි ගාථාවෙහි 'ජලිතො' යනු 'ජාලිතො' සිද, 20 වන්නෙහි 'ඛණෙනෙව උපාගනසාවා' යනු 'ඛණෙන එවාගනසාවාන' සිද, 29 පිටේ 96 වෙනි සන්නයේ "කොකනදයයි කියනලද පියුම්" යනු "කොකනදයයි කියනලද පියුම් (රන්පියුම්)" සිද, 32 වෙනිපිටේ අධොලිපියේ "සබ්බකාමෙති සමිඞි සබ්බකාම සමිඞි" යනු "සබ්බෙ ච තෙ කාමාචෙ'ති සබ්බකාමා සමිඬා ච තෙ සබ්බකාමා වෙ'ති සමිඬසබ්බකාමා, තෙ අස්සසනි'ති සබ්බකාමයම්ඞි,තං." සිද සැලකියයුතුයි. මේ ඇර 22 වෙනි පිටේ 75 වන්නෙහි "ඉංමෙහි අඞිහි" යනු "ඉමෙහි අඞෙහි" යයි නෙණ "මේ කාරණාඅපින්" යි මිලින්දප්‍රශනයෙහි ලියාතිබෙන බවද සැලකියයුතුයි.

S. SUMANGALA.

P.DHAMMA CHETIYA COLLEGE.
RATHMALANA,
7 TH: MARCH 1899.

# ධ ම් ප ද ට්ඨ ක ථා

## ගාථා

## සන්නය.

නමො තසස භගවතො අරහතො
සමමා සමබුඩසස.

1 ක මහාමොහ තමොනඩෙ ලොකෙ ලොකනනතදසසිනා,
යෙන සඩමම පජෙජාතො ජලිතො ජලිතිඩිනා.

ස්වසමය සමයාන්තරප්‍රවීණවූ සමස්තශාස්ත්‍රාර්ණව පාරදර්ශී අනුබුද්ධබුද්ධඝොෂ මාහිමියානෝ ධම් පදට්ඨ සංවර්ණනාකරන්නෝ ආදියෙහි ඉෂ්ටදෙවතානුස්මරණය තමා ශිෂ්ටාචාර පරිපාලනයට හා රචනාහුගේ අවිඝ්නාපසමාප්තියටත් හෙතුබැවින් ග්‍රන්ථාරම්භයෙහි "මහාමොහතමොනඩෙ" යනාදිය පිහු.

1 ලොකනනතදසසිනා, ලොකාන්තදර්ශීවූ; (ලොකයාගේ කෙළවර යයි කියනලද නිර්වාණය දක්නාසුලුවූ); ජලිත ඉඩිනා, ජ්වලිතර්ඩිඇති; යෙන, යම් සම්බුදුකෙනෙකුන් විසින්; සඩමමපජෙජාතො, සඩර්ම නැමැති ප්‍රදීපයතෙම; මහාමොහ තමොනඩෙ, මහාමොහ, මහත්වූ මොහනැමැති; තමඔනඩෙ, අන්ධකාරයෙන් අවනඩ(වලඳනාලද්දා)වූ; ලොකෙ, සත්වලොකයෙහි; ජලිතො, දල්වන ලද්දේද.

---

ක මහති (වුඩිං වෙපුලලං පාපුණාතී'ති)මහනෙතා; මහවුඩියං. මුයහතී'ති මොහො, මුයහනති තෙන සමපයුතතධමමා, සයං වා මුයහති මුයහනමතතමෙවවා ත' නති,මොහො;මුහවෙචිතෙතා.තමනති සනතා එතෙනා'ති තමො, තිමු තෙමනෙ, තමනති (ආකඩ්ඛනති රතිං ලොකිකා එතථා'ති වා) තමො,තමුකඩ්ඛායං. මොහො එව තමො මොහතමො; තමො විය මොහො'ති වා; මහනෙතා ච සො මොහතමො චා'ති, මහාමොහතමො; අවනයිහිතිථා'ති ඔනඩො, අවපුබෙබා නහ බනධනෙ, තෙන ඔනඩො,මහා:පෙ:නඩො,තසමිං. ලුජජති පලුජජතීති ලොකො, ලුජ නාසෙ, ලොකියනෙතයථ ථාවරජඩගමා'තිවා; ලොකදසසනෙ, අමෙතී'ති අනෙතා, අමගතියං.ලොකසස ලොකෙ වා අනෙතා ලොකනෙතා; තං පසසති සීලෙනා'ති ලොකනතදසසී;තෙන.

2 තස්ස පාදෙ නමස්සිත්වා සම්බුද්ධස්ස සිරීමතො,
සද්ධම්මං චස්ස පූජෙත්වා කත්වා සඞ්ඝස්ස චඤ්ජලිං.

2 සිරීමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒසම්බුද්ධයන් වහන්සේගේ; පාදෙ, ශ්‍රීපාදයුගමය; නමස්සිත්වා, (භක්ති ශ්‍රද්ධාතිශයෙන්)වැඳ; අස්ස, උන්වහන්සේගේ; සද්ධම්මං ච, (මාර්ගඵල නිර්වාණයන) සද්ධර්මයද; පූජෙත්වා,පුදා ; සඞ්ඝස්ස ච, සඞ්ඝයාටද ; අඤ්ජලිං කත්වා, ඇඳිලි කොට:

3 තං තං කාරණ'මාගම්ම f ධම්මා'ධම්මෙසු කොවිදො,
g සම්පත්තසද්ධම්මපදො සත්ථා h ධම්මපදං සුභං.

4 දෙසෙසි i කරුණාවෙග සමුස්සාහිතමානසො,
යං වෙ n දෙවමනුස්සානං m පීතිපාමොජ්ජවඩ්ඪනං.

3–4 ධම්මාධම්මෙසු, කුශලාකුශල ධර්මයන්හි; (නොහොත්) කුදුම හන් දහම්යයි කියනලද ලොව්ලොවුතුරාදහම්හි; කොවිදො, දක්‍ෂවූ, සම්පත්තසද්ධම්මපදො, සම්පත්ත, මොනවට පැමිණි; සද්ධම්මපදො, (ලොවුතුරා)සදහම්පිහිටඇති;(නොහොත් නොහොත්) අධිගතවූ දෙශනාඥානයහා සර්වඥතාඥානඇති; සත්ථා, ශාස්තෲන්වහන්සේ; කරුණාවෙග සමුස්සාහිත මානසො, කරුණාවෙග, කරුණාවෙගයෙන්; සමුස්සාහිත, (දෙශනාඥානයෙහි) උත්සාහවත් කරණලද; මානසො, සිත්ඇතිසේක්; තං තං කාරණං, ඒඒකරුණට; ආගම්ම, පැමිණ (ඒ ඒ වස්තුනිසා); දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට, වෙ, ඒකාන්තයෙන්; පීතිපාමොජ්ජවඩ්ඪනං, ප්‍රීතිප්‍රමොද්‍යය වඩන්නාවූ; සුභං, (පදව්‍යඤ්ජන ගම්භීරාර්ථාදියෙන්) හොබනාවූ; යං ධම්මපදං, යම් දම්පියාවක්; දෙසෙසි, දෙසූ සේක්ද.

---

ධාරෙතී'ති ධම්මො, ධරධාරණෙ. සන්තො ච සො ධම්මො,සතං වා ධම්මො,සද්ධම්මො;පකාරෙන ජොතති දිප්පතී'ති පජ්ජොතො, පදුබ්බ ජුතදිත්තියං. සද්ධම්මොයෙව පජ්ජොතො; සද්ධම්ම පජ්ජොතො. ජලි සිඛා'ති ජලිතා; ජලදිත්තියං. ඉජ්ඣනං ඉද්ධි,ඉධසංසිද්ධිවුද්ධිසු, ජලිතා ඉද්ධි යස්සසොයං ජලිතිද්ධි; තෙන.

f ධම්මොච අධම්මොච ධම්මාධම්මා, තෙසු. g පජ්ජන්ති ඵලමෙතෙනා'ති පදං; අරියෙහි උපගන්තබ්බත්තා පටිපජ්ජිතබ්බ'න්ති වා පදං,පදගති යං.සද්ධම්මොඑව පදං,සද්ධම්මපදං,සම්පත්තං සද්ධම්මපදං යෙන සොයං සම්පත්තසද්ධම්මපදො.h ධම්මො ච සො පදං චා'ති ධම්මපදං; තං.i කිර ති පරදුක්ඛං විකිඛිපතී'ති කරුණා; කිරවික්ඛෙපනෙ. කිණාතී කාරුණී කංහිංසතීති කරුණා,කීහිංසායං,කරුණායආවෙගො,කරුණාවෙගො, තෙන සමුස්සාහිතං මානසං යස්ස සොයං; කරුණා:පෙ: මානසො. n දිබ්බන්තී'ති දෙවා, දිවුකීළායං. මනස්ස උස්සන්නත්තා මනුස්සා, දෙවා

5 a පරම්පරාභතා තස්ස නිපුණා b අත්‍ථවණ්ණනා,
යා c තම්බපණ්ණිදීපම්හි d දීපභාසාය සණ්ඨිතා.

5 තස්ස, ඒ ධම්මපදයාගේ; පරම්පරාභතා, ආචාර්‍ය්‍ය පරම්පරාවෙන් ගෙණඑනලද්දාවූ; නිපුණා, සියුම්වූ; යා අත්‍ථවණ්ණනා, යම් අරුත්විවරණයක් (අටුවාවක්); තම්බපණ්ණිදීපම්හි, හෙලදිව්හි; දීපභාසාය, හෙලුබසින්; සණ්ඨිතා, සිටීද; (තුබූද).

6 න සාධයති සෙසානං සත්තානං f හිතසම්පදං,
අප්පෙවනාම සාධෙය්‍ය n සබ්බලොකස්ස සා හිතං.

6 සා, ඒධම්මපදාර්‍ථ කථාතොමෝ; සෙසානං සත්තානං, (දීපාන්තර වාසී) ශෙෂජනයන්ගේ; හිතසම්පදං, හිතසම්පත්තිය; න සාධයති, සිදුනොකරයි; සබ්බලොකස්ස, සියලුලොකයාගේ; හිතං, හිතසම්පත්; සාධෙය්‍ය, සිදුකරන්නීනම්; අප්පෙවනාම, ඉතායෙහෙක.

7 ඉති ආසිංසමානෙන දන්තෙන m සමචාරිනා,
කුමාරකස්සපෙනා'හං ථෙරෙන p පිරවෙතසා.

8 g සද්ධම්මට්ඨිති කාමෙන සක්කච්චං අභියාචිතො,
තං භාසං o අතිවිත්‍ථාරගතං ච k වචනක්කමං.

7–8 ඉති, මෙසේ, ආසිංසමානෙන, ආශිංසනයකරන්නාවූ; දන්තෙන, දාන්තවූ; (දමනයකල චක්ඛුරාදී ෂඩින්ද්‍රියයන්ඇත්තාවූ); සමචාරිනා, සමචර්‍ය්‍යා කරන්නාවූ (සල්ලෙඛප්‍රතිපදාවෙහි හැසිරෙන්නාවූ); පිරවෙතසා, ස්ථිරබුද්ධි ඇත්තාවූ; සද්ධම්මට්ඨිතිකාමෙන, ආගම සද්ධර්‍මයාගේ චිරස්ථිතිය කැමැත්තාවූ; කුමාරකස්සපෙන ථෙරෙන, කුමාරකාශ්‍යප ස්ථවිරයන් විසින්; සක්කච්චං, සකසා; අභියාචිතො, (ධම්මපදයට මාගධී අර්‍ථවර්‍ණනාවක් කලමැනවයි) යාච්ඤාකරණලද්දාවූ; අහං, (බුද්ධඝොෂාභිධෙය) මම; තං භාසං ච, ඒ හෙලුබසද; අතිවිත්‍ථාරගතං, අතිශය විස්තරත්වයට පැමිණියාවූ; වචනක්කමං ච, වාක්මාර්ගයද (නෙපුල්මග)ද.

ච මනුස්සා ච දෙවමනුස්සා. තෙසං;m පීනයතී'ති පීති, පීණෙතීති වා; පීනසම්පීණනෙ, පීතපපණෙවා. පකාරෙන මොදයිත්‍ථා'ති, පමුදිතො, පමුදිතස්ස භාවො පාමොජ්ජං; පීති ච පාමොජ්ජං ච පීතිපාමොජ්ජං; තං වඩ්ඪති එතෙනාති පීති;පෙ;වඩ්ඪනං.–a පරම්පරාය ආභතා පරම්පරාභතා.b අත්‍ථො වණ්ණීයති එතායා'ති අත්‍ථවණ්ණනා;c තම්බො පාණිඑත්‍ථා'ති තම්බපාණී;සො ච සො දීපොචා'ති තම්බපණ්ණිදීපො; තස්මිං.පකාරස්ස ආකාරහ්‍රස්වකොට ණකාරයක්හෙලා'තම්බපණ්ණී'යයි යුහු. d දීපෙ ජාතා(දීපානංවා)භාසා දීපභාසා;තාය.f හිතංච තංසම්පදං චා'ති

9 පහාසා'රොපයිත්වාන n තන්තිභාසං මනොරමං,
ගාථානං s ව්‍යඤ්ජනපදං යං තත්‍ථ න විභාවිතං.

9 පහාය, අත්හැර; මනොරමං, අශෙෂජනමනොනන්දකර (සිත්කලු)වූ; තන්තිභාසං, මාගධීභාෂාවට; ආරොපයිත්වාන, සමාරොපනය කොට; (නගා); තත්‍ථ, ඒ හෙළුඅරුත්වියකත්හි; ගාථානං, ගාථාවන් සම්බන්ධවූ. යං ව්‍යඤ්ජනපදං, යම් විසජ්ජනාපදයක්; ද්‍යෙහෝනොහොත් (අක්ෂරපදව්‍යඤ්ජන ආකාරනිරුක්ති නිර්දේශ යන) ව්‍යඤ්ජන ෂට්කයෙහා (සංකාසන පකාසන විවරණ විභජන උත්තානීකරණ පඤ්ඤත්ති යන) පදෂට්කයක්; න විභාවිතං, (අත්‍ථොද්ධාරාදි වශයෙන්) ප්‍රකාශ නොකරණලද්දේද.

10 කෙවලං තං විභාවෙත්වා සෙසං තමෙව අත්‍ථතො
භාසන්තරෙන භාසිස්සං ආවහන්තො විභාවිනං;
මනසො පීති පාමොජ්ජං H අත්‍ථධම්මූපනිස්සිත'න්ති.

10 තං කෙවලං, ඒ සියල්ල; ද්‍යෙහෝනොහොත්-ඒපමණක්; විභාවෙත්වා, වෙසෙසින් වර්ණනාකොට; සෙසං, සෙස්ස; අත්‍ථතො, (ශබ්ද වශයෙන් නොව) අර්ථවශයෙන්; තං එව, එයමකොට (ඒඅර්ථවර්ණනාතුබූසේම); විභාවිනං, පණ්ඩිතයන්ගේ; මනසො, චිත්තසම්බන්ධව; අත්‍ථධම්මූපනිස්සිතං, අර්ථධර්මයන්නිසා පැවති; පීතිපාමොජ්ජං, ප්‍රීතිප්‍රමොද්‍යය; ආවහන්තො, එලවමින්; භාසන්තරෙන, අන්‍යභාෂාවකින් (මගදබසින්); භාසිස්සං, කියන්නෙමි.

---

හිතසම්පදං,තං.n සඞ්ඛාච සො ලොකො චා'ති සබ්බ ලොකො;තස්ස. m සමං සමෙ වා චරති සීලෙනා'ති සමචාරී; තෙන.p චිරං චෙතොය ස්සා'ති, චිරචෙතො,තෙන.g සද්ධම්මස්ස ඨිති සද්ධම්මට්ඨිති;තං කාමෙතී ති සද්ධම්මට්ඨිති කාමො;තෙන.ı අතිවිත්‍ථාරං ගතො, අති–පෙ–ගතො; තං. k වචනානං කමො වචනක්කමො; තං.

n තන්තියා ඨිතා භාසා;තන්තිභාසා; තං. s ව්‍යඤ්ජනමෙව පදං, ව්‍යඤ්ජනපදං; ව්‍යඤ්ජනංච පදංචා'ති. H අත්‍ථො ච ධම්මො ච අත්‍ථධම්මා; තෙ උපනිස්සයතීතෙනිලපනිස්සිත'න්ති වා අත්‍ථධම්මූපනිස්සිතං, තං.

11 A ජරාජජ්ජරිතා හොන්ති B හත්ථපාදා C අනස්සවා,
යස්ස සො d විහතත්ථාමො කථං ධම්මං චරිස්සති.

11 යස්ස, යම් කිසිවෙකුගේ; හත්ථපාදා, අත්පා; ජරාජජ්ජරිතා හොන්ති, ජරාවෙන් දුදුරුවෙද්ද; අනස්සවා, (එහෙයින්ම) අවසඟ වෙත්ද; (හෙවත්) තමන්වසයෙහි නොපවතිත්ද; විහතත්ථාමො, විනෂ්ටශක්තිඇත්තාවූ; සො, හෙතෙම, කථං, කෙසේ; ධම්මං චරිස්සති, ධර්මයෙහි හැසිරෙන්නේද.

12 චක්ඛූනි හායන්ති මමායිතානි
සොතානි හායන්ති තථෙව දෙහො,
සබ්බම්පිදං හායති E දෙහ නිස්සිතං
කිං කාරණා පාලිත ත්වං පමජ්ජසි.

12 මමායිතානි, මමය මාගේයයි සක්කායවශයෙන් ගන්නාලද්දාවූ; චක්ඛූනි, ඇස්; හායන්ති, (තුමූම) පිරිහෙත්; සොතානි, ශ්‍රොත්‍රයෝද; හායන්ති, (තුමූම) පිරිහෙත්; දෙහො, ශරීරයද; තථාඑව, එසේම පිරිහෙයි; දෙහනිස්සිතං, සිරුරුඇසුරුකළාවූ; ඉදං සබ්බං අපි, මේ සියල්ලද; හායති, පිරිහෙයි; පාලිත, පාලිතය; ත්වං, තෝ; කිං කාරණා, කවරහෙයකින්; පමජ්ජසි, පමාවෙහිද?.

13 චක්ඛූනි ජීරන්ති මමායිතානි
සොතානි ජීරන්ති තථෙව කායො,
සබ්බම්පි'දං ජීරති E කායනිස්සිතං
කිං කාරණා පාලිත ත්වං පමජ්ජසි.

13 මමායිතානි, මමත්වය කරණ ලද්දාවූ; චක්ඛූනි, ඇස්; ජීරන්ති, දිරත්; සොතානි, කන්ද; ජීරන්ති, දිරත්; කායො, කයද; තථෙව, එසේම දිරයි; කායනිස්සිතං, (පියමව්දෙදෙනාගේ ශුක්‍රශොණිත දෙකින් නිපන්) කය ඇසුරුකළාවූ; ඉදං සබ්බං අපි, මේ සියල්ලද; ජීරති, දිරයි; පාලිත, පාලිතය; ත්වං, තෝ; කිං කාරණා, කවරහෙයකින්; පමජ්ජසි, පමාවෙහිද?

14 චක්ඛූනි භිජ්ජන්ති මමායිතානි
සොතානි භිජ්ජන්ති තථෙව රූපං,
සබ්බම්පි'දං භිජ්ජති g රූපනිස්සිතං
කිං කාරණා පාලිත ත්වං පමජ්ජසි.

---

a ජරාය ජජ්ජරිතා, ජරාජජ්ජරිතා. d හත්ථා ච පාදා ච, හත්ථපාදා. c නඅස්සවා, අනස්සවා. p විහතො ථාමො එතස්සා'ති; විහතත්ථාමො. e දෙහං නිස්සිතං, දෙහනිස්සිතං; f කායං නිස්සිතං, කායනිස්සිතං. g රූපං නිස්සිතං, රූපනිස්සිතං.

14 මමායිතානි, මමය මාගේය කියාගන්නාලද්දවූ; චක්ඛූනි,චක්ෂුස් සඞ්ඛ්‍යාතප්‍රසාදරූපයෝ: භිජ්ජන්ති, (නිරවශෙෂයෙන්ම තුමූම) බිඳෙත්; සොතානි, ශොත්‍රසඞ්ඛ්‍යාත ප්‍රසාදරූපයෝ; භිජ්ජන්ති, (තුමූම) බිඳෙත්; රූපං, රූපයද ; තථෙව, එසේම තෙමෙම බිඳෙයි; රූපනිස්සිතං, (අෂ්ටවිංශති ප්‍රභෙදවත්) රූපස්කන්ධය ඇසුරුකරණලද්දවූ; ඉදං සබ්බංඅපි, මේ සියල්ලද; භිජ්ජති, (නිශෙෂයෙන්ම) බිඳේ; පාලිත, පාලිතය; ත්වං, තෝ; කිං කාරණා, කවරහෙයකින්; පමජ්ජසි, පමාවන්නෙහිද? (එහෙයින් "තෝ පමානොවී ශික්ෂාත්‍රයෙහි හික්මෙව" යනු මේ තුන්ගයින් ගම්‍යමානයි).

15 පටික්ඛිත්තො තිකිච්ඡාය වෙජ්ජෙනා'සි විවජ්ජිතො,
නියතො මච්චුරාජස්ස කිං පාලිත පමජ්ජසි.

15 තිකිච්ඡාය, පිළියමින්; පටික්ඛිත්තො (අසි), බැහැරපියනලද් දෙහිය; වෙජ්ජෙන, වෙද විසින්; විවජ්ජිතො අසි, පියනලදුයෙහිය; (නොරකරණලද්දෙහිය); මච්චුරාජස්ස, මෘත්‍යුරාජයාහට; නියතො, නියතවෙහිය; පාලිත, පාලිතය; කිං පමජ්ජසි,(තෝ) කිම පමාවෙහිද?

16 හන්ද'හං [a] හතචක්ඛු'ස්මි [d] කන්තාරද්ධානමාගතො,
සෙමානකො න ගච්ඡාමි නත්ථි බාලෙ සහායතා.

16 හන්ද, එකාන්තයෙන්; අහං, මම; හතචක්ඛු, විනෂ්ටවූ ඇස් ඇත්තෙක්වූයෙම්; කන්තාරද්ධානං, කතරඅදන්මගට; ආගතො අස්මි, ආයේවෙමි; සෙමානකො, (මෙහිම)හෝනේවෙමි; න ගච්ඡාමි, නොයමි; බාලෙ; බාලයා කෙරෙහි(නොහොත්)බාලයාසමග; සහායතා, (තමාසමග යන යහලුබවවූ) සහායබවක්; නත්ථි, නැත්තේය.

17 හන්දා'හං හතචක්ඛු'ස්මි කන්තාරද්ධානමාගතො,
මරිස්සාමි නො ගමිස්සාමි නත්ථි බාලෙ සහායතා.

හන්ද, එකාන්තයෙන්; අහං, මම; හතචක්ඛු, විනටුඇස්ඇත්තෙක්වූයෙම්; කන්තාරද්ධානං, කතරඅදන්මගට; ආගතො අස්මි, ආයේවෙමි; මරිස්සාමි, මැරෙන්නෙම්; නො ගමිස්සාමි, (මුඹහා) නොයන්නෙම්; බාලෙ, බාලයාකෙරෙහි; සහායතා, (තමන්)සහායබවක්; නත්ථි,නැත්තේය.

---

[a] හතානි චක්ඛූනි යස්ස සොයං, හතචක්ඛු. [d] කන්තාරසඞ්ඛාතං අද්ධානං; කන්තාරද්ධානං. කන්තාරං ච තං අද්ධානං චා'ති වා.

18 c සහස්සනෙත්තො d දෙවිනෙදා දිබ්බං චක්ඛුං විසොධයී,
e පාපගරහී අයං පාලො ආජීවං පරිසොධයී.

18 සහස්සනෙත්තො, දහසක් පැණෑස්ඇත්තාවූ; දෙවිනෙදා, දෙවෙන්‍ද්‍රතෙම; දිබ්බං චක්ඛුං විසොධයී, දිවැස දැල්විය, නොහොත්-දිවැසින් බැලීය; අයං පාලො, මේ චක්ෂුඃපාලතෙම; පාපගරහී, පව්ටන් (පව්) ගරහන සුලුවූයේ; ආජීවං, ජීවිකාවෘත්තිය; පරිසොධයී, පිරිසිදුකෙළේය.

19 සහස්සනෙත්තො දෙවිනෙදා දිබ්බං චක්ඛුං විසොධයී,
f ධම්මගරුකො අයං පාලො නිසින්නො සාසනෙ රතො.

19 සහස්සනෙත්තො, දහසක් පැණෑස්ඇත්තාවූ; දෙවිනෙදා, සක්දෙව්රජතෙම; දිබ්බං චක්ඛුං විසොධයී, දිවැස පිරිසිදුකෙළේය; (නොහොත්)දිවැසින් බැලීය; අයං පාලො, මේ චක්ෂුඃපාලතෙම; ධම්මගරුකො, ප්‍රතිපත්තිධර්ම ගරුකොට ඇත්තේ; සාසනෙ රතො, පිළිවෙත් සසුන්හි ඇලුනෙත්ව; නිසින්නො (ඉති), උන්සේකැයි.

20 සහස්සනෙත්තො දෙවිනෙදා g දෙවරජ්ජ සිරිධරො,
ඛණෙනෙව උපාගන්ත්වා චක්ඛුපාල මුපාගමී.

20 දෙවරජ්ජසිරිධරො, දිව්‍යරාජ්‍යශ්‍රී දරන්නාවූ; සහස්සනෙත්තො, දහසක්නෙත් ඇත්තාවූ; දෙවිනෙදා, දෙවෙන්‍ද්‍රතෙම; උපාගන්ත්වා, පිටත්ව; ඛණෙනෙව; සැණෙකින්ම; චක්ඛුපාලං, චක්ඛුපාලතෙරුන්වහන්සේ කරා; උපාගමි, එළඹියේය.

21 සහස්සනෙත්තො දෙවිනෙදා දෙවරජ්ජ සිරිධරො,
සඞ්ඛිපිත්වාන තං මග්ගං ඛිප්පං සාවත්ථි මාගමී.

21 සහස්සනෙත්තො, දහසක් නෙත්ඇත්තාවූ; දෙවරජ්ජ සිරිධරො, දිව්‍යරාජ්‍යශ්‍රී දරන්නාවූ; දෙවිනෙදා, දෙවෙන්‍ද්‍රතෙම; තං මග්ගං, ඒ (කාන්තාරඅදත්)මග; සඞ්ඛිපිත්වාන, (සඞ්ක්ෂෙපකොට)හකුළුවා, ඛිප්පං, වහා, සාවත්ථිං, සැවැත්නුවරට; ආගමි, ආයේය.

---

c සහස්සං නෙත්තානි (පඤ්චඤ්චක්ඛූනි) යස්ස සොයං; සහස්සනෙත්තො. d දෙවානං මඤ්චෙසු වා ඉන්දො, දෙවිනෙදා. e පාපමෙතෙසං අත්‍ථීති පාපා, පාපෙ (පාපං) ගරහණ සීලෙනා'ති, පාපගරහී. f ධම්මොයෙව ගරුඑතස්සා'ති; ධම්මගරුකො. g රඤ්ඤො භාවො (කම්මං වා)රජ්ජං, දෙවානං දෙවෙසු වා රජ්ජං දෙවරජ්ජං; තස්මිං සිරි දෙවරජ්ජසිරි, තං ධාරෙතී'ති දෙවරජ්ජසිරිධරො.

22 න හි ධම්මො අධම්මො ච උභො a සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතිං.

22 ධම්මො, පණිවායෙන් වෙන්වීම්ආදී කුශලධර්මයද; අධම්මො ච, කෘෂ්ණධර්මසඞ්ඛ්‍යාත අධර්මයද; උභො, යනමේ දෙක; න හි සමවිපාකිනො, සමානවිපාක ඇත්තෝ නොවෙත්මය; "හි හෙතාවවධාරණෙ" යි යුහෙයින් 'හි' යනු අවධාරණයෙහි වැටේ; අධම්මො, අධර්මයතෙම; නිරයං, නරකයට; නෙති, (අධර්මයහු) පමුණුවයි; ධම්මො, ධර්මයතෙම, සුග්ගතිං, සුගතියට; පාපෙති, (ධර්මයහු) පමුණුවයි.

චක්ඛුපාලත්ථෙර වත්ථු.

---

23 අලඞ්කතො d මට්ඨකුණ්ඩලී මාලභාරී b හරිචන්දනුස්සදො,
බාහා පග්ගය්හ කන්දසි වනමජ්ඣෙ කිං e දුක්ඛිතො තුවං.

23 අලඞ්කතො, අලඞ්කාරයෙන් විභූෂිතවූ (නන්අබරණින් සැදියාවූ); මට්ඨකුණ්ඩලී, මටකොඬොල්ඇත්තාවූ; (කරණපරිනිෂ්ඨිතකුණ්ඩලයන් පැළැන්දවූ); මාලභාරී, (පලඳිනලද) මල්බරඇත්තාවූ; (කුසුම මාලාධාරීවූ); හරිචන්දනුස්සදො, ඇඟගැල්වූ හරිසඳුන් ඇත්තාවූ; (රන්වන්සඳුන් ගැල්වූවාවූ); තුවං, තෝ; වනමජ්ඣෙ, මේ මහවනමැද; (සොහොන්මැද); බාහා පග්ගය්හ, දෙඅත්බැඳගෙණ; කන්දසි, හඬන්නෙහිය; කිං දුක්ඛිතො, (එසේ) කුමට දුඃඛිතයෙහිද (දුකට පත්වූ යෙහිද)?

24 f සොවණ්ණමයො පභස්සරො උප්පන්නො h රථපඤ්ජරො මම,
තස්ස i චක්කයුගං න වින්දාමි තෙන දුක්ඛෙන ජහිස්සං ජීවිතං.

24 සොවණ්ණමයො, සුවර්ණමයවූ; (රන්මුවාවූ); පභස්සරො, ප්‍රභාස්වර වූ(පබවිහිදුවන්නාවූ); රථපඤ්ජරො, රථපඤ්ජරයක්; මම, මට; උප්පන්නො, උපන්නේය; තස්ස, ඒ රියපඳුරට; චක්කයුගං, චක්‍රයුගමයක්; න වින්දාමි, නොලබමි; තෙන දුක්ඛෙන (දුක්ඛිතො), ඒ දුකින්දුප්පත්වූ මම; ජීවිතං, ජීවිතය; ජහිස්සං, හරින්නෙමි.

---

a සමො (සදිසො) විපාකො, සමවිපාකො; සමවිපාකො එතෙසමත්ථී'ති, සමවිපාකිනො. d මට්ඨානි කුණ්ඩලානි මට්ඨකුණ්ඩලානි; තානි එතස්ස අත්ථී'ති, මට්ඨකුණ්ඩලී. p හරී ච තානි චන්දනානි චෙ'ති, හරිචන්දනානි; උස්සදානි හරිචන්දනානි යස්ස සොයං, හරිචන්දනුස්සදො. "උස්සද හරිචන්දනො" යි කියයුතුයෙහි "උස්සද" ශබ්ද පරනිපාතකොට "හරිචන්දනුස්සදො" යියූ. e දුක්ඛස්ස දුක්ඛං වා ඉතො දුක්ඛිතො. f සුවණ්ණෙන පකතො, සොවණ්ණමයො. h රථස්ස පඤ්ජරො, රථපඤ්ජරො. i චක්කානං යුගං චක්කයුගං.

සොවණ්ණමයං මණිමයං ලොහමයං අථ රූපියාමයං,
* ආචික්ඛ මෙ භද්දමානව චක්කයුගං පටිලාභයාමි තෙ.

25 භද්දමානව, සොඳුර මානවකය; මෙ, මට; ආචික්ඛ, කියව; සොවණ්ණමයං, රන්මුවාවූහෝ; මණිමයං, මිණිමුවාවූහෝ; ලොහමයං, ලෝමුවාවූහෝ; අථ, ඒ අැර; රූපියමයං, රජතමයවූහෝ; චක්කයුගං, සක්පුවලත්; තෙ, තට; පටිලාභයාමි, පිළිලබවමි.

26 සො මානවො තස්ස පාවදි චන්දසුරියා උභයෙත්ථ භාතරො,
සොවණ්ණමයො රථො මම තෙන චක්කයුගෙන සොභති.

26 සො මානවො, ඒ මානවක (දිව්‍යපුත්‍ර) තෙම; තස්ස, ඒ බමුණාට; පාවදී,(මෙසේ)කීය; එත්ථ, මෙහි; උභො චන්දසුරියා, සඳහිරු දෙදෙන; භාතරො, බබලන්නාහුය; අහෝනොහොත්–භාතරො.බබලන්නාවූ; උභො චන්දසුරියා, සඳහිරු දෙදෙන; එත්ථ, මේමාගේරියෙහි වෙත්නම්; මම, මාගේ; සොවණ්ණමයො, රන්මුවාවූ; රථො, රථය තෙම; තෙන චක්කයුගෙන, ඒ චක්‍රයුගමය කරණකොටගෙණ; සොභති, හොබියි.

27 බාලො ඛො ත්වංසි මානව යො ත්වං පත්ථයසෙ අපත්ථියං,
මඤ්ඤාමි තුවං මරිස්සසි න හි ත්වං ලච්ඡසි [a] චන්දසුරියෙ.

27 මානව, මානවකය; යො ත්වං, යම්බඳුවූ තෝ; අපත්ථියං, නොපැතිය යුත්තක්; පත්ථයසෙ, පතාහිද; ත්වං, ඒතෝ; බාලො ඛො අසි, බාලයෙක්මවෙහිය; හි(යස්මා), යම්හෙයකින්; තුවං, තෝ; චන්දසුරියෙ, සඳහිරු; න ලච්ඡසි, නොලබන්නෙහිද: (තස්මා, එහෙයින්); ත්වං මරිස්සසි(ඉති), තෝමැරෙන්නෙහියයි; මඤ්ඤාමි, හඟිමි·

28 [b] ගමනාගමනම්පි දිස්සති [c] වණ්ණධාතු උභයෙත්ථ වීථියො,
පෙතො පන [d] කාලකතො න දිස්සති කො'තිධ කන්දතං
[බාල්‍යතරො.

28 ගමනාගමනම්පි, (රිවිසඳු දෙදෙනාගේ) ගමන්හා ආගමන්; දිස්සති, පැණේ: වණ්ණධාතු, පැහැසටහන්ද (පැණේ); එත්ථ, මේ අහස්හි; උභො වීථියොපි, (මේ චන්ද්‍රයාගේ වීථිය මේ සූර්‍ය්‍යයාගේ වීථි

a චන්දො ච සුරියො ච, චන්දසුරියා; තෙ. ඌකාර දීඝය ඡන්දොරක්ෂණය පිණිසයි. b ගමනං ච ආගමනඤ්ච ගමනාගමනං. c වණ්ණ එව ධාතු වණ්ණධාතු. d කාලං (මරණං) කතො, කාලකතො.

* "පාවද රථං කාරයාමි තෙ චක්කයුගං පටිලාභයාමි තං" ඉති ජාතකපාලි.

යසි) උභය විපිහුද පැණෙන්; කාලකතො, කළුරියකළාවූ; පෙතො පන, පරලොවගියේ වනාහි; න දිස්සති, නොපෙණේ; ඉධ, මෙහි; කන්දතං, වලප්නා අපදෙදෙනා අතුරෙන්; කො නු, කවරෙක් නම්; බාල්‍යතරො, අතිශයින් බාලබැව් ඇත්තේද?

29 සච්චං ඛො වදෙසි මානව අහමෙව කන්දතං බාල්‍යතරො,
චන්දං විය දරකො රුදං පෙතං කාලකතා'භිපත්ථයං.

29 මානව, මානවකය; සච්චං ඛො, සත්‍යයක්ම; වදෙසි, (තෝ) කියෙහිය; කන්දතං, හඩන්නාවූ අප අතුරෙන්; අහං එව, මමම; බාල්‍යතරො, අතිශයින් බාලබැව් ඇත්තෙක් වෙමි; චන්දං, චන්ද්‍රයා නිසා(හෝ ඉල්වා); රුදං, වැලපෙන්නාවූ; දරකො විය, ගම්දරුවෙක්මෙන්; පෙතං, පරලොව ගියාවූ; කාලකතං, මළහු; අභිපත්ථයං,(මම)පතන්නේ වෙමි.

30 ආදිත්තං වත මං සන්තං e ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

30 ඝතසිත්තං, ගිතෙලින් ඉසින ලද්දාවූ; පාවකං ඉව, වහ්නියක්මෙන්; ආදිත්තං සන්තං,(පුත්‍රශොකාගනියෙන්) ඇවිලගන්තෙතාවූම; මං, මා; වාරිනා,ජලයෙන්;(දියවැනි ඔවාබසින්);ඔසිඤ්චං විය,තෙමන්නාක්හුමෙන්; සබ්බං දරං, (මාගේ)සියලු කායචිත්තසන්තාපය; වත,එකාන්තයෙන්; නිබ්බාපයෙ, (තෝ) නිවීහි.

31 අබ්බහී වත මෙ සල්ලං සොකං F හදයනිස්සිතං,
යො මෙ g සොකපරෙතස්ස h පුත්තසොකං අපානුදී.

31 යො, යමෙක්තෙම; සොකපරෙතස්ස, ශොකයෙන් වලදනා (පෙළෙන) ලද්දාවූ; මෙ, මාගේ; පුත්තසොකං, පුත්‍රවියොගජශොකය; අපානුදී, දුරුකෙළේද, (හෙතෙම); මෙ, මාගේ; හදයනිස්සිතං, හෘදයනිශ්‍රිතවූ, (හෙවත් ලෙහි ගැළිසිටියාවූ); සොකං සල්ලං, ශොකශල්‍යය; වත, එකාන්තයෙන්; අබ්බහී, උපුටපී; (උදුලේය).

32 ස්වාහං a අබ්බූළ්හසල්ලො'ස්මි d සීතිභූතො'ස්මි නිබ්බුතො,
න සොචාමි න රොදමි තව සුත්වාන මානව.

32 මානව, මානවකය; සො අහං, ඒ මම; තව, තාගේ (ඔවාබස්);

---

e ඝතෙන සිත්තො, ඝතසිත්තො, තං. f හදයං නිස්සිතො, හදයනිස්සිතො; තං. g සොකෙන පරෙතො (අභිභූතො), සොකපරෙතො, තස්ස. h පුත්තවියොගජො සොකො පුත්තසොකො, තං. මධ්‍යපදලුප්තසමාසයි. a අබ්බූළ්හං (උඩටං) සල්ලං යස්ස සොයං, අබ්බූළ්හසල්ලො. d අසීතො සීතො අහවී'ති, සීතීභූතො. චුත්විළොම් නො වනුවස් ඊපසළුහුනොළෙ.

සුත්වාන, අසා; අබ්බුළ්හසල්ලො අස්මි, උපුටපියනලද (මාළෙහිගැළු සිටි) හුල් ඇත්තේවෙමි; සීතීභූතො අස්මි, (ඒතශොකාග්නි ඇතිහෙයින්) සිහිල්වූයේ වෙමි; නිබ්බුතො, (එහෙයින්ම)නිවියේවෙමි; නසොචාමි,ශොක නොකරමි; න රොදාමි, නොහඬමි.

33 දෙවතා නුසි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.

33 දෙවතා අසි නු,(තෝ) දෙවියෙක්හෝ වෙහිද ? ගන්ධබ්බො, ගඳෙඹක් හෝ වෙහිද ? ආදු, නොහොත්; පුරින්දදො, පෙර දන්දුන්හෙයින් පුරින්දදනම්වූ; සක්කො, ශක්‍රයා හෝ වෙහිද ? ත්වං, තෝ; කො වා, (දෙවිමිනිසුන් අතුරෙන්) කවරෙක්හෝ වෙහිද? කස්ස, කවරෙකුගේ; පුත්තො වා, පුතෙක්හෝ වෙහිද ?; මයං, අපි; තං, තා; කථං ජානෙමු, කෙසේ දනිමුද ? (කොයිපරිද්දකින් හඳුනමුද).

34 යච කන්දසි යච රොදසි පුත්තං ආළාහනෙ සයං දහිත්වා,
සොහං කුසලං කම්මං කරිත්වා තිදසානං සහව්‍යතං පත්තො.

34 සයං, තෙමේ, පුත්තං, පුතකු; ආලාහණෙ, සොහොන්හි; දහිත්වා; දවා; යච, යම්පුතෙකු (සඳහා); කන්දසි, හඬයිද; ? යංව, යම්පුතෙකුනිසා; රොදසි, කඳුලු වැගිරවෙහිද ? (කඳුලුවැකුනු මුහුනු ඇතිවූයෙහිද ?); සො අහං, (තා පුත්වූ) ඒ මම; කුසලං කම්මං, කුසල් කම්; කරිත්වා, කොට; තිදසානං, දෙවියන්ගේ; සහව්‍යතං, සහභාවයට; පත්තො, පැමිණියේවෙමි.

35 අප්පං වා බහුං වා නාද්දසං දානං දදන්තස්ස සකෙ අගාරෙ,
c උපොසථකම්මං වා තාදිසං කෙන කම්මෙන ගතොසි d දෙ
[වලොකං.

35 සකෙ අගාරෙ, සියගෙදරෙහි; අප්පංවා, ස්වල්පවූහෝ; බහුං වා, බොහෝවූහෝ; දදන්තස්ස, දෙන්නාවූ (තාගේ); දානං, දනයක්; නාද්දසං, නුදුටුයෙමි; උපොසථකම්මං වා, උපොෂිත කර්මයක්හෝ; තාදිසං, එබඳු අතික් පුණ්‍යකර්මයක්හෝ; (නාද්දසං, නුදුටුයෙමි); කෙන කම්මෙන; කවර කුශලකර්මයක් කරණකොටගෙණ; දෙවලොකං, දෙව්ලොවට; ගතො අසි, ගියේවෙහිද ?

---

c උපොසථෙ කාතබ්බං කම්මං-උපොසථස්සවා උපොසථව තංවා උපොසථ කම්මං. d දෙවානං ලොකො දෙවලොකො-තං.

36 ආබාධිකො'හං දුක්ඛිතො ᵇ බාළ්හගිලානො
ආතුරරූපො'ම්හි සකෙ නිවෙසනෙ,
බුද්ධං ᶜ විගතරජං ᵈ විතිණ්ණකඞ්ඛං
අද්දක්ඛිං සුගතං ᵉ අනොමපඤ්ඤං.

36 අහං, මම; සකෙ නිවෙසනෙ, සියනිවෙස්හි; ආබාධිකො, හට ගත්රොග ඇත්තේ; දුක්ඛිතො, (කායික චෛතසික) දුකට පැමිණියේ; බාළ්හගිලානො අමහි,දැඩිගිලන්(බැව් ඇත්තේ) වෙමි;ආතුරරූපො, (එසේ) පීඩිතසවභාව ඇති (මම); බුද්ධං, චතුස්සත්‍යය අවබොධකළාවූ; විගතරජං; පහවගිය කෙලෙස්රජස් ඇත්තාවූ; විතිණ්ණකඞ්ඛං, විශෙෂයෙන් තරණයකළ විචිකිත්සා ඇත්තාවූ; අනොමපඤ්ඤං, අලාමකප්‍රඥ ඇත්තාවූ; (පිරිපුණ්පැණැත්තාවූ); සුගතං, සුගතයන් වහන්සේ; අද්දක්ඛිං, දුටුයෙමි.

37 සො'හං ᶠ මුදිතමනො ᵍ පසන්නචිත්තො අඤ්ජලිං අකරිං තථාගතස්ස,
තා'හං කුසලං කම්මං කරිත්වා තිදසානං සහව්‍යතං පත්තො.

37 සො අහං, ඒ මම; මුදිතමනො, ප්‍රමුදිත සිත් ඇතිව; පසන්නචිත්තො, පහන් සිත් ඇතිව; තථාගතස්ස, තථාගතයන්වහන්සේට; අඤ්ජලිං අකරිං, ඇඳිලිකෙළෙමි; අහං, මම; තං කුසලං කම්මං, ඒ කුශලකර්මය; කරිත්වා, කොට; තිදසානං, දෙවියන්ගේ; සහව්‍යතං, සහභාවයට; පත්තො, පැමිණියේ වෙමි.

38 අච්ඡරියං වත අබ්භුතං ʰ අඤ්ජලිකම්මස්ස අයමීදිසො විපාකො,
අහම්පි මුදිතමනො පසන්නචිත්තො අජ්ජෙව බුද්ධං සරණං
[වජාමි.

38 වත, විස්මයෙක; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යයෙක; අබ්භුතං, (නොවූවිරූ හෙයින්) අද්භූතය; අඤ්ජලිකම්මස්ස, අඤ්ජලිකර්මයාගේ; ඊදිසො, මෙබඳුවූ; අයං විපාකො, මේ විපාකයි; අහම්පි, මමද; මුදිතමනො, තුටුසිත් ඇතිව; පසන්නචිත්තො, පහන්සිත් ඇතිව; අජ්ජෙව, අදම; බුද්ධං, බුදුන්; සරණං වජාමි, සරණකොට යෙමි.

---

ᵇ බාළ්හං ච සො ගිලානො චාති බාළ්හගිලානො–ආතුරස්ස රූපං යස්ස සොයං ආතුරරූපො.

ᶜ විගතො රජො යස්ස සොයං, යස්මා වා, විගතරජො; තං. ᵈ විතිණ්ණා කඞ්ඛා යෙන සො විතිණ්ණකඞ්ඛො, තං.

ᵉ අනොමා(පරිපුණ්ණා)පඤ්ඤා යස්ස සොයං අනොමපඤ්ඤො, තං.

ᶠ මුදිතං මනං යස්ස සොයං මුදිත මනො ᵍ පසන්නං චිත්තං යස්ස සොයං පසන්නචිත්තො. ʰ අඤ්ජලියා කම්මං අඤ්ජලිකම්මං–තස්ස.

39 අජ්ජෙව බුද්ධං සරණං වජාහි ධම්මඤ්ච සඞ්ඝං ච පසන්නචිත්තො,
තථෙ'ව * සික්ඛාය පදානි i පඤ්ච අඛණ්ඩ'ඵුල්ලානි සමාදියස්සු.

39 පසන්නචිත්තො, පහන්සිත් ඇත්තෙක්ව; අජ්ජෙව, දැන්ම; බුද්ධං, බුදුරැවන්; සරණං, සරණකොට; වජාහි, යව; ධම්මංච, (පර්යාප්තිසහිත නවලොවුතුරා) දමුරුවන්ද; සඞ්ඝං ච, සඟුරුවන්ද; (සරණයව;) තථා එව, එසේම; සික්ඛාය පදානි පඤ්ච, ශික්ෂාපද පසද; අඛණ්ඩ'ඵුල්ලානි, නොකඩකොට; අච්ඡිද්‍ර අශබල අකල්මාසකොට; සමාදියස්ස, සමාදානය කරව; (සමාදන්වී රකුව).

40 a පාණාතිපාතා විරමස්සු ඛිප්පං ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු
b අමජ්ජපො මා ච මුසා භණාහි සකෙන දාරෙන ච හොහි තුට්ඨො.

40 ඛිප්පං, වහා; පාණාතිපාතා, පණිවායෙන්; විරමස්සු, වෙන්වෙව; ලොකෙ, ලොකයෙහි; අදින්නං, හිමියන් විසින් නුදුන්දෙය; පරිවජ්ජයස්සු, (නොගෙණ) දුරුකරව; අමජ්ජපො හොහි, රහමෙර නොබොන්නෙක්වෙව; මුසාච, බොරුද; මා භණාහි, නොකියව; සකෙන දාරෙන ච, සියඅඹුසමගම; තුට්ඨො හොහි, සතුටුවෙව(අන්අඹු සෙවුම්නොකරව).

41 c අත්ථකාමොසි මෙ යක්ඛ d හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං ත්වංසි ආචරියො මම.

41 යක්ඛ, යක්ෂය (ඔබ); මෙ, මට; අත්ථකාමො අසි, අර්ථ (සැප) කැමැත්තේවෙහිය; දෙවතෙ, දෙවතාවෙහි (ඔබ); හිතකාමො අසි, (සුවටහෙතුවූ) වැඩකැමැත්තේවෙහිය; තුය්හං වචනං, ඔබ බස්; කරොමි, කරමි; ත්වං, ඔබ; මම, මට; ආචරියො අසි, ආචාර්‍ය්‍යවෙහිය.

42 උපෙමි බුද්ධං සරණං ධම්මඤ්චා'පි අනුත්තරං,
සඞ්ඝඤ්ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං.

42 අහං, මම; බුද්ධං, බුදුරැවන්; සරණං, සරණකොට; උපෙමි, යෙමි; අනුත්තරං, නිරුත්තර (තමහටවඩා උත්තමවූවක්නැත්තා)වූ; ධම්මං ච අපි, දමුරුවන්ද; නරදෙවස්ස, නරොත්තමයන් (සර්වඥය

---

i ඛණ්ඩානි ච ඵුල්ලානි ච ඛණ්ඩඵුල්ලානි–නත්ථි ඛණ්ඩඵුල්ලානියෙසං තානි අඛණ්ඩඵුල්ලානි–නඛණ්ඩානි අඛණ්ඩානි න ඵුල්ලානි අඵුල්ලානි, අඛණ්ඩානි ච අඵුල්ලානිච අඛණ්ඩඵුල්ලානි වා, වුත්තභෙදය විකාරො වා.

a පාණස්ස අතිපාතො පාණාතිපාතො–තම්හා. b න මජ්ජං පිබන්තී අමජ්ජපො. c අත්ථං (සුඛං) කාමෙන්තීති අත්ථකාමො. d හිතං (සුඛහෙතුං) කාමෙතීති හිතකාමො.

---

* "සික්ඛායපදානි" අලුප්ත සමාසයි.

න්) වහන්සේගේ; සඞ්ඝං ච, සඟුරුවන්ද; සරණං, සරණකොට; ගච්ඡාමි, යෙමි.

43 පාණාතිපාතා විරමාමි ඛිප්පං ලොකෙ අදින්නං පරිවජ්ජයාමි
අමජ්ජපො නො ච මුසා භණාමි සකෙන දාරෙන ච හොමි තුට්ඨො.

43 පාණාතිපාතා, පරපණනැසීමෙන්; ඛිප්පං, වහා; විරමාමි, වෙන්වෙමි; ලොකෙ, ලොකයෙහි; අදින්නං, හිමියන් විසින් නුදුන් දෙය;පරිවජ්ජයාමි, හාත්පසින්(නොගෙණ)බැහැරකරමි; අමජ්ජපො, මත්පැන් නොබොන්නෙක්වෙමි; මුසාච, බොරුද; නො භණාමි,නො කියමි; සකෙන දාරෙනච, සියඅඹු සමගම; තුට්ඨො හොමි, සතුටු වෙමි.

44 අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා;
පුච්ඡාමිතංදෙව මහානුභාව මනුස්සභූතො කිමකාසිපුඤ්ඤං·

44 දෙවතෙ, පින්වත් දෙවතාවෙනි; යා ත්වං, යම්බඳුවූ ඔබ; අභික්කන්තෙන වණ්ණෙන, අතිමනොඥවූ ආභායෙන්; හෙවත්-රූපවිලාසයෙන්; ඔසධී තාරකා විය, ඔෂධී (දවහන්) තරුවමෙන්; සබ්බා දිසා, සියලු දිගුන්; ඔභාසෙන්තී, බබුලුවමින්; තිට්ඨසි, සිටිනෙහිද; මහානුභාව, මහත්ආනුභාව ඇත්තාවූ; දෙව, දෙවය; තං, (ඒ) ඔබ; පුච්ඡාමි, විචාරමි; මනුස්සභූතො, මනුෂ්‍යවූයේ; කිං පුඤ්ඤං, කවරනම් පිණක්; අකාසි, කෙලෙහිද?

## මට්ඨකුණ්ඩලිවත්ථු.

---

45 සහස්සරංසි a සතතෙජො b සුරියො c තමවිනොදනො,
පාතොදයන්තො සුරියෙ මුද්ධා තෙ ඵලතු සත්තධා.

45 සුරියො, සූර්‍ය්‍යතෙම; සහස්සරංසි, දහසක්රැස් ඇත්තේය; සතතෙජො, සියක් තෙද ඇත්තේය; තමවිනොදනො, අඳුරුදුරුකරන්නේය; සුරියෙ,(ඒ යථොක්ත ගුණවත්) සූර්‍ය්‍යයා; පාතො, අලුයම; උදයන්තෙ, උදාවනකල්හි; තෙ, තාගේ; මුද්ධා, මස්තකය, සත්තධා, සත්කඩකට; ඵලතු, පැලේවා.

46 කම්මන්තා නප්පවත්තන්ති ජම්බුදීපස්ස නාරද,
යෙන ලොකො තමොභූතො තමෙම අක්ඛාහි පුච්ඡිතො.

46 නාරද, නාරදයන්වහන්ස; ජම්බුදීපස්ස, ජම්බුද්වීපයාගේ; කා

---

a සහස්සං රංසියො යස්ස සොයං සහස්සරංසි;b සතං තෙජො යස්ස සොයං සතතෙජො, cතමං විනොදෙති(පජහතී'ති) තමවිනොදනො;

ම්මන්තා, (කෘෂිකර්මාදී) කර්මාන්තයෝ; නප්පවත්තන්ති, නොපවතීත්; කෙන, කවරහෙයකින්; ලොකො, ලොකය; තමොභූතො, ඇඳිරිවූයේද; මෙ, මාවිසින්; පුච්ඡිතො, විචාරණලද්දවූ (ඔබ); තං, ඒ කාරණය; අක්ඛාහි, කිවමැනව.

## චූලතිස්සත්ථෙරවත්ථු.

47 සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙන'ත්තමනො
[සතීමා.

47 නිපකං, (ස්ථානොචිතප්‍රඥාවත්හෙයින්) දක්ෂවූ; සද්ධිං චරං, (තමාහා) සමග හැසිරෙන්නාවූ හෙවත් තමාසමග හැසිරීමට නිසිවූ; සාධුවිහාරිං, යහපත්විහරණ ඇත්තාවූ; ධීරං, ධෘතිසම්පන්නවූ; සහායං, කල්‍යාණමිත්‍රයෙකු; සචෙ ලභෙථ, ඉදින් ලබන්නේනම්; සබ්බානි පරිස්සයානි, සියලුඋවදුරු (විඩා); අභිභුය්‍ය, මැඩ; තෙන, ඔහුහා සමග, අත්තමනො, සතුටුසිත් ඇතිව; සතිමා, සමෘතිමත්ව; චරෙය්‍ය, හැසිරෙන්නේය.

48 නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං
රාජා'ව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙ
['ව නාගො'

48 නිපකං, ප්‍රඥාවත්වූ; සද්ධිං චරං, තමන්හාසමග වසන්නට සුදුසුවූ; සාධුවිහාරිං, යහපත්වූ විහරණ ඇත්තාවූ; ධීරං, ධෛර්‍ය්‍යවත්වූ; සහායං, කලණමිතුරෙකු; නො චෙ ලභෙථ, ඉදින් නොලබන්නේනම්; විජිතං, දිනනලද්දවූ; රට්ඨං පහාය, රටහැරපියා (වනයටවත්); රාජා ඉව, මහාජනකරජුමෙන්ද; අරඤ්ඤෙ, (ඇත්මුලහැරපියා) රක්ෂිතවනයෙහි (එකලාව වසන්නාවූ); මාතඞ්ගො නාගො ඉව, (පාරිලෙය්‍යකනම්වූ)හස්තිරාජයාමෙන්ද, එකො චරෙ, හුදකලාව හැසිරෙන්නේය.

49 එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා,
එකො චරෙ න ච පාපානි කයිරා අප්පොස්සුක්කො මාතඞ්ග
['රඤ්ඤෙ'ව නාගො.

49 එකස්ස, හුදකලාවූවහුගේ; චරිතං, වයසීමව (වාසය); සෙය්‍යො, ශ්‍රෙෂ්ඨයි; බාලෙ, බාලයාකෙරෙහි; සහායතා, (ශීලසමාධ්‍යාදීන්) සහායබවක්; නත්ථි, නැත්තේය; එකො චරෙ, (එහෙයින්) එක

ලාවම වසන්නේය; පාපානි, (ස්වල්පමාත්‍රවූද) පාපයන්; න ච කයිරා, නොකරන්නේය; අරඤ්ඤෙ, (රක්ෂිතනම්) වෙනෙහි; මාතඞ්ගනාගො ඉව, පාරිලෙය්‍යකහස්තිරාජයාමෙන්; අප්පොස්සුක්කො, (ගණපරිහරණයෙහි) නිරුත්සාහව; එකො චරෙ, එකලාව වසන්නේය.

## කොසම්බකවත්ථු.

---

50 අනිච්චා වත සඞ්ඛාරා [a] උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

50 සඞ්ඛාරා, (ප්‍රත්‍යයනිෂ්පන්නස්කන්ධධාත්වායතනාදී) සංස්කාරයෝ, (නොනොත් ත්‍රෛභූමිකසංස්කාරයෝ); වත, එකාන්තයෙන්; අනිච්චා, අනිත්‍යයහ; උප්පාදවයධම්මිනො, ඉපදීම හා නැසීම ස්වභාව කොට ඇත්තාහ; උප්පජ්ජිත්වා, ඉපිද; නිරුජ්ඣන්ති, (ඔහුතුමූ) නිරුද්ධ වෙත්; තෙසං, ඔවුන්ගේ; (නාමරූපයන්ගේ); වූපසමො, ව්‍යුපශමසඛ්‍යාත නිර්වාණය; සුඛො, සැපයි.

## චූලකාලමහාකාලවත්ථු.

---

51 කාලො'යං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං.

51 මහාවීර, මහාවීරයන්වහන්ස; තෙ, නුඹවහන්සේට; අයං කාලො, මේ (බුදුවන්නට) කල්වන්නේය; සදෙවකං, දෙවියන්සහිත ලෝකයා; තාරයන්තො, (සසරකතරින්) එතරකරවනසේක් (හෙවත්-තරණයකරවනු සඳහා); අමතං පදං, නිර්වාණපදය; බුජ්ඣස්සු, අවබොධකළමැනව්.

52 නිබ්බුතා නූන සා මාතා නිබ්බුතො නූන සො පිතා,
නිබ්බුතා නූන සා නාරී යස්සා'යං ඊදිසො පතී.

52 යස්සා, යම්ස්ත්‍රියෙකුට; අයං ඊදිසො, මේ මෙබන්දෙක්; පතී, ස්වාමිවේද; සා නාරී, ඒ ස්ත්‍රීතොමෝ; නිබ්බුතා නූන, නිවියාය යන විතර්කයක්වේ; යස්සා, යම්මෑනිකෙණෙකුට; අයං ඊදිසො, මේ මෙබන්දෙක්; පුතෙතා, පුත්‍රවේනම්; සා මාතා, ඒ මෑනිතොමෝ, නිබ්බුතා නූන, නිවියායයි හඟිමි; යස්ස, යම් පියකෙණෙකුට; අයං ඊදිසො, මේ මෙබන්දෙක්; පුතෙතා, පුත්‍රවේනම්; සො පිතා, ඒ පියතෙම; නිබ්බුතො නූන, නිවියේයයි හඟිමි.

---

[a] උප්පාදො ච වයො ච උප්පාදවයා. උප්පාදවයා ච තෙ ධම්මා (සභාවා)චෙති උප්පාදවයධම්මා. තෙඑසං සන්තීති උප්පාදවයධම්මිනො.

(අරුත්පියකතාවර "යස්සායං ඊදිසො පුත්තො නිබ්බුතා නූන සා මාතා, නිබ්බුතො නූන සො පිතා"යී යෙදියයුතු.)

53 අප්පං වා බහුං වා භාසස්සු අත්ථංයෙව මෙ බ්‍රෑහි,
අත්ථෙනෙව මෙ අත්ථො කිං කාහති ව්‍යඤ්ජනං බහුං.

53 අප්පං වා, සවල්පයක්හෝ; බහුං වා, අනල්පයක්හෝ; භාසස්සු, කථනයකෙරෙහිවා; මෙ, මට; අත්ථං එව, අර්ථයම, බ්‍රෑහි, කිවමැනව; මෙ, මට; අත්ථෙන එව, අර්ථයෙන්ම; අත්ථො, ප්‍රයොජනවේ; බහුං ව්‍යඤ්ජනං, බොහෝ ව්‍යඤ්ජන; කිං කාහති, කුමක්කරන්නේද?

54 ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛ'මාවහාති,
එසා'නිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති [a] ධම්මචාරී.

54 ධම්මො, (කුශලකර්මපථසඞ්ඛ්‍යාතවූ හෝ දානශීලාදිවූ) ධර්මය තෙම; ධම්මචාරිං, ධර්මයෙහි හැසිරෙන්නහු; හවෙ, එකාන්තයෙන්; රක්ඛති, රකියි; සුචිණ්ණො, මොනවට පුරුදුකරණලද්දාවූ: ධම්මො, ධර්මයතෙම; සුඛං, (දෘෂ්ටධාර්මිකසාම්පරායික) සුව; ආවහාති, එලවයි; සුචිණ්ණෙ, මොනවට පුරුදුකළාවූ; ධම්මෙ, ධර්මයෙහි; එසො ආනිසංසො (එපමණක්නොව තවත්)මේ ආනිසංසයක්වෙයි; ධම්මචාරී, ධර්මයෙහි හැසිරෙණසුලු තැනැත්තේ; දුග්ගතිං, දුර්ගතියකට; න ගච්ඡති, නොයයි.

55 නානා පුප්ඵං ච ගන්ධං ච සන්නිපාතෙත්වා එකතො,
[b] පුප්ඵාසනං පඤ්ඤපෙත්වා ඉදං වචනමබ්‍රවී.

55 නානාපුප්ඵං ච, නොයෙක්මල්ද; ගන්ධං ච, (නොයෙක්)සුවඳද; එකතො, එකට; සන්නිපාතෙත්වා, රැස්කොට; පුප්ඵාසනං, මල්අස්නක්; පඤ්ඤපෙත්වා, පණවා; ඉදං වචනං, මෙවදන්; අබ්‍රවී, කීයේය.

56 ඉදං මෙ ආසනං වීර පඤ්ඤත්තං තවනුච්ඡවිං,
මම චිත්තං පසාදෙන්තො නිසීද පුප්ඵමාසනෙ.

56 වීර, වීරයන්වහන්ස; තව, නුඹවහන්සේට; අනුච්ඡවිං, සුදුසුකොට; මෙ, මාවිසින්; ඉදං ආසනං, මේ ආසනය; පඤ්ඤත්තං, පණවනලද්දේය; මම, මාගේ; චිත්තං, සිත; පසාදෙන්තො, පහදවනසේක්; පුප්ඵආසනෙ, මල්අසුන්පිට, නිසීද, වැඩහිඳිනුමැනවි.

---

[a] ධම්මං චරිතුං සීලමස්සා'ති ධම්මචාරී [b] පුප්ඵෙහි කතං (අත්ථරිතං වා) ආසනං පුප්ඵාසනං; තං

57 සත්ත රතනිඤ්ඤිවං බුද්ධො නිසීදි පුප්ඵමාසනෙ,
මම චිත්තං පසාදෙත්වා හාසයිත්වා සදෙවකෙ.

57 බුද්ධො, සර්වඥතෙම; මම, මාගේ; චිත්තං, සිත; පසාදෙත්වා, පහදවා; සදෙවකෙ, දෙවියන්සහිත සත්ත්වයන්; හාසයිත්වා, සතොස් වා; සත්තරතනිඤ්ඤිවං, රැදුවල් සතක් මුළුල්ලෙහි; පුප්ඵආසනෙ, මල් අසුන් මතුයෙහි; නිසීදි, වැඩහුන්සේක.

**අග්ගසාවකාවදානං.**

---

58 යස්ස නිත්තිණ්ණො පඞ්කො ච මද්දිතො d කාමකණ්ටකො
මොහක්ඛයං අනුප්පත්තො *සුඛදුක්ඛෙ න වෙධති.

58 යස්ස, යම් භික්ෂුවකු විසින්; පඞ්කො, කෙලෙස්නැමැති මඩ; නිත්තිණ්ණො, නිස්තරණය කරණලද්දේද; කාමකණ්ටකො, පස්කම් කටු; මද්දිතො, මඩනලද්දේද; මොහක්ඛයං, මොහක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණයට (අර්හත්මාර්ගඵලයට); අනුප්පත්තො,(යමෙක්)පිළිවෙළින් පැමිණියේද; (හෙතෙම) සුඛදුක්ඛෙසු, සුවදුක්දෙක්හි; න වෙධති, කම්පමාන නොවෙයි.

59 පතොදං තෙ කරිස්සාමි e සොළසඞ්ගුලකණ්ටකං;
සඤ්ඡින්දිස්සාමි තෙ කායං එවං ජානාහි ගද්‍රභ.

59 තෙ, තට; සොළසඞ්ගුලකණ්ටකං, සොළොසඟුල් දික් කටු ඇත්තාවූ; පතොදං කරිස්සාමි, කෙවිටිකරන්නෙමි(කෙවිටින් තා පෙළන්නෙමි); තෙ කායං, තාගේ කය; සඤ්ඡින්දිස්සාමි, (ඉතා) සිඳින්නෙමි; ගද්‍රභ, කොටලුව; එවං ජානාහි, මෙසේ දනුව.

60 පතොදං මෙ කරිස්සසි සොළසඞ්ගුලකණ්ටකං,
පුරතො පතිට්ඨහිත්වාන උඩ්ඪරිත්වාන පච්ඡතො;
දන්තං තෙ සාවයිස්සාමි එවං ජානාහි කප්පට.

මෙ, මට; සොළසඞ්ගුලකණ්ටකං, සොළොසඟුල් දික් කටු ඇත් තාවූ; පතොදං කරිස්සසි, කෙවිටිකරන්නෙහිනම්; පුරතො, පෙරපසින්; පතිට්ඨහිත්වාන,පිහිටා(සිට); පච්ඡතො, පස්සෙහි (පා); උඩ්ඪරිත්වාන, උදුරා; තෙ, තාගේ; දන්තං, දත්; සාවයිස්සාමි, හෙළන්නෙමි; කප්පට, කප්පටය; එවං ජානාහි, මෙසේදනුව.

---

d කාමො එව කණ්ටකො, කාමකණ්ටකො. e සොළසඞ්ගුලානි කණ්ටකානි යස්මිංසො, සොළසඞ්ගුල කණ්ටකො. තං.

---

* "සුඛදුක්ඛෙසූ"ති පාඨොවෙබා. "කාමෙ ආදෙ භවන්තාගනිජාදි පුබ්බෙව භූයතෙ"ත්‍යාදිසු විය වණ්ණලොපෙන වුත්තං

61 f චතුප්පදිං g සඞ්ඛමුඛිං නාරිං h සබ්බඞ්ගසොභිනිං,
හරියං නො ආනයිස්සාමි එවං ජානාහි ගද්‍රභ.

61 චතුප්පදිං, පා සතරක් ඇත්තාවූ; සඞ්ඛමුඛිං, සඞ්ඛාකෘතිමුඛයක් ඇත්තාවූ; සබ්බඞ්ගසොභිනිං, හැම අවයවයෙන් හොබනාවූ; නාරිං, කොටලුදෙනක්; නො, තට; හරියං, භාර්‍ය්‍යාකොට; ආනයිස්සාමි; ගෙණඑන්නෙමි; ගද්‍රභ, ගද්‍රභය; එවං ජානාහි, මෙසේ දනුව.

62 චතුප්පදිං සඞ්ඛමුඛිං නාරිං සබ්බඞ්ගසොභිනිං,
හරියං මෙ ආනයිස්සසි කප්පට භියෙ‍ය්‍යා ගමිස්සාමි
[යොජනානි චතුද්දස.

62 කප්පට, කප්පටවාණිජය; චතුප්පදිං, පාසතරක් ඇත්තාවූ; සඞ්ඛමුඛිං, ශඞ්ඛාකාරමුඛ ඇත්තාවූ; සබ්බඞ්ගසොභිනිං, හැම අවයවයෙන් හොබනාවූ; නාරිං, කොටලුදෙනක්; මෙ, මට; හරියං, භාර්‍ය්‍යාකොට; ආනයිස්සසි, ගෙණඑන්නෙහිනම්; භියෙ‍ය්‍යා, බොහොසේ; (වඩා); චතුද්දසයොජනානි, තුදුස්යොත්නක්; ගමිස්සාමි, යන්නෙමි.

කන්දගලකවත්‍ථු.

---

63 සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච,
යං වෙ හිතං ච සාධුං ච තං වෙ පරමදුක්කරං.

63 අසාධූනි, (සම් කම්කෙණෙක් සාවද්‍යහෙයින්) අයහපත්ද; අත්තනො, තමහට; අහිතානි ච, (අපායසාධකහෙයින්) අහිතවෙත්ද; සුකරානි, (එසේවූ කාදුසිරිඅැ අකුසල්) සුකරයහ; (සුවසේකටහැක්කාහ); යං, යම්කම්යක්; වෙ, ඉදින්; හිතං ච, (සුගතිසාධකහෙයින් තමහට) හිතද; සාධුංච,(නිරවද්‍යබැවින්)යහපත්ද: තං, ඒ කුශලකර්මය (කරන්ට); වෙ, එකාන්තයෙන්; පරමදුක්කරං, අතිශයින්ම දුෂ්කරයි.

64 සුකරං සාධුනා සාධු සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං පාපමරියෙහි දුක්කරං.

64 සාධුනා, සත්පුරුෂයා විසින්; සාධු, සොඳුරුකම; සුකරං, සුවසෙ කටහැකිවේ; පාපෙන, පාපයාවිසින්; සාධු, සොඳුරුකම; දුක්කරං, දුෂ්කරයි(කළනොහැක්කේය);පාපෙන, පාපයා විසින්; පාපං, පාපකර්මය; සුකරං, සුවසේකළහැකිවේ; අරියෙහි, ආර්‍ය්‍යයන් (සුධීන්) විසින්; පාපං, පාපය; දුක්කරං, කළනොහැකිවේ.

---

f චත්තාරි පදානි අස්සා සන්තීʼති, චතුප්පදී; තං. g සඞ්ඛො ඉව මුඛං අස්සාතීʼති සඞ්ඛමුඛී, තං. h සබ්බානි ච තානි අඞ්ගානි අවයවානි චාʼති, සබ්බඞ්ගානි; තෙහි සොභිනී, සබ්බඞ්ගසොභිනී; තං.

65 හොති සීලවතං අත්ථො j පටිසන්ථාරවුත්තිනං,
ලක්ඛණං පස්ස ආයන්තං k ඤාතිසඞ්ඝපුරක්ඛතං,
අථ පස්සසිමං කාලං සුවිහීනං'ව ඤාතිහි.

65 පටිසන්ථාරවුත්තිනං, (ධර්මාමිෂවශයෙන් දෙවැදෑරුම්වූ) පටිසන්ථාරයම ප්‍රවෘත්ති (පිළිසඳරපැවතුම්) කොට ඇත්තාවූ; සීලවතං, සිල්වතුන්ට; අත්ථො, (දෘෂ්ටධාර්මික සාම්පරායික) අභිවෘද්ධිය; හොති, වෙයි; ඤාතිසඞ්ඝපුරක්ඛතං, ඤාතිසමූහයා විසින් පුරස්කෘතව (පෙරටු කරණලදුව); ආයන්තං, එන්නාවූ; ලක්ඛණං, ලක්ෂණමෘගයා; පස්ස, බලව; අථ, වැලිදු; ඤාතීහි, නෑයන්ගෙන්; සුවිහිනං එව, පිරිහුනාවූම; ඉමං කාලං, මේ කාලමෘගයා; පස්සසි, බලව.

66 අපි වීරක පස්සෙසි සකුනං l මඤ්ජුභාණකං,
m මයූරගීවසඞ්කාසං පතිං මය්හං සවිට්ඨකං.

66 වීරක, භවත්වීරකය; මඤ්ජුභාණකං, මියුරුකොට හඬන්නාවූ; මයූරගීවසඞ්කාසං, මොනරකරකටබඳු පැහැඇත්තාවූ; මය්හං පතිං, මාහිමිවූ; සවිට්ඨකං, සවිට්ඨකනම්වූ; සකුනං, පක්ෂියා (කවුඩා); අපි පස්සෙසි, දුටුයෙහිද?

67 n උදකථලචරස්ස පක්ඛිනො නිච්චං o ආමකමච්ඡභොජිනො,
තස්සානුකරං සවිට්ඨකො සෙවාලෙ පළිගුණ්ඨිතො මතො.

67 උදකථලචරස්ස, දියගොඩදෙක්හි හැසිරෙන්ට සමර්ථවූ; නිච්චං, අනවරතයෙන්; ආමකමච්ඡභොජිනො, අමුමස්බුදින්නාවූ; තස්ස පක්ඛිනො, ඒ පක්ෂිවූමට; අනුකරං, අනුකාරීවූ(සමානභාවයෙන් අනුගතව ක්‍රියාකරන්නාවූ); සවිට්ඨකො, (තී සැමිවූ) සවිට්ඨකතෙමේ; සෙවාලෙ, සෙවෙලෙහි; පළිගුණ්ඨිතො, දූවවුනේ (ගෙවත් සෙවලින් වලඳනාලදුව); මතො, මළේය.

68 අචරි වතායං විතුදං වනානි p කට්ඨඞ්ගරුක්ඛෙසු අසාරකෙසු,
අථ'සදා ඛදිරං q ජාතසාරං යත්ථ'භිදා ගරුළො උත්තමඞ්ගං.

68 අයං, මේ කෑදැගලකතෙම; වනානි, (නිස්සාරවූ) ශිම්බලීපාරි

---

j ධම්මපටිසන්ථාරො ච ආමිසපටිසන්ථාරො ච එතෙසං වුත්ති'ති පටිසන්ථාරවුත්තිනො, තෙසං. k ඤාතීනංසඞ්ඝො ඤාතිසඞ්ඝො, තෙන පුරක්ඛතො, ඤාතිසඞ්ඝපුරක්ඛතො; තං. l මඤ්ජුං (මනුඤ්ඤං,) භණතී'ති, මඤ්ජුභාණකො, තං. m මයූරස්ස ගීවා මයූරගීවා, තාය සඞ්කාසො, මයූරගීවසඞ්කාසො, තං. n උදකඤ්ච ථලඤ්ච උදකථලානි, තානි (තෙසු) චරතී'ති උදකථලචරො; තස්ස. o ආමකා ච තෙ මච්ඡා චෙ'ති ආමකමච්ඡා, තෙ භුඤ්ජති සීලෙනා'ති ආමකමච්ඡභොජී, තස්ස;

හදුදිමනයන්; (හෙවත්-හිඹුල්එරබදුආදිරුක්); ඵිතුදං, මිදිමින්(සාර මින්); අසාරකෙසු, හරනැත්තාවූ, කණ්ඩගරුකෙඛසු, කාණ්ඩාවයවවත් වෘක්ෂයන්හි(වියලිගස්හි); වන, එකාන්තයෙන්; අචරී, හැසුරුණේය; අථ, ඉක්බිත්තෙන්; ගරුළො, ගරුළ (කැරල) පක්ෂිතෙම; යතා, යම් රුකෙක්හි (හපා); උත්තමඞ්ගං, (නමන්) හිස; අභිහිඳ, බිඳගත්තේද; ජාතසාරං, හටගත් හරඇත්තාවූ; ඛදිරං, ඒ කිහිරිරුකට, ආසද, පැමිණියේය.

69 ලසී ච තෙ නිප්ඵලිතා මත්ථකො ච විදාලිතො,
සබ්බා තෙ ඵාසුකා භග්ගා අජ්ජ ඛො ත්වං විරොචසී.

69 තෙ, තාගේ; ලසි ච, හිස්මොලද;·නිප්ඵලිතා, නික්මින; මත්ථකොච, මස්තකයද; විදාලිතො, පැළුනේය; තෙ, තාගේ; සබ්බා ඵාසුකා, සියලු පරාලපතු (ඉලඇට); භග්ගා, බිදුනාහුය; අජ්ජ ඛො, අදව නාහි; ත්වං, තෝ; විරොචසි, බබලන්නෙහිය.

70 අකරම්හසතෙ කිච්චං යං බලං අනුවම්හසෙ,
මිගරාජ නමො ත්‍යත්ථු අපි කිංචි ලභාමසෙ.

70 මිගරාජ, මෘගරාජය (සිංහය); තෙ කිච්චං, ඔබට කටයුතුදේ; අකරම්හසෙ, කෙළෙමු; යං බලං, (අපට) යම්ශක්තියක්; අනු, වීද; අම්හසෙ එව, (ඉන්කිසිවක් නොපිරිහෙලා කටයුතුදේකළෝම)වෙමු; නොහොත්-යං බලං, යම්බලයකට; අනුවම්හසෙ,(අපි)පැමුණුනෙමුද; (ඉන්කිසිත් නොපිරිහෙලා); තෙ කිච්චං, ඔබටකටයුතුදේ; අකරම්හසෙ, කෙළෙමු; තෙ, යුෂමත්හට; නමො, නමස්කාරය; අත්ථු, වේවා; කිංචි, කිසිවක්; ලභාමසෙ, (අපිත්) ලබමෝනම්; අපි, ඒ මැනවි.

71 මම ꝭ ලොහිතභක්ඛස්ස නිච්චං එඳ්දානි කුබ්බතො,
ŧ දන්තන්තරගතො සන්තො තං බහුං යම්හි ජීවසි.

71 නිච්චං, නිරන්තරයෙන්; ලුද්දානි, රෞද්‍රක්‍රියාවන්; කුබ්බතො, කරන්නාවූ; ලොහිතභක්ඛස්ස, (මෙරමා)ලේවැකුනුමස් බුදින්නාවූ; මම, මාගේ; දන්තන්තරගතො සන්තො, දංෂ්ට්‍රාන්තරයට පැමිණි යෙක්වූව තෝ; යම්හි, යම්කාරණයක්නිමිතිකොට; ජීවසි, ජීවත්වන් නෙහිද(මාමුවතුළවැද නොමිය නැඟීගියෙහිද); තං, හේම; බහුං, අධි කවූ උපකාරයයි; (මාමුව වන් තා නොමරා හැරපුබැව්ම උපකාරයි).

---

p කණ්ඩානි එව අඞ්ගානි(අවයවානි)එතෙසන්ති කණ්ඩගා,කණ්ඩගා ච තෙ රුක්ඛා චෙති කණ්ඩගරුක්ඛා, තෙසු. q ජාතං(සජාතං)සාරං එතස්සා ති ජාතසාරො; තං.

ꝭ ලොහිතං භක්ඛතී'ති ලොහිතභක්ඛො,තස්ස ŧ දන්තානං අන්තරං. දන්තානන්තරං, තං ගතවා'ති දන්තානන්තරගතො.

72 සුතමෙතං කුරුඞ්ගස්ස යං ත්වං සෙපණ්ණි සෙය්‍යසි,
අඤ්ඤං සෙපණ්ණිං ගච්ඡාමි න මෙ තෙ රුච්චතෙ ඵලං.

72 සෙපණ්ණි, (එම්බා) ඇත්දෙමටරුක; ත්වං, තෝ; යං, යම් හෙයකින්; සෙය්‍යසි, (ඉදිරියෙහි පල) විසුරුවෙහිද; එතං, ඒමේකාරණය; කුරුඞ්ගස්ස, කුරුඞ්ග මෘගනම්වූ මෑවිසින්; සුතං, දන්නා ලද්දේය; අඤ්ඤං සෙපණ්ණිං, අන් ඇත්දෙමටරුකක් කරා; ගච්ඡාමි, යමි; තෙ, තාගේ; ඵලං, ගෙඩි; මෙ, මට; න රුච්චතෙ, නොරුස්නේය.

73 අක්ඛී භින්නා පටො නට්ඨො සඛිගෙහෙ ච භණ්ඩනං,
උභතො පදුට්ඨ කම්මන්තා උදකම්හි ථලම්හි ච.

73 අක්ඛි, ඇස්දෙක; භින්නා, බින්හ; පටො, (ගොඩතුබූ නමාහන්) සළුද; නට්ඨො, නටුයේය; (සොරුන්හළු); සඛිගෙහෙච, යෙහෙලියගේ ගෘහයෙහිද; භණ්ඩනං, (බිරින්දවිසින්) කලහ (කරණලදී); උදකම්හි, දියෙහිද; ථලම්හි ච, ගොඩෙහිද; (යන); උභතො, දෙතැන්හි; පදුට්ඨකම්මන්තා, ප්‍රදුෂ්ටිතකර්මඇත්තෙහි වී.

74 වධකෙ දෙවදත්තම්හි චොරෙ අඞ්ගුලිමාලකෙ,
ධනපාලෙ රාහුලෙ ච සබ්බත්ථ සමමානසො.

74 වධකෙ, වධකවූ (වධකාරීවූ); දෙවදත්තම්හි, දෙවදත්තයා කෙරෙහිද; අඞ්ගුලිමාලකෙ චොරෙ, අඟුල්මල්සොරු කෙරෙහිද; ධනපාලකෙ, එනම් හස්තියා කෙරෙහිද; රාහුලෙ ච, රහල්කුමරු කෙරෙහිද (යන); සබ්බත්ථ, මේසියල්ලන් කෙරෙහිව; සමමානසො, සමාන සිත්ඇත්තේවෙමි.

75 ඉමෙහි අඞ්ගෙහි තමග්ගපුග්ගලං
a දෙවාතිදෙවං b නරදම්ම සාරථිං,
c සමන්තචක්ඛුං d සතපුඤ්ඤලක්ඛණං
පාණෙහි බුද්ධං * සරණං ගතො'ස්මි.

75 ඉමෙහි අඞ්ගෙහි, මේ හනුකාඃටීන් කරණකොටගෙණ; නොහොත්

a අති (උක්කට්ඨො) දෙවො, අතිදෙවො, දෙවානං දෙවෙසු වා අතිදෙවො, දෙවාතිදෙවො; තං. b දමිතබ්බා (දමෙතුං යුත්තා වා) දම්මා, දම්මා ච තෙ නරා චේති නරදම්මා, තෙ සාරෙති (දමෙති විනෙතී'ති) නරදම්මසාරථි; තං. c සමන්තතො චක්ඛු යස්ස සොයං සමන්තචක්ඛු; තං. d සතපුඤ්ඤතො (නිබ්බත්තං) ලක්ඛණං යස්ස සො සතපුඤ්ඤලක්ඛණො; තං.

* සරණං යනු භාව නපුංසක නිර්දේශයි.

ඉමෙහි අට්ඨිහි, මේ (මේ)අට්ඨිවලින්; අග්ගපුග්ගලං, අග්‍රපුද්ගලවූ; දෙවාතිදෙවං, දෙවියන්ට අධිදෙවවූ; නරදම්මසාරථිං, පුරුෂදම්‍යසාරථිවූ; සමන්තචක්ඛුං, සමතැස් ඇත්තාවූ; සතපුඤ්ඤලක්ඛණං, ශතපුණ්‍ය ලක්ෂණ ඇත්තාවූ; තං බුද්ධං, ඒ සර්වඥයන්වහන්සේ; පාණෙහි, දිවි හිමිකොට; (ජීවිතාන්තය දක්වා); සරණං, සරණකොට; ගතො අස්මි, ගියේ වෙමි.

76 අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං e විවරදස්සිනො;
සබ්බං චෙ පථවිං දජ්ජා නෙව නං අභිරාධයෙ.

76 අකතඤ්ඤුස්ස, අකෘතඥවූ; (කෙලෙහිගුණ නොදන්නාවූ); නිච්චං, අනවරතයෙන්; විවරදස්සිනො, ඡිද්‍රදර්ශිවූ; (අනුන් සිදුරු සොයන්නාවූ); පොසස්ස, පුරුෂයාහට; චෙ, ඉදින්; සබ්බං පථවිං, මුළු පොළොව; දජ්ජා, දුන්නේවීනමුත්; නං, ඔහු; නෙව අභිරාධයෙ, නොම සතුටුකරන්නේය.

77 සබ්බො ජනො හිංසිතො පිඞ්ගලෙන,
තස්මිං මතෙ පච්චයා වෙදියන්ති
පියො නු තෙ ආසි f අකණ්හනෙත්තො,
කස්මා නු ත්වං රොදසි ද්වාරපාල.

77 පිඞ්ගලෙන, (පිඟුවන් ඇස්ඇතිහෙයින්) පිඞ්ගලනම් රජහු විසින්; සබ්බො ජනො, හැමදෙන; හිංසිතො, (දඬගැසීම්ආදිවූ අධර්ම ප්‍රවෘත්තීන්) පෙළන ලද්දේය; තස්මිං, ඔහු; මතෙ, මළකල්හි; පච්චයා, ප්‍රීති; වෙදියන්ති, විඳිනුලබත්; ද්වාරපාල, දොරටු පල්ල; අකණ්හ නෙත්තො, අකෘෂ්ණ නෙත්‍රවත්වූ (කලුනොවූ පිඟුවන් ඇස්ඇති) ඒරජතෙම; තෙ, තට; පියො ආසි නු, ප්‍රියවූයේද; ත්වං. තෝ; කස්මා, කවරහෙයකින්; රොදසි නු, හඬන්නෙහිද?

78 න මෙ පියො ආසි අකණ්හනෙත්තො
භායාමි පච්චාගමනාය තස්ස,
ඉතො ගතො හිංසෙය්‍ය මච්චුරාජං
සො හිංසිතො ආනයෙය්‍ය පුන ඉධ.

78 අකණ්හනෙත්තො, පිඞ්ගලාඛ්‍යකතෙම; මේ, මට; පියො න ආසි, ප්‍රිය නොවූයේය; තස්ස, ඔහුගේ; පච්චාගමනාය, ප්‍රත්‍යාගමනයට;(පෙරළාඊමෙන්); භායාමි, බිමි; ඉතො, මෙසින්;ගතො, මියගියේ;

---

e විවරං පස්සති සීලෙනා'ති, විවරදස්සී; තස්ස. f න කණ්හානි අක්ඛීනි, අකණ්හානි නෙත්තානි යස්ස සො අකණ්හනෙත්තො.

මච්ඡරාජං, මත්ස්‍යරාජයාට; හිංසෙය්‍ය, හිංසාකෙළේවීනම්; සො, ඒ කෘතඝ්නතෙම; හිංසිතො, (ඔහු විසින්) පීඩිතවූයේ; පුන, නැවත; ඉධ, මෙහි; ආනයෙය්‍ය, එවන්නේය(යි දුකින් හඬමිගියකී).

### දෙවදත්ත වත්ථු.

### යමකවග්ගවණ්ණනා

### සමත්තා.

---

79 යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති,
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති.

79 අදණ්ඩෙසු, (කායදණ්ඩාදි රහිතහෙයින්) දණ්ඩනයට නුසුදුසුවූ; අප්පදුට්ඨෙසු, නොදූහැවියවුන් කෙරෙහි; නොහොත්-තමන්ට හා මෙරමාහටත් අද්‍රෝහීවූ ක්ෂීණාශ්‍රවයන් විෂයෙහි; යො, යම්කිසිවෙක්; දණ්ඩෙන, කායදණ්ඩාදි දණ්ඩනයකින්; දුස්සති, අපරාධකෙරේද; සො, ඒ අපරාධකාරි පුද්ගලතෙම; දසන්නං, දසවැදෑරුම්වූ දුඃඛකාරණයන් අතුරෙන්; අඤ්ඤතරං ඨානං, එක්තරා කරුණකට; ඛිප්පං එව, වහාම; (ඉහාත්මභාවයෙහිම); නිගච්ඡති, පැමිණෙයි; හේ කෙසේදයත්?.

80 වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං,
ගරුකං වා'පි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ.

80 ඵරුසං, කර්කශවූ; වෙදනං, (අත්පාබිඳීම්ආදියෙන්වූ) ශාරීරික වෙදනාවකට හෝ; ජානිං, (මහත්වූ යශෝධන පුණ්‍ය) හානියකට හෝ; සරීරස්ස භෙදනං වා, (හස්තපාදච්ඡේදාදි) ශරීරභෙදයකට හෝ; අපි, ඒ ඇර; ගරුකං අබාධං වා, කාශශ්වාසාදී බලවත් ආබාධයකට හෝ; චිත්තක්ඛෙපං වා, (යක්ෂොන්මාද පිත්තොන්මාදාදිවූ) චිත්තවික්ෂෙපයකට හෝ; පාපුණෙ, පැමිණෙන්නේය.

81 රාජතො ච උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං,
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං.

81 රාජතො, රජුන්ගෙන් වන්නාවූ; උපස්සග්ගං වා, (තනතුරින් පහළිම්ආදී) උවදුරකට හෝ; දාරුණං, දරුණුවූ; අබ්භක්ඛානං වා, අභ්‍යාඛ්‍යානය (අපකීර්තිය)කට හෝ; ඤාතීනං, නෑයන්ගේ; පරික්ඛයං වා, ක්ෂයභාවයකට (විනාශයකට) හෝ; භොගානං, හිරණ්‍ය සුවර්ණාදී සම්පත්තින්ගේ; පභඞ්ගුරං වා, විනාශයකට හෝ; (පැමිණෙන්නේය).

82 අථ වස්ස අගාරානි අග්ගි ඩහති පාවකො,
කායස්ස භෙදා [c] දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති.

82 අථවා, වැලිදු; පාවකො, පාවකනම්වූ; අග්ගි වා, ගින්නතෙමෙහෝ; අස්ස, ඒ පුද්ගලයාගේ; අගාරානි, වාසාගාරයන්; ඩහති, දවයි; සො දුප්පඤ්ඤො, ඒ දුෂ්ප්‍රාඥ පුද්ගලතෙම; කායස්ස භෙදා, කායභෙදයෙන් (මරණින්මත්තෙහි); නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදනේය; නොහොත්-නිරයං, නිරයකාරා; උපපජ්ජති, උත්පත්ති වශයෙන් පැමිණේ.

83 පුබ්බෙ ච සන්නිවාසෙන [f] පච්චුප්පන්නහිතෙන වා,
එවං තං ජායතෙ පෙමං උප්පලං ව යථොදකෙ.

83 පුබ්බෙ, පූර්වජන්මයෙහි; සන්නිවාසෙන වා, (පුත්‍රභ්‍රාතෘසඛීවාදිවශයෙන්)සමග විසීමෙන් හෝ; පච්චුප්පන්නහිතෙනවා, ප්‍රත්‍යුත්පන්නකාලයෙහි කළ හිතයෙන් හෝ; එවං, මෙසේ; තං පෙමං, ප්‍රෙමය; ජායතෙ, උපදියි; (කෙසේදයත්?) උදකෙ, ජලයෙහි; උප්පලංවා යථා, උත්පලාදිය (හටගන්නාක්)මෙනි; ("උප්පලංවා" යන්තෙහි වා ශබ්දය සමුච්චයාර්ථයෙහි හෝවැටේ. එහෙයින් "උප්පලං වා කමලං වා කුමුදං වා" යි අරුත් බිණියුතු).

84 ඉච්ඡිතං පත්ථිතං තුය්හං සබ්බමෙව සමිජ්ඣතු,
පූරෙන්තු සබ්බෙ සඞ්කප්පා චන්දො [g] පණ්ණරසො යථා.

84 තුය්හං, තාවිසින්; ඉච්ඡිතං, ආකාඞ්ක්ෂිතවූද; (වූවමැනවැයි සිතනලද්දවූද); පත්ථිතං, (මේවයි) පතන ලද්දවූද; සබ්බං එව, සියල්ලම; සමිජ්ඣතු, (තට) සමෘද්ධවේවා; පණ්ණරසො චන්දො යථා, පසළොස්වක පුර සඳසේ; සබ්බෙ සඞ්කප්පා, සියලු චිත්තසඞ්කල්පයෝ, පූරෙන්තු, පිරෙන්වා.

85 ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු,
පූරෙන්තු සබ්බෙ සඞ්කප්පා මණි [h] ජොතිරසො යථා.

85 තුය්හං, තාවිසින්; ඉච්ඡිතං, ඊප්සිතවූ; (කැමැත්වූද); පත්ථිතං, පතනලද්දවූද; (සියල්ලම); නොහොත්-තුය්හං, තාගේ; ඉච්ඡිතං, (සියලු) ඊප්සාද; පත්ථිතං. (සියලු) ප්‍රාර්ථනාද; ඛිප්පං එව, වහාම;

---

c දු(කුච්ඡිතා මන්දා) පඤ්ඤා යස්සා'ති දුප්පඤ්ඤො. පච්චුප්පන්නෙන (කතං) හිතං, පච්චුප්පන්නහිතං; තෙන. g පඤ්චදසන්නං තිථීනං පූරණො පණ්ණරසො පණ්ණරසියං ජාතොවා පණ්ණරසො.

h ජොතිසො රසාති විසරන්ති එතස්මා'ති ජොතිරසො.

සම්පජ්ජතු, සමෘද්ධවේවා; ජොතිරසො මණි යථා, ජ්‍යොතිරස් (සිතු)මිණ මෙන්; සබ්බෙ සඞ්කප්පා, සියලු සඞ්කල්පනාවෝ; පූරෙන්තු, පි රෙත්වා.

86 රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති සහසා'නුපීළිතං,
මූළ්හස්ස හොති අවකඩ්ඪිතං පදං
i විවට්ටච්ඡද්දස්සිදමීදිසං පදං.

86 රත්තස්ස හි, රාගරක්තයාගේ වනාහි; හෙවත්-රාගාධිකයා ගේ වනාහි; පදං, පිය, උක්කුටිකං භවෙ, (පතුල්මැද මලවනබැවින්) මැදින් උස්වේ; දුට්ඨස්ස, ද්වේෂදුෂ්ටයාගේ; හෙවත්-ද්වේෂාධිකයාගේ; (පදං, පිය); සහසානුපීළිතං, සහසානුපීඩිතවේ; (පෙරට පතුල්ඔබා වහවහා ඉක්මෙනබැවින් පියඅගින් එබී පෙණෙයි සේයි) මූළ්හස්ස, මූඪයාගේ; හෙවත්-මොහාධිකයාගේ; පදං, පිය; අවකඩ්ඪිතං හොති, අවකර්ෂිතවේ; (මුලට අදින ලද්දේවේ); විවට්ටච්ඡද්දස්ස, පහකළ කෙලශච්ඡදන ඇත්තාහුගේ; පදං, පියවර, ඉදං ඊදිසං, මෙබඳුයි. (මෙබඳු පිය කෙලෙස් නැසුවක්හුගේයයි සේයි).

87 දිස්වාන තණ්හං අරතිං රගං ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං k මුත්තකරීසපුණ්ණං
පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ

87 තණ්හං, තෘෂ්ණාවද; අරතිං, අරතියද; රගං, රගාවද; (යන මාරදුහිතෘන්); දිස්වාන, දැක; මෙථුනස්මිං, මෙවුන්දම්හි; ඡන්දො අපි, ඡන්දමාත්‍රයකුත්; න අහොසි, (මට) නොවූයේය; මුත්තකරීස පු ණ්ණං, මූත්‍රපුරීෂයෙන් පිරුණාවූ; හෙවත්-දෙතිස්කුණපයෙන් පිරූ; ඉදං, මේ කලෙබරය (දැක); කිං එව, කවරහෙයකින් (ඡන්දයක් උප දීද)? නං, ඒ කලෙබරය; පාද අපි, පයින්වත්; සම්ඵුසිතුං, ස්පර්ශක රන්නට; න ඉච්ඡෙ, නොකැමැත්තෙමි.

88 අහං නාගොව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං,
අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො.

88 සඞ්ගාමෙ, යුධභූමියෙහි; චාපාතො, දුන්නෙන්; පතිතං, හීලි හී(තමන්සිරුරු)හුනු; සරං, හී(ඉවසන්නාවූ); නාගො ඉව, (සඞ්ග්‍රාමා

---

i විවට්ටං ඡද්දං(යෙන) යස්ස වා සො විවට්ටච්ඡද්දො; තස්ස
k මුත්තං ච කරීසං ච මුත්තකරීසානි, තෙහි පුණ්ණං මුත්ත කරීසපුණ්ණං; තං.

චචරසුඛිඝිත) හස්තියෙක්මෙන්; අහං, මම; අතිවාක්‍යං, (අෂ්ටානායසී ව්‍යවහාරවශයෙන් කියනලද) පරුෂවචනතාක්; තිතික්ඛිස්සං, ඉවසන්නෙමි; හි, සම්භෙයකින්; බහුජ්ජනො, (මේ ලෞකික)මහාජනතෙම; දුස්සීලො, දුශ්ශීලද; (ශීලසංවරයක් නැත්තේද); එහෙයිනි.

89 දන්තං නයන්ති සමිතිං දන්තං රාජා'භිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු යො'ති වාක්‍යං තිතික්ඛති.

89 දන්තං, දමනාහස්තියෙකු හෝ අශ්වයෙකුම; සමිතිං, (උයන් කෙළිආදියෙහි) මහජනයා රැස්වූතැනකට; නයන්ති, (රථාදියෙහි යොදා) ගෙණයත්; රාජා, රජතෙම; දන්තං, දමුනෙකුපිටම්; අභිරූහති, නගියි; යො, යමෙක්තෙම; අතිවාක්‍යං, (අනුන්බිණූ) පරොස්බස්; තිතික්ඛති, ඉවසාද; දන්තො, (එසේ ආයසීමාගීයෙන්) කෙලශ දමනයකළාවූ හෙතෙමේම; මනුස්සෙසු, මිනිසුන්අතුරෙන්; සෙට්ඨො, උතුම්.

90 වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච මහානාගා [1] අත්තදන්තො තතො වරං.

90 අස්සතරා, (කොටලුටදුව වෙළඹකුසළපන්) අශ්වතරයෝද; දන්තා, දමුනාහුම; වරං, උතුම්; ආජානීයා ච, (අශ්වදමකයා විසින් කරණලද ශික්ෂණයහා පිටමතුළන්නහුගේ අදහස් වහාදැනගන්නා හෙයින්); ආජානෙයනම්වූ අශ්වයෝද; සින්ධවා ච, (සින්ධුදේශයෙහි උපන්හෙයින්) සෙන්ධවනම්වූඅශ්වයෝද; මහානාගා, මහානාගසඛ්‍යාතවූ; කුඤ්ජරා, හස්තිහුද;දන්තා, දැම්යෝම; වරං, උතුම්; තතො, ඔවුන් හැමටවඩා; අත්තදන්තො, (චතුරායසීමාගීයෙන්) තමා දමනය කෙළේම; වරං, උතුම්යි.

91 සම්මුය්හාමි පමුය්හාමි සබ්බා මුය්හන්ති මෙ දිසා,
සාමාවතී මං තායස්සු ත්වං ච මෙ සරණං භව.

91 සම්මුය්හාමි, හාත්පසින් මුළාසිත්ඇතියෙමි; පමුය්හාමි, පුමුඛයෙහි මුළාසිත්ඇතියෙමි; මෙ, මට; සබ්බා දිසා, සියලු දිසාවෝ; මුය්හන්ති, මුළාවෙත්; සාමාවතී, සාමාවතිය; මං තායස්සු, මාරකුව මැනව; ත්වංච, තීම; මෙ, මට; සරණං භව, පිහිටවුව මැනව.

92 ඉදං වත්වා සාවවතී [n] සම්මාසම්බුඩසාවිකා,
මා මං ත්වං සරණං ගච්ඡ යමහං සරණං ගතා.

---

1 අත්තානං අදමි'ති අත්තදන්තො.
n සම්මාසම්බුඩස්ස සාවිකා සම්මාසම්බුඩසාවිකා.

92 සම්මාසම්බුද්ධසාවිකා, සම්‍යක්සම්බුද්ධශ්‍රාවිකාවූ; සාමාවතී, සාමාවතීනොමෝ; ඉදං වත්වා, මෙතෙපල්බැණ (කියපන්නී); ත්වං, තුඹවහන්සේ; මං, මා; සරණං, සරණකොට; මා ගච්ඡ, නොයව; අහං, මම; යං, සම්බුද්ධවරයකු; සරණං ගතා, සරණකොට ගියෙම්ද.

93 එස බුද්ධො මහාරාජ එස බුද්ධො අනුත්තරො,
සරණං ගච්ඡ තං බුද්ධං ත්වං ච'මෙ සරණං භව.

93 මහාරාජ, මහරජානෙනි; එසො, ඒමෙතෙම; බුද්ධො, සර්වඥය; එසො බුද්ධො, ඒ මේසර්වඥයෙම; අනුත්තරො, (තමහටවඩා) උත්තමයකු නැතිකෙණෙක; තං බුද්ධං, ඒසම්බුද්ධයන්වහන්සේ; සරණං ගච්ඡ, සරණකොටයනුමැනව; ත්වං ච, තුඹවහන්සේද; මෙ, මට; සරණං භව, සරණවූව මැනව.

94 එස හීයෙය්‍යා පමුඤ්චාමි සබ්බා මුඤ්චන්ති මෙ දිසා,
සාමාවතී මං තායස්සු ත්වං ච මෙ සරණං භව.

94 එසො, මේ මම; හීයෙය්‍යා, බෙහෙවින්; පමුඤ්චාමි, ප්‍රකාශයෙන් මුද්‍රාවෙමි; (පමුසෙනී මූලාසිත්ඇතියෙමි); මෙ, මට; සබ්බා දිසා, හැම දික්හු; මුඤ්චන්ති, මුද්‍රාවෙත්; සාමාවතී, සාමාවතිය, මං, මා; තායස්සු, රැකුවමැනව; ත්වංච, තීම; මෙ, මට; සරණං භව, පිහිටවූව මැනව.

95 m මොහසම්බන්ධනො ලොකො o භබ්බරූපොව දිස්සති,
p උපධිසම්බන්ධනො බාලො තමසා පරිවාරිතො;
සස්සති විය ඛායති පස්සතො නත්ථි කිඤ්චනං.

95 ලොකො, ලෝවැසිතෙම; මොහසම්බන්ධනො, මොහයසම්බන්ධකොටඇත්තේ; භබ්බරූපො ඉව, භව්‍යස්වරූප ඇත්තෙක්මෙන්; දිස්සති, පෙණෙයි; උපධිසම්බන්ධනො, ක්ලෙශොපධි සම්බන්ධකොටඇත්තාවූ; බාලො, බාලතෙම; තමසා, මොහාන්ධකාරයෙන්; පරිවාරිතො, පිරිවරණලද්දේවේ; සස්සති විය, (රූපාදිය) ශාශ්වතිකයක්මෙන්; (පෘථිවීපර්වතාදි ස්ථිරවස්තුවක්මෙන්); ඛායති, වැටහෙයි; පස්සතො, (විදසුන්නුවනින් ඝනයබිඳ) බලන්නාහට; කිඤ්චනං, කිසිවක්; නත්ථි, නැත්තේය (හෙවත් ඒ කිසිවක් ශාශ්වතනොවනබැව් වැටහෙයි).

උදෙනි වත්ථු.

---

m මොහො එව සම්බන්ධනං යස්ස සොයං මොහසම්බන්ධනො. o භබ්බං රූපං භබ්බස්ස රූපං වා යස්සසො භබ්බරූපො. p උපධි එව සම්බන්ධනං යස්ස සොයං උපධිසම්බන්ධනො.

96 පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ල[†] මවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ.

96 කොකනදං පදුමං, කොකනදයයි කියනලද පියුම්; පාතො, අලුයමම; ඵුල්ලං, සුපුල්ලවූයේ; සුගන්ධං, සුරභිගන්ධවත්වූයේ; යථා, යම්සේ; අවීතගන්ධං සියා, නොකඩවූ ගඳඇති වන්නේද; (එපරිද්දෙන්ම අපයශීනාගුණගන්ධයෙන් යුක්තවූ); අන්තලික්ඛෙ, අහස්හි; තපන්තං, දිලියෙන්නාවූ; ආදිච්චං ඉව, හිරුමෙන්; විරොචමානං, (රැස්කඳම්බින්) වොරජනා (බබලන්නා)වූ; අඞ්ගීරසං, සම්බුදුයන්වහන්සේ; පස්ස, බලව.

97 රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජො'ති,
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ[§] විගතරජස්ස සාසනෙ.

97 රාගො, රාගයතෙම; රජො, රජසයි; රෙණු (මෙහිරජස් යනුවෙන්) ධූලි; න ච පන වුච්චති, නොකියනුලැබේ; රජො ඉති, රජස් යන; එතං, මෙය; රාගස්ස, රාගයට; අධිවචනං, විශිෂ්ටනාමයකි; විගතරජස්ස, පහවූරාගරජස්ඇති තථාගතයානන්ගේ; සාසනෙ, සස්නෙහි; තෙ භික්ඛවො, ඒ මහණහුතුම්; එතං රජං, මේ රාගරජස; විප්පජහිත්වා, වෙසෙසින් බැහැරකොට; විහරන්ති, වෙසෙත්.

98 දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජො'ති,
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

98 දොසො, ද්වෙෂයතෙම; රජො, (මෙහි) රජස්වේ; රෙණු, ධූලි; න ච පන වුච්චති, (මෙහි රජස්යනුවෙන්) නොකියනුලැබේ; රජො ඉති, රජොයන; එතං, මෙය; දොසස්ස, ද්වෙෂයට; අධිවචනං, විශිෂ්ට නාමයකි; විගතරජස්ස, පහවූ ද්වෙෂරජස්ඇති තථාගතයානන්ගේ; සාසනෙ, සස්නෙහි; තෙ භික්ඛවො, ඒ මහණහුතුම්; එතං රජං, මේ ද්වෙෂරජස; විප්පජහිත්වා, බැහැරකොට; විහරන්ති, වෙසෙත්.

---

[†] අවීතො (අවිගතො) ගන්ධො යස්මා තං අවීතගන්ධං. [§] විගතො රජො යස්මා යස්ස වා සො විගතරජො; තස්ස.

99 මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජො'ති,
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

99 මොහො, මොහයතෙම; රජො, රජස්නම්; රෙණු, ධූලි; නච පන වුච්චති, (මෙහි) නොකියනුලැබේ; රජො ඉති එතං, රජස් යන මේය; මොහස්ස, මොහයට; අධිවචනං, විශිෂ්ටනාමයයි; විගතරජස්ස, පහවූ මොහරජස්ඇති තථාගතයානන්ගෙ; සාසනෙ, සස්නෙහි; තෙ භික්ඛවො, ඒ භික්ෂූහු; එතං රජං, මේ මොහරජස; විප්පජහිත්වා, විශෙෂයෙන් බැහැරකොට; විහරන්ති, (සස්නෙහි සිත්අලවා) වාසයකරත්.

100 සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිණිත්වාන පන්ථකො,
නිසීදම්බවනෙ රම්මෙ යාව කාලප්පවෙදනා.

100 පන්ථකො, චූලපන්ථකස්ථවිරතෙම; සහස්සක්ඛත්තුං, දහස්වරක්; අත්තානං, ආත්මභාවය; නිම්මිණිත්වාන, නිර්මාණයකොට; (හෙවත් තමන්වැනි භික්ෂූන්දහසක් මවා); යාව කාලප්පවෙදනා, කල්දැන්වීමදක්වා; රම්මෙ, රම්‍යවූ; මනොහරවූ; අම්බවනෙ, අඹඋයනෙහි; නිසීදි, වැඩහුන් සේක.

101 අප්පකෙන'පි මෙධාවී පාභතෙන විචක්ඛණො,
සමුට්ඨාපෙති අත්තානං අණුං අග්ගිංව සන්ධමං.

101 මෙධාවී, පියවිපැණවත්; විචක්ඛණො, විචක්ෂණතෙම; අප්පකෙන අපි, ස්වල්පවූද; පාභතෙන, බඩුමුදලකින්; අණුං අග්ගිං, මදගින්නක්; සන්ධමං ඉව, පිඹින්නාක්හු (මොලවන්නාක්හු) මෙන්; අත්තානං, තමන්; සමුට්ඨාපෙති, (ඉසුරුමත්බවට) නගයි; (පමුණුවයි).

චූලපන්ථකවත්ථු.

---

102 මාතාපෙත්තිභරං ජන්තුං t කුලෙජෙට්ඨාපචායිනං,
සණ්හං u සඛිලසම්භාසං v පෙසුණෙය්‍යප්පහායිනං.

103 මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං,
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉති.

---

t කුලෙ ජෙට්ඨෙ අපචායති සීලෙනා'ති කුලෙජෙට්ඨාපචායී; තං. "කුලෙ ජෙට්ඨෙ" ඉති අලුත්තසමාසො. u සඛිලා සම්භාසා යස්ස සො සඛිලසම්භාසො; තං. v පිසුනානමිදං පෙසුණෙය්‍යං, තං පහායති සීලෙනා'ති පෙසුණෙය්‍යප්පහායී; තං.

102-103 මාතාපෙත්තිභරං, මවුපියන් පූස්නාවූ; කුලෙජෙට්ඨාපචායිනං, කුලදෙටුවන් පුදන්නාවූ; සණ්හං, මටසිලුටු තෙපුල් ඇත්තාවූ; සඛිලසම්භාසං, (ප්‍රේමඇතුලත්) සෞහෘදසම්භාෂණ ඇත්තාවූ; පෙසුනෙය්‍යප්පහායිනං, පිසුනබස් බැහැරකරණසුලු (නොබණනසුලු)වූ; මච්ඡෙරවිනයෙ, මසුරුමල හැරපීමෙහි; යුත්තං, යෙදුනාවූ; සච්චං, සත්‍යවචන ඇත්තාවූ; කොධාභිභුං, ක්‍රොධය මැඩපවත්වනසුලුවූ; තං නරං ජන්තුං, ඒ මනුෂ්‍යජනයා; (මෙකී සප්ත ව්‍රතපදයෙන් යුක්තවූමනුෂ්‍යයා); වෙ, එකාන්තයෙන්; සප්පුරිසො ඉති, සත්පුරුෂයයි; තාවතිංසා දෙවා, තව්තිසාවැසිදෙවියෝ; ආහු, කීහු.

මහාලිපඤ්හවත්ථු.

---

104 සන්ති රුක්ඛා [a] හරිතපත්තා දුමා [b] නෙකඵලා බහූ,
කස්මා නු සුක්ඛෙ කොළාපෙ සුවස්ස නිරතො මනො.

104 හරිතපත්තා, නීලපත්‍රවර්ණනවූ; (අමුවූ කොල ඇත්තාවූ); අනෙකඵලා, නොයෙක් පල ඇත්තාවූ; දුමා, ද්‍රැමසංඛ්‍යාතවූ; බහුරුක්ඛා, බොහෝවෘක්ෂයෙ ; සන්ති, විද්‍යමානවෙත්; සුවස්ස, (ආයුෂ්මත්) කීරයා (ගිරවා) ගේ; මනො, සිත; සුක්ඛෙ, ශුෂ්කවූ; කොළාපෙ, කොළපුවෙක්හි (කිරිගණියනැති දිඹුල්කඳෙක්හි); කස්මා, කවරහෙයකින්; නිරතො නු, ඇලුනේද.

නිගමවාසිතිස්සත්ථෙරවත්ථු.

දුතියො වග්ගො.

---

105 න තං ජිතං සාධුජිතං යං ජිතං අවජීයති,
තං ඛො ජිතං සාධුජිතං යං ජිතං නාවජීයති.

105 ජිතං, දිනනලද; යං, යම්රටක්; අවජීයති, (සතුරන්විසින්) නැවත පරදවාගන්නුලැබේද; නොහොත්–යං ජිතං,(සතුරන්මැඩලබනලද) යම්ජයක්; අවජීයති, (සතුරන්විසින්) පරදවනුලැබේද; තං ජිතං, ඒ දිනුම; සාධුජිතං න, සාධුජිතනම්නොවේ; (මොනවට දිනනලද්දේ නොවේ); ජිතං, (සතුරන් අභිභවා) දිනනලද, යං, යමක්; නොහොත්–යං ජිතං, යම්ජයෙක්; න අවජීයති, (සතුරන්විසින්) නොපරදවනුලැබේද; තං ඛො ජිතං, ඒ දිනුමවනාහි; සාධුජිතං, සාධුජිතනම්වේ.

චිත්තහත්ථත්ථෙරවත්ථු.

තතියො වග්ගො.

---

[a] හරිතානි(නීලවණ්ණානි) පත්තානි යෙසං තෙ හරිතපත්තා.

[b] න එකානි අනෙකානි, අනෙකානි ඵලානි යෙසං තෙ අනෙකඵලා.

106 මනුස්සින්දං ජහිත්වාන c සබ්බකාම සමිද්ධිනං,
කථන්නු භගවා කෙසී කප්පස්ස රමති අස්සමෙ.

106 භගවා, භාග්‍යවතුන්වහන්ස; නොහොත්- භාග්‍යවත්වූ; කෙසී, කෙසව තපස්වීතෙම; සබ්බකාමසමිද්ධිනං, සමෘද්ධවූ සියලු කාමසමපත් ඇත්තාවූ; (හෙවත් සියලු උපභොග පරිභොගවස්තුවලින් සමෘද්ධවූ); මනුස්සින්දං, නරශ්‍රෙෂ්ඨවූ බරණැස්රජුන්; ජහිත්වාන, හැර; කප්පස්ස, කප්පනම්වූ (අතවැසි) තවුසාගේ; අස්සමෙ, අසපුවෙහි; කථන්නු, කෙසේනම්; රමති, ඇලේද; හෙවත්–සිත්අලවා වෙසේද.

107 සාධූනි රමණීයානි සන්ති රුක්ඛා මනොරමා,
සුභාසිතානි කප්පස්ස නාරද රමයන්ති මං.

107 නාරද, නාරදය, කප්පස්ස, කප්පනම්තපස්වීන්ගේ; සාධූනි, මධුරවූ; රමණීයානි, සිත්කලුවූ, සුභාසිතානි, (ධර්මොපසංහිත) සුභාෂිතයෝද; මනොරමා, මනොරම්‍යවූ; රුක්ඛා, වෘක්ෂයෝද; සන්ති, විද්‍යමානවෙත්; (ඔහුතුමූ); මං, මා; රමයන්ති, සිත්අලවත්; (පිණවත්).

108 සාලීනං ඔදනං භුත්වා සුචිං මංසූපසෙචනං,
කථං සාමාකනීවාරං අලොණං * ඡාදයන්ති තං.

108 සුචිං, පිරිසිදුවූ; මංසූපසෙචනං, මාංස උපසෙචනකොට ඇති: හෙවත්-මස්හවුලෙන් යුක්තවූ; සාලීනං ඔදනං, හැල්බත; භුත්වා, වළඳ (වුසු); තං, ඔබ; අලොණං, ලුණුනැති; සාමාකනීවාරං, බොධන මුහා හුරුහැල් (බත්); කථං, කෙසේ, ඡාදයති, රුස්වාද (පිණවාද?).

109 අසාධුං යදිවා සාධුං අප්පං වා යදි වා බහුං,
විස්සත්ථො යත්ථ භුඤ්ජෙය්‍ය විස්සාසපරමා රසා.

109 යත්ථ, යම්තැනෙක්හි, විස්සත්ථො, (නිරාශඞ්කව) විශ්වාසයට පැමිණියේ; අසාධුං, අමධුරවූහෝ; යදිවා, නොහොත්; සාධුං, මධුරවූහෝ අප්පංවා, ස්වල්පවූහෝ; යදිවා, නොහොත්; බහුං, බොහෝවූහෝ; (භොජනයක්); භුඤ්ජෙය්‍ය, අනුභවකරන්නේද; (එහි ඒ බොජුන් මිහිරිහාබොහොම්යි); කුමක්හෙයින්දයත්? රසා, රසයෝ; විස්සාසපරමා, විශ්වාසය උතුම්කොට ඇත්තාහ.

ඛුද්ධබ්භ වණ්ණ.

---

c සබ්බෙ ච තෙ කාමා චේ'ති සබ්බකාමා; සබ්බකාමෙහි සමිද්ධී සබ්බකාමසමිද්ධි, තං.

---

* "ඡාදයන්ති"ඉච්චනං නිග්ගහීතා ගමෙන වුත්තං.

110 උභො බජා උභො කුණී උභො විසමචක්ඛුලා,
උභින්නං පිළකා ජාතා නාහං පස්සාමි ඉලලිසං.

110 උභො, දෙදෙනම; බජා, කොටපා ඇත්තෝය; (කොරැය); උභො, දෙදෙනම; කුණී, වක්වූ අත්පාඇත්තෝය; උභො, දෙදෙනම; විසමචක්ඛුලා, නොසමවූ ඇස්මඬුලු ඇත්තෝය; (වමරැසියහ); උභින්නං, දෙදෙනාගේම; (හිස්පෙදෙස්හි); පිළකා, එකාකාර පිළිකාවෝ; ජාතා, හටගත්හ; අහං, මම; ඉලලීසං, ඉලලීසයන්; න පස්සාමි, නොදකිමි; නොහොත්-නොහඳුනමි.

### මච්ඡරියකොසියසෙට්ඨිවත්ථු.

---

111 සොහං අජ්ජ පජානාමි යත්ථ දින්නං මහප්ඵලං,
අත්ථාය වත මෙ භද්දා සුණිසා ඝරමාගතා.

111 යත්ථ, යම්කෙණෙකුට; (නොහොත්-යම්කෙතෙක්හි); දින්නං, දෙනලද්දද; මහප්ඵලං, මහත්ඵලවත්වේද; (ඒ කෙත); සො අහං, ඒ මම; අජ්ජ, අද; පජානාමි, ප්‍රකාරයෙන්ම දනිමි; වත, එකාන්තයෙන්; මෙ, මට; අත්ථාය, අභිපිණිස; භද්දා, සොඳුරුවූ; සුණිසා, යෙහෙළිතොමෝ; ඝරං, මාගේතුළට; ආගතා, ආවාය.

112 කදාහං පාසාදං රම්මං a සුධාමත්තිකලෙපනං,
b විහාරදානං දස්සාමි සඞ්කප්පො මය්හ පූරිතො.

112 අහං, මම; රම්මං, රම්‍යවූ; සුධාමත්තිකලෙපනං, සුණුමැටි අලෙවුන්කොටඇති; පාසාදං, පහයක්; විහාරදානං, විහාරදානයක් කොට; කදා, කවරකලෙක්හි; දස්සාමි (ඉති), දෙන්නෙම්ද යන; මය්හං, මාගේ; සඞ්කප්පො, සඞ්කල්පය; (අදහස); (ඉදනි, දැන්); පූරිතො, පිරුණේය.

113 කදාහං c මඤ්චපීඨං ච d භිසිබිම්බොහනානි ච,
c සෙනාසනභණ්ඩං දස්සාමි සඞ්කප්පො මය්හ පූරිතො.

113 අහං, මම; මඤ්චපීඨං, ඇඳපුටුද; භිසිබිම්බොහනානි ච, බිසිහා කොට්ටද යන; සෙනාසනභණ්ඩං, සෙනසුන් බඩු; (උපකරණ); කදා,

---

a සුධා ච මත්තිකා ච සුධාමත්තිකං, තං තෙනවා ලෙපනං එතස්සා'ති සුධාමත්තිකලෙපනො; තං. b විහාරො එව දානං (විහාරස්ස දානංවා) විහාරදානං, තං. c මඤ්චො ච පීඨං ච මඤ්චපීඨං; තං. d භිසි ච බිම්බොහනං ච භිසිබිම්බොහනානි. e සෙනං ච ආසනං ච සෙනාසනං-සෙනාසනානං (සෙනාසනත්ථාය පවත්තානංවා) භණ්ඩං සෙනාසනභණ්ඩං; තං.

කවරකලෙක; දස්සාමි (ඉති), දෙන්නෙමිදයන; මය්හං. මාගේ; සබ්බ පෙපා, සබ්බලපනාව; පූරිතො, (දූන්) පිරුණේය.

114 කදහං f සලාකභත්තං සුචිං g මංසූපසෙචනං,
හොජනදනං දස්සාමි සබ්බපෙපා මය්හ පූරිතො.

114 අහං, මම; සුචිං, පිරිසිදුවූ; මංසූපසෙචනං, මසවුලුඇති; සලාකභත්තං, ලාබත්; හොජනදනං, හොජන(පිණ්ඩපාත) දනකොට; කද, කවරකලෙක; දස්සාමි (ඉති), දෙන්නෙමිදයන; මය්හං, මාගේ; සබ්බපෙපා, සබ්බලපය; පූරිතො, (දූන්) පිරුණේය.

115 කදහං කාසිකං වත්ථං h බොමකපපාසිකානි ච,
චීවරදනං දස්සාමි සබ්බපෙපා මය්හ පූරිතො.

115 අහං, මම; කාසිකං වත්ථං, කසීවත්ද; බොමකපපාසිකානි ච, කොමුහා කපුපිළිද; චීවරදනං, සිවුරුදන්කොට; කද, කවරකලෙක්හි; දස්සාමි(ඉති), දෙන්නෙමිදයන; මය්හං, මාගේ; සබ්බපෙපා, සබ්බලපය, පූරිතො, (දූන්) පිරුණේය.

116 කදහං සප්පිනවනීතං මධුතෙලං ච ඵාණිතං,
හෙසජ්ජදනං දස්සාමි සබ්බපෙපා මය්හ පූරිතො.

116 අහං, මම; සප්පිනවනීතං, ගිතෙල්හා වෙඬරුද; මධුතෙලං ච, මිහා තලතෙල්ද; ඵාණිතං, පැණි (උක්සකුරු)ද යනමොවුන්; හෙසජ්ජදනං, හෛෂජ්‍යදනයක්කොට, කද, කවරකලෙක්හි; දස්සාමි(ඉති), දෙන්නෙමිදයන; මය්හං, මාගේ; සබ්බපෙපා, සලපනාව; පූරිතො, දූන් පිරුණේය.

## විසාඛාවත්‍ථු.

117 පිණ්ඩපාතිකස්ස භික්ඛුනො
i අත්තභරස්ස j අනඤ්ඤපොසිනො,
දෙවා පිහයන්ති තාදිනො
උපසන්තස්ස සද සතීමතො.

117 අත්තභරස්ස, තුමාපුස්නාවූ; අනඤ්ඤපොසිනො, මෙරමා නොපුස්නාවූ; තාදිනො, තාදීගුණවත්වූ; උපසන්තස්ස, උපශාන්තවූ;

f සලාකං පාතෙත්වා ගහෙතබ්බං භත්තං සලාකභත්තං, තං. g මංසං උපසෙචනං එතස්සා'නි මංසූපසෙචනං, මංසෙහි (සම්පාදිතං) උපසෙචනංවා; තං. h බොමච කපපාසිකං ච බොමකපපාසිකානි; තානි. i අත්තානං භරති පොසෙති'ති අත්තාභරො; තස්ස. j න අඤ්ඤං පොසෙති සීලෙනා'ති අනඤ්ඤපොසි; තස්ස.

(හෙවත්-උපසමිතඉඳුරන්හා කෙලෙස් ඇත්තාවූ); සදා, හැමකල්හි, සතිමනො,සමෘතිමත්වූ, පිණ්ඩපාතිකස්ස භික්ඛුනො, පිණ්ඩපාතිකභික්ෂුහට; දෙවා, දෙවියෝ; පිහයන්ති, කැමැතිවෙත්.

**මහාකස්සපත්ථෙරවත්ථු.**

---

118 මහාවීර මහාපඤ්ඤ ඉද්ධියා යසසා ජලං,
k සබ්බවෙරභයාතීත පාදෙ වන්දාමි චක්ඛුම.

118 මහාවීර, මහාවීරයන්වහන්ස; මහාපඤ්ඤ, මහාප්‍රාඥයන්වහන්ස; ඉද්ධියා යසසා ජලං, සෘද්ධියෙන්හා පිරිවරින් බබලන්නවුන්වහන්ස; සබ්බවෙරභයාතීත, හැමවෛර හැමබිය ඉක්මපැවැත්තවුන්වහන්ස; චක්ඛුම, පසැස්ඇතියන්වහන්ස; පාදෙ, (මුඹවහන්සේගේ) සිරිපා; වන්දාමි, (මම) වඳිමි.

119 සාවකො තෙ මහාවීර මරණං l මරණාභිභූ,
ආකඞ්ඛති චෙතයති තං නිසෙධ ජුතින්ධර.

119 මරණාභිභූ, මරණාභිභවනයකරණසුලුවූවන්වහන්ස; මහාවීර, මහාවීරයන්වහන්ස; තෙ, ශුෂ්මතුන්වහන්සේගේ; සාවකො, ශ්‍රාවකයෙක්තෙම; මරණං, මරණය; ආකඞ්ඛති, ආකාඞ්ක්ෂාකරයි; චෙතයති, සිතයි; ජුතින්ධර, ඥානද්‍යුති ශරීරද්‍යුතින්ධරයන්වහන්ස; තං, එය; නිසෙධ, වැළකුවමැනව.

120 කථං හි භගවා තුය්හං සාවකො සාසනෙ රතො,
n අප්පත්තමානසො සෙඛො කාලං කයිරා ජනෙසුත.

120 භගවා, භාග්‍යවතුන්වහන්ස; ජනෙසුත, මහජනයාකෙරෙහි ප්‍රකටගුණඇතියන්වහන්ස; තුය්හං, නුඹවහන්සේගේ; සාසනෙ රතො, සසුන්හි ඇලුනාවූ; අප්පත්තමානසො, නොපැමිණිරහත්පල ඇති; සෙඛො, ශෛක්ෂයෙක්වූ; (හෙවත්-නොනිමිසිකඇති); සාවකො, ශ්‍රාවකතෙම; කථං, කෙසේ; කාලං කයිරා, කලුරියකරන්නේද.

121 එවමපි ධීරා කුබ්බන්ති නාවකඞ්ඛන්ති ජීවිතං,
m සමූලං තණ්හං අබ්බුය්හ ගොධිකො පරිනිබ්බුතො.

---

k වෙරානි ච භයානි ච වෙරභයානි, සබ්බානි ච තානි වෙරභයානි චා'ති සබ්බවෙරභයානි, තානි අතික්කමිත්වා ඉතො'ති සබ්බ-පෙ-තීතො; ''ස-පෙ-තීත''ඉති ආලපනමෙතං. l මරණං අභිභවතී'ති මරණාභිභූ. n (අසෙඛං) අප්පත්තං මානසං යස්ස සොයං අප්පත්තමානසො. m සහ මූලෙන යා වත්තතෙ සා සමූලා;තං. අථවා සමූලා ච සා තණ්හා චා'ති සමූලතණ්හා, තං.

121 ධීරා, ප්‍රඥවත්හු; නොහොත්-පරාක්‍රමඇත්තෝ; එවම්පි, මෙසේද; කුබ්බන්ති, කරත්; ජීවිතං, දිවි; නාවකඞ්ඛන්ති, නොපස සිත්; (ආකාඞ්ක්ෂානොකරත්); ගොධිකො, ගොධිකතෙම; සමූලං, අවිද්‍යාමූලසහිතවූ; තණ්හං, තෘෂ්ණාව; අබ්බුය්හ, උදුරා, පරිනිබ්බු තො, (කෙලශස්කන්ධ පරිනිර්වාණයෙන්) පිරිනිවියේය.

122 උද්ධං අධො ච තිරියං දිසාස්වනුදිසාස්වහං,
අන්වෙසං නාධිගච්ඡාමි ගොධිකො සො කුහිං ගතො.

122 සො අහං, ඒ මම; උද්ධං, උඩද; අධො ච, යටද, තිරියං, සර සද; දිසාසු, සතරදික්හිද; අනුදිසාසු, සතරඅනුදික්හිද; අන්වෙසං, සො යන්නෙම්; ගොධිකො, ඒ ගොධිකස්ථවිරතෙම; කුහිං ගතො (ඉති), කොයි ගියේදැයි; න අධිගච්ඡාමි, නොදනිමි; (නිශ්චයකට නොගි යෙමි).

123-124 සො ධීරො [o] ධිතිසම්පන්නො ඣායී [p] ඣානරතො සදා,
අහොරත්තං අනුයුඤ්ජං ජීවිතං අනිකාමයං.
ජෙත්වා නමුචිනො සෙනං අනාගන්ත්වා පුනබ්භවං,
සමූලං තණ්හං අබ්බුය්හ ගොධිකො පරිනිබ්බුතො.

123-124 ධීරො, ප්‍රඥවත්වූ; ධිතිසම්පන්නො, ධෘතිමත්වූ; ඣායී, (විවිධධ්‍යානයෙන්) ධ්‍යායීවූ; (ධ්‍යානකරණසුලුවූ); සදා, හැමකල්හි; ඣා නරතො, (ආරම්මණොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යානසඞ්ඛ්‍යාත) විප්‍ර කාරධ්‍යානයෙහි ඇලුනාවූ; අහොරත්තං, දිවාරෑදෙක්හි; ජීවිතං, දිවි; අනිකාමයං, නොපතමින්; අනුයුඤ්ජං, අනුයොගකරන්නාවූ; හෙවත් පිළිවෙත යෙදුනාවූ; සො ගොධිකො, ඒ ගොධිකතෙම; නමුචිනො සෙනං, මරසෙන්; හෙවත්-කෙලශසෙනාව; ජෙත්වා, දිනා; පුනබ්භවං, පුනර්භවයට; (පුනරුත්පත්තියට); අනාගන්ත්වා, නොපැමිණ; සමූලං, අවිද්‍යායයි කියනලද මූලසහිතවූ; තණ්හං, තෘෂ්ණාව; අබ්බුය්හ, උදුලා; පරිනිබ්බුතො, පිරිනිවියේය.

125 තස්ස සොකපරෙතස්ස වීණා කච්ඡා අභස්සථ,
තතො සො [P] දුම්මනො යක්ඛො තත්ථෙවන්තරධායථ.

125 සොකපරෙතස්ස, ශොකයෙන් මඩනාලද්දාවූ; තස්ස, ඒමාර යාගේ; කච්ඡා, කැසින්; වීණා, විණාව; අභස්සථ, ගිලිහී; තතො, එ හෙයින්; දුම්මනො, දුප්පත්සිත්ඇති; සො යක්ඛො, ඒ මාරයක්ෂතෙ ම; තත්ථ එව, එහිම; (නොහොත්-තත්ස්ථානස්ථයත්කෙරෙන්); අන්ත රධායථ, අතුරුදන්විය.

**ගොධිකත්ථෙරවත්ථු.**

---

o ධිතියා සම්පන්නො ධිතිසම්පන්නො. p ඣානෙ රතො ඣානරතො. d දුක්ඛං මනසි යස්ස සො දුම්මනො.

126 කාමං පතාමි නිරයං r උද්ධපාදො s අවංසිරො,
නානරියං කරිස්සාමි හන්ද පිණ්ඩං පටිග්ගහ.

126 උද්ධපාදො, උඩටලූපාඇත්තෙක්ව; අවං සිරො, යටටලූ හිස් ඇත්තෙක්ව; කාමං, එකාන්තයෙන්ම; නිරයං, අඞ්ගාරකාසුසඞ්ඛ්‍යාතනරකයෙහි; පතාමි, හෙමි; (එනකුදුවූවත්) අනරියං, අදුන අශීලාදී අනායඞීක්‍රියාවක්; න කරිස්සාමි, නොකරන්නෙමි; හන්ද, එබැවින්; පිණ්ඩං, බත්පිඩ; පටිග්ගහ, පිළිගණු.

ගරහදින්නවත්ථු.
චතුත්ථො වග්ගො.

---

127 දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්තෙ න දදම්හසෙ,
විජ්ජමානෙසු භොගෙසු දීපං නාකම්හ අත්තනො.

127 යෙ, යම්බඳුවූ අපි; සන්තෙ, (දෙයධර්මයන් හා ප්‍රතිග්‍රාහකයන්) විද්‍යමානකල්හිම; නදදම්හසෙ, දන්නුදුන්නෙමුද; (ඒඅපි) දුජ්ජීවිතං, (ත්‍රිවිධදුශ්චරිතයෙහි හැසිරීම්වශයෙන්) ලාමක ජීවිකාවෙන්; අජීවිම්හ, ජීවත්වීමු; භොගෙසු, සම්පත්තීන්; විජ්ජමානෙසු, විද්‍යමානකල්හි (එසින්); අත්තනො, තමහට; දීපං, ප්‍රතිෂ්ඨාවක්; න අකම්හ, නොකෙළෙමු.

128 සට්ඨිං වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

128 සබ්බසො, සර්වප්‍රකාරයෙන්; සට්ඨිං වස්සසහස්සානි, සැටදහස්හවුරුදු; පරිපුණ්ණානි, අනූනාධිකව පරිපූර්ණයහ; නිරයෙ, ලෝකුම්භිනිරයෙහි; පච්චමානානං, පැසෙන්නාවූ අපට; අන්තො, (මෙහි) කෙළවරක්; කදා, කවරකලෙක්හි; භවිස්සති, වන්නේද.

129 නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පතිදිස්සති,
තදා හි පකතං පාපං මම තුය්හං ච මාරිස.

129 මාරිස, නිදුකානෙනි; තදා, එකල්හි; හි, යම්හෙයකින්; මම, මාවිසින්ද; තුය්හං ච, තොපවිසින්ද; පාපං, පාපය; පකතං, බෙහෙවින් කරණලදද; (එහෙයින්); අන්තො, (මේදුඃඛයාගේ) කෙළවරක්; නත්ථි, නැත්තේය; අන්තො, දුක්කෙළවරක්; කුතො, කොසින්ද; නොහොත්-කුතො, කවරහෙයකින්; අන්තො, කෙළවරක් (පැණේද); අන්තො, දුක්කෙළවරක්; න පතිදිස්සති, (දකිනුකැමැති අපවිසින්) දක්නානොලැබේ.

---

r උද්ධංගතා පාදා යස්ස සො උද්ධපාදො; උද්ධපාද එතස්සා'ති වා.

s අවක්ඛිත්තං සිරං යස්ස සො අවංසිරො.

130 සො හි නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහුං.

130 සොහි, ඒ මමවනාහි; ඉතො, මෙයින්සැව; ගන්ත්වා, ගොස්; මානුසිං යොනිං, මිනිස්යොනිය; ලද්ධාන, ලැබ; (ලදින්); වදඤ්ඤූ, දන්පලකියනසුල්ලෙක්ව; සීලසම්පන්නො, සමෘද්ධශීලයෙක්ව; (සීලයෙන්යුක්තයෙක්ව); නූන, එකාන්තයෙන්; බහුං කුසලං, බොහෝ කුසල්; කාහාමි, කරන්නෙමි.

131 එකිස්සා කණ්ඩං ඡෙත්වාන ලොමගණනාය පච්චිසිං,
බහුන්නං කණ්ඩෙ ඡෙත්වාන කථං කාහසි ඛත්තිය.

131 එකිස්සා, එකඑඑදෙනෙකුගේ, කණ්ඩං, බොටුව; ඡෙත්වාන, සිඳ; ලොමගණනාය, (ඇගේ) ලොම්ගණනින්; පච්චිසිං, (නිරයෙහි) පැසුනෙමි; ඛත්තිය, ක්ෂත්‍රියයන්වහන්ස; බහුන්නං, බොහෝදෙනෙකුන්ගේ; කණ්ඩෙ, බොටු, ඡෙත්වා, සිඳ; කථං, කෙසේ; කාහසි, (විපාකානුභවය) කරන්නෙහිද.

132 එවං වෙ සත්තා ජානෙය්‍යුං දුක්ඛායං ජාතිසම්භවො,
න පාණො පාණිනං හඤ්ඤෙ පාණඝාතී හි සොචති.

132 අයං; මේ; ජාති, ඒඒතන්හි උත්පත්තියද; සම්භවො, (ඒඋපන්නාහුගේ අනුක්‍රමයෙන් වැඩීම්සඞ්ඛ්‍යාත) සම්භවයද; දුක්ඛො, (ජරාව්‍යාධි මරණ අප්‍රිය සම්ප්‍රයොග ප්‍රියවිප්‍රයොග හස්තපාදච්ඡෙදාදී දුඃඛයන්ට වස්තුහෙයින්) දුක්යයි; සත්තා, මේ සත්වයෝ; වෙ, ඉදින්; එවං, මෙසේ; ජානෙය්‍යුං, දන්නාහුනම්, පාණො, සත්වයෙක්; පාණිනං, අන්‍යසිප්‍රාණියෙකු; න හඤ්ඤෙ, නොනසන්නේය; හි, යම්හෙයකින්; පාණඝාතී, පරපණනසන සුලුතැනැත්තෝ; සොචති, (සතරඅපායෙහි මහදුක්විඳිමින් බොහෝකලක්) ශොකකරන්නේද; එහෙයිනි.

### කුමුදුප්පලානීත ද්‍රශශනවත්ථු.

---

133 මනුස්සස්සෙව තෙ සීසං හත්ථපාදා ච වානර,
අථ කෙන නු වණ්ණෙන අගාරං තෙ න විජ්ජති.

133 වානර, වානරය; තෙ, තාගේ; සීසං, හිසද; හත්ථපාදා ච, අත්පාද; මනුස්සස්ස ඉව, මිනිසෙකුගේමෙන්ය; අථ, එසේඇතිකල්හි; කෙන නු වණ්ණෙන, කවරහෙයකින්; තෙ, තට; අගාරං, නිවාස ගෘහයක්; න විජ්ජති, විද්‍යමාන නොවේද?.

134 මනුස්සස්සෙව මෙ සීසං හත්ථපාදා ච සිඞ්ගිල,
යාහු සෙට්ඨා මනුස්සෙසු සා මෙ පඤ්ඤා න විජ්ජති.

134 සිඞ්ගිල, සිඞ්ගිලය; (මලයනිපක්ෂිය); මෙ. මාගේ; සීසං, හිසද; හත්පාද ච, අත්පාද; මනුස්සස්ස ඉව, මිනිසෙකුගේමෙන්ය; (එතකුදු වුවත්); මනුස්සෙසු, මිනිසුන්කෙරෙහි; යා, යමක්; සෙට්ඨා, ශ්‍රේෂ්ඨයයි; ආහු, කියත්ද; සා පඤ්ඤා, ඒ විචාරණප්‍රඥතොමෝ; මෙ, මට; න විජ්ජති, නැත.

135 S අනවට්ඨිතචිත්තස්ස t ලහුචිත්තස්ස දූභිනො,
නිච්චං n අද්ධුවසීලස්ස සුඛභාවො න විජ්ජති.

135 අනවට්ඨිතචිත්තස්ස, අනවස්ථිතසිත්ඇත්තාවූ; ලහුචිත්තස්ස, (ක්ෂණක්ෂණයෙහි පෙරලෙන) ලුහුසිත්ඇත්තාවූ; දූභිනො, මිත්‍රද්‍රෝහී වූ, අද්ධුවසීලස්ස, අද්ධුවශීලීහට; (හෙවත්-හැමකල අච්ඡිද්‍රඅශබල අකල්මාසකොට නොරකිණ සිල්ඇත්තාහට;) නිච්චං, නිරන්තරයෙන්; සුඛභාවො; සුවබවක්; න විජ්ජති, නැත්තේය.

136 සො කරස්සානුභාවං තා වීතිවත්තස්සු සීලියං,
සීතවාතපරිත්තාණං කරස්සු කුටිකං කපි.

136 කපි, වානරය, සො, ඒ තෝ; ආනුභාවං, ප්‍රඥවඋපදවනුපිණිස උපායක්; කරස්සු, කරව; සීලියං, දෞශීල්‍යය; වීතිවත්තස්සු, දුරුකරව; (තමන්ගේ දුස්සීලභාවසඞ්ඛ්‍යාත සීලිය ඉක්මවා සිල්ඇත්තෙක් වෙවයි යුසේයි); සීතවාතපරිත්තාණං, ශීතවාතපරිත්‍රාණවූ (ශිතවාතයෙන් උපද්‍රැතනොවීමට පොහොනාවූ); කුටිකං, කැදූල්ලක්, කරස්සු, කරගණුව.

**මහාකස්සපත්ථෙරස්ස සද්ධිවිහාරිකවත්ථු.**

---

137 අජානානං ඛයං දිස්වා උපචිකානං ච ආචයං;
මධූනං ච සමාහාරං පණ්ඩිතො ඝරමාවසෙ.

137 අජානානං, අජනයන්ගේ; ඛයං, ක්ෂයවීමද; උපචිකානං, උපචිකාව (වේය) න්ගේ; ආචයං, (තුඩින්පස් රැස්කොට ඉදිකරණලද) තුඹසද; (නොහොත්-පස්රැස්කිරීමද); මධූනං සමාහාරං ච, මධුන්ගේ සමාහෘතියද; (රොන්උකහා කැටිකළමීද); දිස්වා, (තදනුමිතියෙන්) දැක; පණ්ඩිතො, පණ්ඩිතතෙම; ඝරං, ගිහිගෙයි; ආවසෙ, වසන්නේය.

**අනාථසෙට්ඨිවත්ථු.**

---

S අවට්ඨිතං චිත්තං අවට්ඨිතචිත්තං, නත්ථි අවට්ඨිතචිත්තං යස්ස සො අනවට්ඨිතචිත්තො; තස්ස. t ලහුං (ඛණෙ ඛණෙ උප්පජ්ජිත්වා පරිවත්තනත්ථං නිරුජ්ඣනකං) චිත්තං යස්ස සො ලහුචිත්තො; තස්ස. n ධුවං සීලං ධුවසීලං, නත්ථි ධුවසීලං යස්ස සො අද්ධුවසීලො; තස්ස.

138 a සද්ධාධනං සීලධනං b හිරිඔත්තප්පියං ධනං;
c සුතධනං ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

138 සද්ධාධනං, ශ්‍රද්ධාධනයද; සීලධනං, ශීලධනයද; හිරිඔත්තප්පියං ධනං,(පාපයෙහි ජුගුප්සාසවභාවසඞ්ඛ්‍යාත) හ්‍රීධනය හා (ත්‍රිවිධ දුශ්චරිතයෙහි උත්ත්‍රාස සවභාවසඞ්ඛ්‍යාත) ඔතප්දනයද; සුතධනං ච, ධර්මශ්‍රැතිධනයද; චාගො ච, (මාත්සය්‍ය්‍යප්‍රතිපක්‍ෂ)ත්‍යාගධනයද; (යන මේසයහා) මෙ, මට; සත්තමං ධනං, සත්වෙනි ධනයකොට; පඤ්ඤා, ප්‍රඥාදවෙත්,

139 යස්ස එතෙ ධනා අත්‍ථි ඉත්‍ථියා පුරිසස්ස වා,
d අදලිද්දො'ති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

139 එතෙ ධනා,මේ (යථොක්ත) සප්තධනයෝ; යස්ස, යම්බඳු වූ; ඉත්‍ථියා වා, ස්ත්‍රියකටහෝ; පුරිසස්ස වා, පුරුෂයෙකුටහෝ; අත්‍ථි, විද්‍යමානද; තං, ඒ (සප්ත විධධනවත්) පුද්ගලයා; අදලිද්දො ඉති, දිළිඳුනොවූවෙකැයි; ආහු, (බුද්ධාදී මහොත්තමයෝ) කීහු; තස්ස, ඔහු ගේ; ජීවිතං, ජීවිතප්‍රවෘත්තිය; අමොඝං, හිස්නොවූවකි

සුප්පබුද්ධකුෂ්ඨවත්‍ථු.

---

140 වාරි e පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො,
යො න ලිප්පති කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

140 පොක්ඛරපත්තෙ, පොකුරුපතෙහි, වාරි ඉව, (නොඇලෙන) දියබිඳුමෙන්ද; ආරග්ගෙ, හිදිඅග; සාසපො ඉව, (නොරඳන) සිදුහතුමෙන්ද; යො, යම්කිසි පුද්ගලයෙක්; කාමෙසු, වස්තුකාමක්ලෙශකාමයන්හි; න ලිප්පති, නොඇලේද; අහං, මම; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; බ්‍රාහ්මණං, (බාහිතපාපීබැවින්) බ්‍රාහ්මණයයි; බ්‍රෑමි, කියමි.

උප්පලවණ්ණාථෙරීවත්‍ථු.

---

141. පඤ්චයොජනිකා ජිව්හා සීසං තෙ නවයොජනං
කායො අච්චුග්ගතො තුය්හං f පඤ්චවීසතියොජනො
කිත්තු කම්මං කරිත්වාන පත්තොසි දුක්ඛමීදිසං.

---

a සද්ධා එව ධනං සද්ධාධනං b හිරි ච ඔත්තප්පං ච හිරිඔත්තප්පං තමෙව හිරිඔත්තප්පියං. c සුතමෙව ධනං සුතධනං. d න දලිද්දො, අදලිද්දො. e පොක්ඛරස්ස පත්තං පොක්ඛරපත්තං; තස්මිං. f පඤ්ච ච වීසතිච පඤ්චවීසති, පඤ්චවීසතී යෙව යොජනානි යස්ස සො පඤ්චවීසතියොජනො.

තෙ, තාගේ; ජිව්හා, දිව; පඤ්චයොජනිකා, පස්යොදුන් පමණඇත; සීසං, හිස; නවයොජනං, නවයොත්තක් ඇතිවේ; තුය්හං තාගේ; කායො, කය; අච්චුග්ගතො, ඉතාඋස්බවට ගියේ; පඤ්චවීසති යොජනො, පස්විසි යොදුනක් ඇතිවේ; කිංනුකම්මං, කිනම්කර්මයක්; කරිත්වාන, කොට; ඊදිසං දුක්ඛං, මේසා දුකකට; පත්තොඅසි, පැමිණියේ වෙහිද.

142 අහං භන්තෙ මොග්ගල්ලාන කස්සපස්ස මහෙසිනො,
සඞ්ඝස්ස අභිහටං භත්තං ආහාරෙසිං යදිච්ඡකං.

භන්තෙ මොග්ගල්ලාන, ස්වාමිනි මෞද්ගල්‍යායනයන්වහන්ස; අහං, මම, මහෙසිනො, මහර්ෂිවූ; කස්සපස්ස, කාශ්‍යපබුද්ධරජානන්වහන්සේගේ; සඞ්ඝස්ස, ශ්‍රාවකසඞ්ඝයාහට; අභිහටං, පිළියෙළකොට එළවූ; භත්තං, දන්බත්; යදිච්ඡකං, කැමැතිතාක්; ආහාරෙසිං, වැළඳුයෙමි.

**අඝිපෙත වත්ථු.**

---

143 g සට්ඨිකූටසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ තුය්හං නිපතන්ති වොභින්දන්තෙව මත්ථකං.

සබ්බසො, සර්වප්‍රකාරයෙන්; පරිපුණ්ණානි, (සඞ්ඛ්‍යාවෙන්හෝ ගිනිදැලින්) අනූනවූ; සට්ඨිකූටසහස්සානි, සැටදහසක්පමණයකුළු; තුය්හං සීසෙ, තාහිසපිට; නිපතන්ති, හෙත්; (ඔහුතුමූ); මත්ථකං, (තාගේ) මස්තකය; වොභින්දන්ති එව, ව්‍යාභෙදද කරත්. (බිඳිත්)

144 සාධු බො සිප්පකං නාම අපි යාදිසකීදිසං,
පස්ස h ඛජ්ජප්පහාරෙන ලද්ධා ගාමා i චතුද්දිසා.

144 යාදිසකිදිසං අපි, යම්කෙබඳුවූද; සිප්පකං නාම, ශිල්පනම් දෙයක්; සාධු බො, ප්‍රශස්තමය; ඛජ්ජ, පිළාගේ; පහාරෙන, අජලණ්ඩි ප්‍රහාරයෙන්;(නුගපත්හි දුන්හකුරුපහරින්); චතුද්දිසා, සිව්දිගුන්ඇති (නොහොත්–සිව්දික්හිවූ); ගාමා, ග්‍රාමයෝ; ලද්ධා, ලදහ; පස්ස, ඒ බැලූවමැනවි.

**සට්ඨිකූට පෙතවත්ථු.**

---

g කූටානං සහස්සානි කූටසහස්සානි, සට්ඨියා ගුණිතානි කූටසහස්සානි සට්ඨිකූටසහස්සානි. h ඛජ්ජස්ස පහාරො ඛජ්ජප්පහාරො; තෙන.
i චතස්සො දිසා යෙසං තෙ චතුද්දිසා.

145 සද්ධො සීලෙන සම්පන්නො J යසොභොගසමප්පිතො,
යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො.

145 සද්ධො, ලොවිලොවුතුරා සැදැහැයෙන් යුක්තවූ; සීලෙන සම්පන්නො, අගාරියසීලයෙන් සමන්විතවූ; යසොභොගසමප්පිතො, යසො, (අනාථපිණ්ඩිකාදීන්ගේ පිරිවරබඳු) අගාරියයසසින්ද; භොග, ධනධාන්‍යාදියෙන් හා ශ්‍රද්ධාදී සප්තාර්‍ය්‍යධනයෙන්ද; සමප්පිතො, යුක්තවූ කුලදරුතෙම; යං යං පදෙසං, (පැදුම්දික්ආදීන් අතුරෙන්) යම් යම් පෙදෙසක්; භජති, බෙජේද; තත්ථ තත්ථ එව, ඒ ඒ (ගියගිය) පෙදෙස්හිම; පූජිතො, (හෙතෙම දෙව්මිනිසුන් විසින්) පුදනලද්දේවේ.

සුධම්මත්ථෙර වත්ථු.

---

146 චතුසු සමුද්දෙසු ජලං පරිත්තකං
තතො බහුං අස්සු ජලං අනප්පකං,
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචනා
කිං කාරණා සම්ම තුවං පමජ්ජසි.

146 චතුසු සමුද්දෙසු, සිව්සයුරෙහි; ජලං, දිය; පරිත්තකං, ස්වල්පයි; දුක්ඛෙන, කායිකචෛතසික දුකින්; අනප්පකං, අනල්පකොට (බොහෝකොට), ඵුට්ඨස්ස, පහස්නාලද්දවූ; නරස්ස, මනුෂ්‍යයාගේ, සොචනා, ශොකකිරීම් හෙතුවෙන් (බට); අස්සුජලං, කඳුලුදිය; තතො, ඒ සිව්සයුරුදියටවඩා, බහුං; බොහෝයි; සම්ම, යහලුව; තුවං, තෝ; කිං කාරණා, කවරහෙයින්; පමජ්ජසි, පමාවෙහිද?

147 k උපසාළ්හකනාමානං සහස්සානි චතුද්දස,
අස්මිං පදෙසෙ දඩ්ඪානි නත්ථි ලොකෙ l අනාමතං.

147 උපසාළ්හකනාමානං, උපසාළ්හක යනනම් ඇත්තන්ගේ; චතුද්දස සහස්සානි, තුදුස් දහසක්; අස්මිං පදෙසෙ, මේපෙදෙස්හි; දඩ්ඪානි, දනලද්දාහ; ලොකෙ, ලෙව්හි; අනාමතං, අමෘතස්ථානයක්; (නොමළ විරුතැනක්); නත්ථි, නැත්තේය.

148 යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,
එතදරියා සෙවන්ති එතං ලොකෙ අනාමතං.

---

J යසො ච භොගො ච යසොභොගා, තෙහි සමප්පිතො යසොභොගසම්පප්පිතො. k උපසාළ්හකො ඉති නාමං යෙසං තෙ උප-පෙ-නාමා; තෙසං. l නත්ථි මතො යස්මිං තං අමතං, අනු අතිසයාදිතො අමතං අනාමතං, අථ වා; නත්ථි ආමතො යස්මිං තං අනාමතං.

148 යම්හි, යම්කිසි පුගුලෙක් කෙරෙහි; සච්චං ච, චතුස්සත්‍යච්ඡන්නකවූ පූර්වභාග සත්‍යඥානයද;ධම්මො ච,ලොකොත්තරධර්මයද; අහිංසා, මෙරමා නොවෙහෙසීමද; සඤ්ඤමො, ශීලසංයමයද; දමො, ඉන්ද්‍රියදමනයද; (යනමේ ගුණජාතය විද්‍යමානද); එතං, මේ ස්ථානය; (මෙබඳු පුද්ගලයා);අරියා, බුද්ධාදී ආර්‍යයෝ; සෙවන්ති, සෙවිත්; (බෙජෙත්); ලොකෙ, ලෙව්හි; එතං, මේගුණසමුදය හෝ නිවන්; අනාමතං, (අමෘතභාවසාධකහෙයින්) අමෘතස්ථාන නම්.

**වනවාසිතිස්සත්ථෙරවත්ථු.**

**පඨමො වග්ගො**

---

149 අලීනචිත්තං නිස්සාය පහට්ඨා මහතී චමූ,
කොසලං සෙනාසන්තුට්ඨං ජීවග්ගාහං අගාහයී.

149 අලීනචිත්තං, එනම් රාජකුමාරයා; නිස්සාය, ඇසුරුකොට; පහට්ඨා, (ප්‍රවෙණිරාජ්‍යය අපවිසින් දක්නාලද්දැයි) ප්‍රහර්ෂිතවූ; මහතී චමූ, මහත් සෙනාතොමෝ; සෙනා, ස්වකීයවූ සෙනාරාජ්‍යයට; අසන්තුට්ඨං, නොසතුටුවූ;(පරරාජ්‍ය ලොභයෙන්ආ);කොසලං, කොසොල්රජහු; ජීවග්ගාහං, ජීවග්‍රාහකොට; අගාහයී,(ඇතුලවා) ගැන්වූයේය.

150 එවං n නිස්සයසම්පන්නො භික්ඛු m ආරද්ධවීරියො,
භාවයං කුසලං ධම්මං P යොගක්ඛෙමස්ස පත්තියා;
පාපුණෙ අනුපුබ්බෙන s සබ්බසඤ්ඤොජනක්ඛයං.

150 එවං, මෙසේ; (අලීනචිත්තකුමාරයන් ඇසුරුකළ සෙනාගමෙන්); නිස්සය සම්පන්නො, කල්‍යාණමිත්‍රොපනිශ්‍රයෙන් යුක්තවූ;ආරද්ධවිරියො, චතුර්දෝෂාපගත ප්‍රාරබ්ධ වීර්‍යයඇති; භික්ඛු, පාරිශුද්ධ්‍යපෙක්ෂක යොගාවචර මහණතෙම; යොගක්ඛෙමස්ස, චතුර්විධයොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිර්වාණයට; පත්තියා, පැමිණීමපිණිස; කුසලං ධම්මං, නිරාමිෂසප්තත්‍රිංශත් බොධිපාක්ෂික ධර්මය; භාවයං, වඩමින්; අනුපුබ්බෙන, පිළිවෙළින්; සබ්බසඤ්ඤොජනක්ඛයං, සර්වසංයොජනක්ෂය සඞ්ඛ්‍යාත අර්හත්ඵලයට හෝ නිර්වාණයට; පාපුණෙ, පැමිණෙන්නේය.

**රාධත්ථෙරවත්ථු.**

---

n නිස්සයෙහි සම්පන්නො නිස්සයසම්පන්නො. m ආරද්ධං විරියං යෙන සො ආරද්ධවිරියො. p යොගෙහි ඛෙමො එත්ථාති යොගක්ඛෙමො; තස්ස. s සබ්බානි ච තානි සඤ්ඤොජනානි චාති සබ්බසඤ්ඤොජනානි, තෙසං ඛයො ස-පෙ-ක්ඛයො, යස්මිං තං වා; තං.

151 යත්ථේකො ලභතෙ බබ්බු දුතියො තත්ථ ජායති,
තතියො ච චතුත්ථො ච ඉදං තෙ [1] බබ්බුකාබිලං.

151 යත්ථ, යම්තැනෙක්හි; එකො බබ්බු, එක්බළලෙක්; ලභතෙ, (මීමස්ආදී කිසිගොදුරක්) ලබාද; තත්ථ, එතැන්හි; දුතියො, දෙවෙනි බළලෙක්ද; ජායති, උපදියි; තතියො ච, තෙවැනිබළලෙක්ද; චතුත්ථො ච, සතරවෙනිබළලෙක්ද; (උපදියි) තෙ, තීගේ; ඉදං, මේසඵටිකමයවූබිලය; බබ්බුකාබිලං, බබ්බුකාබිලනම්වේ;(නොහොත්) තෙ, තීගේ; ඉදං බබ්බුකාබිලං, මේ සඵටිකමය බිලයට (ලෙන්පැහැර ඒබළල්ලු සතරදෙනම ජීවිතක්ෂයටපැමිණියෝය.)

**කාණමාතුවත්ථු.**

---

152 වාලොදකං අප්පරසං නිහීනං
පීත්වා මදො ජායති ගද්‍රභානං,
ඉමං ච පීත්වාන රසං පණීතං
මදො න සඤ්ජායති සින්ධවානං.

152 අප්පරසං, ස්වල්පරසඇත්තාවූ; නොහොත්-රසනැති; නිහීනං, හීනරසඇතිහෙයින් නිහීනවූ; වාලොදකං, නියදවල්ලෙන් පෙරනු රසජලය; (හෙවත්-නියදකඩින් පෙරූ ඉතිරි මිදිසප දිය)පීත්වා, බී; ගද්‍රභානං, කොටලුවන්ට; මදො, මදය; ජායති, උපදියි; පණීතං,ප්‍රණීතවූ; ඉමං රසං, මේමිදිරසය; (අලුලරසමුද්‍රිකපානය); පීත්වාන, බී; සින්ධවානං, ශෛන්ධවයන්ට; මදො, මදය; න සඤ්ජායති, නොවඩතේය.

158 අප්පකම්පි පීත්වාන නිහීනජච්චා
සො මජ්ජතී තෙන ජනින්ද ඵුට්ඨො,
ධොරය්හසීලී ච කුලම්හි ජාතො
න මජ්ජතී අග්ගරසම්පි පීත්වා.

153 ජනින්ද, ජනශ්‍රෙෂ්ඨයන් වහන්ස; නිහීනජච්චා, ලාමක ජාතිඇත්තාවූ; තෙන, ඒ ලාමකජාතිබවයෙන්; ඵුට්ඨො-නොහොත් ඒස්වල්ප රසයෙන්; ඵුට්ඨො, පහස්නාලද්දාවූ; සො, හෙතෙම; අප්පකම්පි, ස්වල්පවූද; (මදරසඇතිමිදිහපදිය) පීත්වාන, බී; මජ්ජති, මත්වෙයි; ධොරය්හසීලී, ධුරවහනකාචාර ඇත්තාවූ; කුලම්හි ජාතො, උත්තමකුලයෙහි උපන්නාවූ; (ජාතිශෛන්ධව තෙම;) අග්ගරසං, අග්‍රවූ මිදිරසය; පීත්වා, පානයකොට; න මජ්ජති, මත්නොවෙයි.

**පඤ්චසත සිඛණ්ඩීනං වත්ථු**
**චතුත්ථො වග්ගො.**

---

[1] බබ්බුකානං බිලං බබ්බුකාබිලං, [2] (මකාචි) වාලෙහි (පරිස්සාවිතං) උදකං වාලොදකං; නං.

154 යොධ පුඤ්ඤං ච පාපං ච උභො සඞ්ගං උපච්චගා,
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

154 ඉධ, මේසත්වලොකයෙහි; යො, යම්පුද්ගලයෙක්; පුඤ්ඤං ච, පින්ද; පාපං ච, පව්ද; (යන) උභො, දෙකම; උපච්චගා, පහකොට දමාගියේද; සඞ්ගං, රාගාදී සප්තසඞ්ගය; උපච්චගා, ඉක්මගියේද; අසොකං, තෘෂ්ණාමූලකශොකාභාවයෙන් නිශ්ශොකවූ; විරජං, අභ්‍යන්තරයෙහි රාගාදී රජස් නැත්තාවූ; සුද්ධං, නිරුපක්ලෙශත්වයෙන් පරිශුද්ධවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං, (බාහිත පාපීහෙයින්) බ්‍රාහ්මණයයි; බ්‍රෑමි, කියමි.

**ඛදිරවනිය රෙවතත්ථෙරවත්ථු**
**ඡත්තාලීසමො වග්ගො.**

---

155 සුභාසිතං සුණිත්වාන නගරෙ චොරඝාතකො,
අනුලොමඛන්තිං ලද්ධාන මොදති තිදිවං ගතො.

155 නගරේ, නුවරෙහි; චොරඝාතකො, තම්බදාඨිකචොරඝාතකතෙම; සුභාසිතං, (සාරිපුත්‍රස්ථවිරයන්ගේ) සුභාෂිතය; සුණිත්වාන, අසා; අනුලොමඛන්තිං, (සොවාන්මගට පෙරටුවූ) අනුලොමක්ෂාන්තිය; ලද්ධාන, ලැබ; තිදිවං, දිව්‍යලොකයට; ගතො, (උත්පත්තිවශයෙන්), පැමිණියේ; මොදති, විපාකානුමොදනායෙන් සතුටුවෙයි.

**තම්බදාඨික චොරඝාතකවත්ථු.**

---

156 ඉමෙ † සුවණ්ණකෙයූරා සබ්බෙ වෙළුරියාමයා,
සබ්බං ච ගණ්හ භද්දන්තෙ මමං දාසිං ච සාවය.

156 ඉමෙ සබ්බෙ, මේසියල්ලෝ; සුවණ්ණකෙයූරා, ස්වර්ණමය බාහුමූලාභරණයහ; වෙළුරියමයා, (මේසියල්ලෝ) වෛදූර්‍ය්‍යමයහ; භද්දන්තෙ, පින්වත්ස්වාමිපුරුෂයන්වහන්ස; සබ්බං, මෙකීසියල්ල, ගණ්හ, ගණුව; මමං ච, මාද; දාසිං, ඔබ දාස්කොට; සාවය, අස්ව; (ගිවිස්ව.)

157 මා බාලෙ පරිදෙවෙසි ඛිප්පං බන්ධාහි භණ්ඩිකං,
න තුය්හං ජීවිතං අත්ථි සබ්බං ගණ්හාමි භණ්ඩිකං.

157 බාලෙ, තරුණිය; නොහොත්–අඥානතැනැත්තිය; මා පරිදෙවෙසි, විලාපනොකිය(නොහඬ); ඛිප්පං, වහා; භණ්ඩිකං, බඩුපොදිය;

---

† සුවණ්ණෙන කතා කෙයූරා සුවණ්ණකෙයූරා.

බන්ධාති, බඳු; තුය්හං, තීගේ; ජීවිතං, දිවි; නාපි, (දැ) නොමැත; සබ්බං භණ්ඩකං, තිසතු සියලුබඩු; ගණ්හාමි, ගණිමි.

158 න සො සබ්බෙසු ඨානෙසු පුරිසො හොති පණ්ඩිතො,
ඉත්ථී'පි පණ්ඩිතා හොති තත්ථ තත්ථ විචක්ඛණා.

158 සබ්බෙසු ඨානෙසු, හැමකාරණයන්හි; සො පුරිසො, ඒ මේ පුරුෂතෙම; පණ්ඩිතො න හොති, පණ්ඩිතනොවෙයි; තත්ථ තත්ථ, ඒ ඒ කරුණෙහි; ඉත්ථීපි, ස්ත්‍රීද; පණ්ඩිතා හොති, පණ්ඩිතවෙයි; විචක්ඛණා, විචක්ෂණවෙයි.

කුණ්ඩලකෙසිතෙරී වත්ථු.

---

159 [v] උස්සූරසෙය්‍යං ආලස්‍යං චණ්ඩික්කං දීඝසොත්තියං,
එකස්සද්ධානගමනං [v] පරදාරූපසෙවනං;
එතං බ්‍රාහ්මණ සෙවස්සු අනත්ථං තෙ භවිස්සති.

බ්‍රාහ්මණ, බමුණ; උස්සූරසෙය්‍යං, හිරුනැගෙනතාක් ශයනාවද; ආලස්‍යං, කෘත්‍යකර්මයන් යථාකාලයෙහි නොකිරීම්සඞ්ඛ්‍යාත ආලස්‍යයද; චණ්ඩික්කං, පරොස්බස් බණනබවයයි කියනලද සැඩබවද; දීඝසොත්තියං, දීර්ඝසූත්‍රතාවද; එකස්සද්ධානගමනං, එකලාවඅදන් මගයාමද; පරදාරූපසෙවනං, පරඹුන්සෙවීමද; (යන) එතං, මෙකීසියල්ල; සෙවස්සු, සෙවියෙහිනම්; තෙ, තට; අනත්ථං, අනර්ථම, භවිස්සති, වන්නේය.

අනත්ථ පුච්ඡක බ්‍රාහ්මණවත්ථු.

---

160 තාසො තෙ නත්ථි න භයං භීය්‍යො වණ්ණො පසීදති,
කස්මා න පරිදෙවෙසි එවරූපෙ මහබ්භයෙ.

160 තෙ, තට; තාසො, චිත්තත්‍රාසයක්; නත්ථි, නැත්තේය; භයං, බිය න, නැත්තේය, භීය්‍යො, බොහෝසේ; වණ්ණො, ඡවිවර්ණය; පසීදති, පහදියි; එවරූපෙ, මෙබඳුවූ; මහබ්භයෙ, මහත්භයජනක කාරණයක් උපන්කල්හි; කස්මා, කවරහෙයකින්, න පරිදෙවෙසි, විලාපනොකියන්නෙහිද.

161 නත්ථි චෙතසිකං දුක්ඛං අනපෙක්ඛස්ස ගාමණී
අතික්කන්තා භයං සබ්බං [w] ඛීණසඤ්ඤොජනො ඉසී.

---

[v] උස්සූරෙ සෙය්‍යං උස්සූරසෙය්‍යං [v] පරෙසං දාරා පරදාරා පරදාරානං උපසෙවනං පරදාරූපසෙවනං [w] ඛීණා සඤ්ඤොජනා යෙන යස්සවා සො ඛීණසඤ්ඤොජනො.

161 ගාමණී, ගම්මුදලිය; (ගණදෙටුව); අනපෙක්ඛස්ස, අත්බැඳීගි ආලයනැත්තාහට; චෙතසිකං දුක්ඛං, චෛතසිකදුඃඛයක්; නත්ථි, නැති; ඛීණසඤ්ඤොජනො, සුන්කල දශවිධසංයොජනයන් ඇත්තාවූ; ඉසී, ඍෂීතෙම; සබ්බං භයං, ආත්මානුවාදදී හැමබිය; අතික්කන්තො, ඉක්මගියේවෙයි.

162 ඛීණාසවස්ස භවනෙත්ති දිට්ඨා ධම්මා යථාතථං,
නිබ්භයං මරණං හොති y භාරවොරොපනා යථා.

162 ඛීණාසවස්ස, ක්ෂීණාශ්‍රවයන් විසින්; භවනෙත්ති, භවනෙත්තිසඞ්ඛ්‍යාතවූ උත්පත්තිමූලකතෘෂ්ණාවද; ධම්මා, දුඃඛාදිධර්මයෝද; යථාතථං, තත්වූපරිද්දෙන්; දිට්ඨා, දක්නාලද්දහ; භාරවොරොපනං යථා, හිසපිට තුබූබරබානාසෙයින්; මරණං, මරණය; නිබ්භයං හොති, නිර්භයවේ; (මරණයටභයනැත්තේවෙයි).

**සංකිච්චසාමණෙරවත්ථු.**

---

163 උභො පුත්තා කාලකතා පන්ථෙ මය්හං පතී මතො,
මාතා පිතා ච භාතා ච එකචිතකස්මිං ඩය්හරෙ.

163 පන්ථෙ, මගදී; මය්හං, මාගේ; පති, සැමිද, මතො, මෙළේය; උභො පුත්තා, දෙදරුද; කාලකතා, මළහ; මාතා ච, මව්ද; පිතා ච, පියාද; භාතා ච, භ්‍රාතෘද; එකචිතකස්මිං, එකසෑයෙහි; ඩය්හරෙ, දනුලබත්.

චතුසු සුමුද්දෙසු ජලං පරිත්තකං
තතො බහුං අස්සුජලං අනප්පකං,
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචනා
කිං කාරණා සම්ම තුවං පමජ්ජසි.

(146-අඞ්කය බලනු)

164 න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා.

164 අන්තකෙන, මරහුවිසින්; අධිපන්නස්ස, මඩනාලද පුද්ගලයාහට; තාණාය, ත්‍රාණභාවයපිණිස; (පිහිටපිණිස); පුත්තා, පුත්‍රකෙණෙක්ද; නසන්ති, නැත්තාහ; පිතා, පියතෙමේද; න, (රක්ෂාපිණිස) නොවන්නේය; අපි, වැලි; බන්ධවා අපි, ඥාතිසුහෘදකෙණෙක්ද; න, නොවන්නාහ; ඤාතීසු, නෑයන්කෙරෙහි; තාණතා, ත්‍රාණවයක්; නත්ථි, නැත්තේය.

---

y භාරානං වොරොපනං භාරවොරොපනං.

165 එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො,
නිබ්බාණගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ.

165 පණ්ඩිතො, පණ්ඩිතතෙම; එතං අත්ථවසං, (ඔවුනොවුන්ට ප්‍රතිෂ්ඨාවෙන්නට අසමර්ථභාවසඞ්ඛ්‍යාත) මේකාරණය; ඤත්වා, නුව නින්දූන; සීලසංවුතො, චතුපාරිශුද්ධිශීලයෙන් සංවෘතවූයේ; නිබ්බාණගමනං මග්ගං, නිර්වාණගමනසඞ්ඛ්‍යාත අෂ්ටාඞ්ගික මාර්ගය; ඛිප්පං එව, වහාම; විසොධයෙ, පිරිසිදුකරන්නේය.

පටාචාරථෙරීවත්ථු.

---

166 තං b පුත්තපසුසම්මත්තං c ඛ්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති.

166 පුත්තපසුසම්මත්තං, පුත්‍රයන්හා ගවමහිසාදී සිවුපාවුන්ගේ ආසක්තිකාමයෙන් මත්වූ; ඛ්‍යාසත්තමනසං, හිරණ්‍යසුවර්ණාදියෙහි හා රූපාදිපඤ්චකාමයෙහි විශේෂයෙන් ආශක්තසිත්ඇත්තාවූ; තං නරං, ඒ මිනිසා; සුත්තං ගාමං, නිද්‍රොපගතසත්වසමූදය; (හෙවත්–නිදන්නාවූ ගම්වැසිජනයා සමූදය කරා ගෙණයන්නාවූ); මහොඝො ඉව, මහොඝයක් (ගැඹුරුමහ වතුරක්) මෙන්; මච්චු, මෘත්‍යුතෙම; ආදාය, හැරගෙණ; ගච්ඡති, යයි.

කිසාගොතමීවත්ථු.

නවමො වග්ගො.

---

167 පච්චන්ති මුනිනො භත්තං ථොකථොකං කුලෙ කුලෙ,
පිණ්ඩිකාය චරිස්සාමි අත්ථි ජඞ්ඝාබලං මම.

167 මුනිනො, මුනිවූමට; කුලෙ කුලෙ, කුලයක් පාසා; ථොක ථොකං, මදමද කොට; (ටිකටික) භත්තං, බත්; පච්චන්ති, පිසනුලැබේ; පිණ්ඩිකාය, පිඬුපිණිස; චරිස්සාමි, හැසිරෙන්නෙමි; මම, මට; ජඞ්ඝාබලං, කෙඬාබලය; අත්ථි, ඇත්තේය.

මණිකාරකුලූපගතිස්ස ථෙරවත්ථු.

දසමො වග්ගො.

---

b පුත්තා ච පසවො ච පුත්තපසවො පුත්තපසූහි සම්මත්තො පුත්තපසුසම්මත්තො, තං. c විසෙසෙන ආසත්තං මානසං යස්ස සො ඛ්‍යාසත්තමනසො; තං.

168 a හිරිඔත්තප්ප සම්පන්නා b සුක්කධම්ම සමාහිතා
සන්තො c සප්පුරිසා ලොකෙ d දෙවධම්මා'ති වුච්චරෙ.

168 හිරිඔත්තප්පසම්පන්නා, කායදුශ්චරිතාදීන් සංකොචන සඞ්ඛ්‍යාත ලජ්ජාව ද කායදුශ්චරිතාදීන් භීතිසඞ්ඛ්‍යාත උද්වේගය ද යන ගුණවලයෙන් යුක්තවූ; සුක්කධම්මසමාහිතා, හිරිඔත්තප්පාදී චාතුර්භූමික ලෞකික ලෝකෝත්තර කුශලධර්මයෙන් යුක්තවූ; සන්තො, ශාන්තවූ කායකර්මාදියඇති; සප්පුරිසා, (කෘතඥතාදී ගුණවත්) සත්පුරුෂයෝ; ලොකෙ, සත්වලොකයෙහි; දෙවධම්මා ඉති, (සම්මුති උත්පත්ති විශුද්ධිසඞ්ඛ්‍යාත ත්‍රිවිධ) දෙවතාවන් සම්බන්ධධර්ම ඇත්තෝයයි; (හෙවත් මෙකී ගුණ දෙවතාවන් සම්බන්ධ ධර්මයයි); වුච්චරෙ, කියනුලැබෙත්.

**බහුභණ්ඩිකථෙරවස්තු.**

---

169 යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං,
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි.

169 තෙ, තට; පුබ්බෙ, පූර්වජන්මයෙහි; (අතීතභවයෙහි); යං, (අතීතසංස්කාරයන් නිසා උපන් ක්ලේශධර්මජාතයක්; (අතීතකර්මයක්) වේද; තං, එය; විසොසෙහි, වියලව, පච්ඡා, පසුව; (අනාගතබවෙහි) කිඤ්චනං, අනාගතසංස්කාරයන් නිසා උපදින රාගාදී කශ්චිත්ධර්මයක්; මාහු, නතමක්වන්නේද; මජ්ඣෙ, මධ්‍යයෙහි (වත්මන්බවෙහි); චෙ, ඉදින්; නො ගහෙස්සසි, (ප්‍රත්‍යුත්පන්නරූපාදී ධර්මයන්) නහමක් ගණිද; (එවං, එසේඇතිකල;) උපසන්තො, (කෙලෙස්ගිනි නිවීමෙන්) සන්හුන්ව (රාන්ව); චරිස්සසි, ඊර්යාපථපරිවරණය කරන්නෙහිය.

**සඟනති මහාථෙරවස්තු.**

---

ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු,
සබ්බෙ පූරෙන්තු සඞ්කප්පා චන්දො පණ්ණරසො යථා.
ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු,
සබ්බෙ පූරෙන්තු සඞ්කප්පා මණි ජොතිරසො යථා.

84—85 අඞ්කබලනු.

**සුඛ සාමණෙර වස්තු.**

**දසමො වග්ගො.**

---

a හිරි ච ඔත්තප්පං ච හිරිඔත්තප්පං තෙන සම්පන්නා. හිරිඔත්තප්පසම්පන්නා. b සුක්කං ධම්මං සුක්කධම්මං, තෙන සමාහිතා. සු-පෙ-හිතා. c සන්තො පුරිසො සප්පුරිසො, තෙ. d දෙවානං ධම්මා, තෙ යෙසං සන්ති වා, දෙවධම්මා.

170 අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං.

170 කොධං, ක්‍රොධීහු; අක්කොධෙන, අක්‍රොධයෙන්; (ක්‍රොධ නොකිරීමෙන්); ජිනෙ, දිනන්නේය; අසාධුං, අසත්පුරුෂයා; සාධුනා, සද්ගුණයෙන්; ජිනෙ, දිනන්නේය; කදරියං, තදමසුරා; දානෙන, වස්තුපරිත්‍යාගයෙන්; ජිනෙ, දිනන්නේය; අලිකවාදිනං, අසත්බස් බණන්නහු; සච්චෙන, සත්‍යවචනයෙන් (දිනන්නේයි).

### සිරිමාවත්ථු.

---

171 ආතුරං අසුචිං පූතිං පස්ස නන්ද සමුස්සයං,
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිපත්ථිතං.

171 නන්ද, රූපනන්දවෙනි; බාලානං, බාලයන්විසින්; අභිපත්ථිතං, ඉෂ්ටකොට පතනලද්දාවූ; ආතුරං, (ජරාව්‍යාධ්‍යාදීන් අනවරතයෙන්) ආතුරවූ; (උපද්‍රුතවූ); අසුචිං, අපවිත්‍රවූ; පූතිං, කුණුවූ; උග්ඝරන්තං; උඩුකුරුව අසුචි ඉතිරෙන්නාවූ; පග්ඝරන්තං, යටිකුරුව වගුරුවන්නාවූ; සමුස්සයං, (මේ) ශරීරය; පස්ස, බලව.

172 යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං,
ධාතුසො සුඤ්ඤතො පස්ස මා ලොකං පුනරාගමි;
භවෙ ඡන්දං විරාජෙත්වා උපසන්තො චරිස්සසි.

172 ඉදං, මේ නොමළ තරුණ සිරුර; යථා යම්සේද; (තාරුණ්‍යාරොග්‍යවර්ණසංස්ථානාදීන්යුක්තවසතරඉරියව් පවත්වන්නේද); එතං, තොලසිරුරද; තථා, එසේමය; එතං, තොලසිරුර; යථා, යම්සේද; ඉදං, මේ සිරුරත්; තථා, එසේමය; ධාතුසො, (මේසිරුර) ධාතුවශයෙනුත්; සුඤ්ඤතො, (ආත්මාදි) ශූන්‍යවශයෙනුත්; පස්ස, බලව; ලොකං, සංසාරයට; (ස්කන්ධොත්පත්තියට) පුන, නැවත; මා ආගමි, නොපැමිණෙව; භවෙ, කාමාදිභවෙහි; ඡන්දං, ඡන්දරාගය; විරාජෙත්වා, වැරදවා; (දුරුකොට); උපසන්තො, (කෙලෙස් සන්හිඳීමෙන්) සන්හුන්ව; චරිස්සසි, හැසිරෙන්නෙහිය.

### රූපනන්දා ථෙරිවත්ථු.

---

173 වෙ මෙ ගොණා මහාරාජ යෙහි ඛෙත්තං කසාමසෙ,
තෙසු එකො මතො දෙව දුතියං දෙහි ඛත්තිය.

173 මහාරාජ, මහරජානෙනි; යෙහි, යම්ගොණුන් කාරණකොටගෙණ; ඛෙත්තං, කෙත; කසාමසෙ, සාමුද; මෙ, මට; වෙ ගොණා,

(ඒ) ගොන්දෙදෙනෙක් (වූහ); දෙව, දෙවයන්වහන්ස; තෙසු, ඔවුන් අතුරෙන්; එකො, එකෙක්; මතො, මළේය; ඛත්තිය, ක්‍ෂත්‍රියයන්වහන්ස; දුතියං, දෙවැන්නෙකු; දෙහි, දුනමැනව.

174 වෙ මෙ ගොණා මහාරාජ යෙහි ඛෙත්තං කසාමසෙ,
තෙසු එකො මතො දෙව දුතියං ගණ්හ ඛත්තිය.

174 මහාරාජ, මහරජානන්වහන්ස; යෙහි, යම්වෘෂභයන්කරණකොටගෙණ; ඛෙත්තං, කෙත; කසාමසෙ, සීසාමුද; මෙ, මට; වෙ ගොණා,(ඒ) වෘෂභයෝ දෙදෙනෙක් ඇතිවූහ; දෙව, දෙවයන්වහන්ස; තෙසු, ඔවුන්අතුරෙන්; එකො, එක්ගොණෙක්; මතො, මළේය; ඛත්තිය, ක්‍ෂත්‍රියයන්වහන්ස; දුතියං, දෙවෙනිගොණු; ගණ්හ, ගණුව.

ලාළුදායී ථෙරවත්ථු.

ඒකාදසමො වග්ගො.

---

175 g අනුතීරචාරි නඞ්ගුට්ඨං සීසං h ගම්භීරචාරිනො,
අථායං මජ්ඣිමො ඛණ්ඩො ධම්මට්ඨස්ස භවිස්සති.

175 අනුතීරචාරි, තීරසමීපචාරීවූ (තෝ); නඞ්ගුට්ඨං, නගුට; (ගණුව); ගම්භීරචාරිනො, ගම්භීරචාරීහට; (ගැඹුරුදියෙහි හැසුරුණු තැනැත්තාහට); සීසං,හිසවේවා; අථ,වැලි; නොහොත්-අදව,(මේදෙකොටස ඉක්මවාසිටි); අයං මජ්ඣිමො ඛණ්ඩො, මේමධ්‍යමකොටස; ධම්මට්ඨස්ස, ධර්මස්ථ (විනිශ්චය ස්වාමිවූ) මට; භවිස්සති, වන්නේය.

උපනන්ද සක්‍යපුත්‍රවත්ථු.

---

176 අමාතාපිතරි සංවඩ්ඪො අනාචරියකුලෙ වසං,
නායං කාලං අකාලං වා අභිජානාති කුක්කුටො.

176 අමාතාපිතරි සංවඩ්ඪො, මව්පියන් වෙත (ඔවුන් ඔවාබස් ගෙණ) වැඩුනෙක්නොවූ; අනාචරියකුලෙ වසං, ආචාර්‍ය්‍යකුලයෙක්හි නොවිසූ; (ආචාර්‍ය්‍යශික්‍ෂාවන්නිසා නොවිසූ); අයං කුක්කුටො, මේ කුකුල්තෙම; කාලං, (නැඬුවමනා) කල්හෝ; අකාලං වා,නොහැඬුවමනාකල්හෝ; න අභිජානාති, නොදනියි.

පධානිකතිස්ස ථෙරවත්ථු.

---

g තීරස්ස සමීපං අනුතීරං,අනුතීරං චරතිසීලෙනා 'ති අනුතීරචාරි
h ගම්භීරං චරති සීලෙනා 'ති ගම්භීරචාරී; තස්ස.

177 නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ,
නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යං චෙ සාඛස්මිං ජීවිතං.

177 නිග්‍රොධමෙව, (පුතනෙපිහෝ අනිකෙක්හෝ තමහට වැඩ කැමැතිනම්) නිග්‍රොධමෘගරජයානන්ම; සෙවෙය්‍ය, භජනායකරන්නේය, සාඛං, සාඛමෘගයා; නඋපසංවසෙ, සෙවනයනොකරන්නේය; (ඔහු ඇසුරුකොට ජීවත්නොවන්නේය) නිග්‍රොධස්මිං, නිග්‍රොධමෘගරාජයන්වෙත; මතං, (වැදහෙව) මියයාම; සෙය්‍යො, උතුම්; සාඛස්මිං, ශාඛමෘගයා සමීපයෙහි; යං වෙ ජීවිතං, යම්ජීවත්වීමෙක් ඇද්ද; (ඒඋතුම් නොවේ.)

**කුමාරකස්සපත්ථෙරවත්ථු.**

සුකරං සාධුනා සාධු සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං පාපමරියෙහි දුක්කරං.

64–අඞ්කය බලනු.

**සඞ්ඝභෙද පරිසක්කනවත්ථු.**

178 ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා.

178 යථා, යම්සේ; ඵලං, ඵලයතෙම; වෙ, එකාන්තයෙන්; කදලිං, කෙහෙල; හන්ති, නසාද; ඵලං, ඵලයතෙම; වෙළුං, හුණ, (නසාද); ඵලං, ඵලයතෙම; නළං, බට; (නසාද); ගබ්භො, ගැබතෙම; අස්සතරිං, අශ්වතරී නසන්නේද (එසේ); සක්කාරො, සත්කාරයතෙම; කාපුරිසං, කුපුරිස්; හන්ති, නසයි.

**කාලත්ථෙර වත්ථු.**

**ද්වාදසමො වග්ගො.**

179 යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා.

179 යො, යම්කිසි පුහුලෙක්; පුබ්බෙ, පෙර; පමජ්ජිත්වා, (වත්පිළිවෙත් කිරීමෙන්හෝ සජ්ඣායනාදියෙන්හෝ) පමාවී; පච්ඡා, පසුව; නප්පමජ්ජති, (මාර්ගඵලසුවයෙන් දවස්යවමින්) පමානොවේද; සො, ඒ ක්ෂීණාශ්‍රවතෙම; අබ්භාමුත්තො, වලාපටලාදියෙන් මිදුනාවූ; චන්දිමා ඉව, චන්ද්‍රයා (ඔකාසලොකය බබුලුවන්නාක්) මෙන්; ඉමං ලොකං, මේස්කන්ධාදි ලොකය; පභාසෙති, (මාර්ගඥානාලොකයෙන්) බබුලුවයි.

**අඞ්ගුලිමාලත්ථෙරවත්ථු.**

180 නාදසා පරතො දෙසං අණුං ථූලානි සබ්බසො,
ඉස්සරො න පණ්ණයෙ දණ්ඩං සාමං අප්පටිවෙක්ඛිය.

180 ඉස්සරො, පෘථිවීශ්වරයෙක් තෙම; පරතො දෙසං, පරදෙස්; නාදසා, (සියැස්සයොමා) නොදුටු; (පරතො, මෙර මාකෙරෙහි); අණුං ථූලානි, කුදුමහත්වරද; සාමං, තෙමේ; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; අප්පටිවෙක්ඛිය, (පරාබස්පියා තමහට) පසක්නොකොට; දණ්ඩං, දඬුනය; න පණ්ණයෙ, නොපණවන්නේයි.

**විචමාණවිකා වතු.**

---

181 උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

181 උසභං, (භයත්‍රාසරහිත භාවයෙන්) වෘෂභාජානෙයයෙක්බඳුවූ; පවරං, (උත්තමාර්ථයෙන්) ප්‍රවරවූ; වීරං, (වීර්‍ය්‍යාන්විතබැවින්) වීරවූ; මහෙසිං, (මහත්වූ ශීලස්කන්ධාදීන් සෙවූහෙයින්) මහර්ෂිවූ; විජිතාවිනං, (තුන්මරුන්දිනූහෙයින්) විජිතාවිවූ; නහාතකං, (අර්හත්මාර්ගඥානජලයෙන් සෝදාහළ කෙලෙස්මල ඇතිහෙයින්) නෑවාවූ; බුද්ධං, චතුස්සත්‍යයන් දත්තාවූ; තං, ඒක්ෂීණාශ්‍රවයන්; අහං, මම; බ්‍රාහමණං, බ්‍රාහමණයයි; බ්‍රෑමි, කියමි.

**අසදිස දානවතු.**

**චුද්දසමො වග්ගො.**

---

රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති සහසානුපීළිතං,
මූළ්හස්ස හොති අවකඩ්ඪිතං පදං
විවත්තච්ඡද්දස්සිදම්දිසං පදං.

දිස්වාන තණ්හං අරතිං රගං ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං
පාදපි නං සම්ඵුසිතුං නඉච්ඡෙ.

86–87–අඞ්කබලනු.

මාරධීතරානං වතු.

---

182 යතො යතො ගරුං ධුරං යතො ගම්භීරවත්තනී,
තදස්සු කණ්හං යුඤ්ජන්ති ස්වාස්සු තං වහතෙ ධුරං.

182 යතො යතො, යම්යම් තැනෙක්හි; ධුරං, ධුරය; ගරුං, බර ද; (සෙසුනවයන්ට අදින්නට නොහැකිද); යතො, යම්තැනෙක්හි; ගම්භීරවත්තනී, (දියමඩ ආදියෙන්හා නොසමනොව ආදියෙන් ගැඹුරුබවට ගියාවූ) මංවේද; තද, එකල්හි; නොහොත්-එතන්හි; කණ්හං, කෘෂ්ණනම් වෘෂභයා; යුඤ්ජන්ති, යොදත්; සො, ඒ කෘෂ්ණාභිධෙය වෘෂභතෙම; තං ධුරං, ඒයුගධුරය; වහතෙ, උසුලයි. ("අස්සු"යනු නිපාතමාත්‍රයි.

183 මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචනං,
මනුඤ්ඤං භාසමානස්ස ගරුං භාරං උදද්ධරි;
ධනං ච නං අලබ්භෙසි තෙනචත්තමනො අහු.

183 මනුඤ්ඤං එව, (චතුදෝෂ විරහිත මධුර) මනොඥප්‍රිය වචනයක්ම; භාසෙය්‍ය, බණන්නේය; කුදාචනං, කිසිකලෙකත්; අමනුඤ්ඤං, නොකත්කලුබසක්; න, නොබණන්නේය; මනුඤ්ඤං, මනාතෙපුල්; (ප්‍රෙමාන්විතයකොට); භාසමානස්ස, බණනබමුණාගේ; ගරුං, (ශකටශත ප්‍රමාණශකටයන්) බරවූ; භාරං, මහාභාරය; උදද්ධරි, උදුලේය; (නැගීය) නං, ඒබමුණා; ධනං ච, මහත්ධනයද; අලබ්භෙසි, ලැබ්බවිය; තෙන, එහෙයින්; අත්තමනො ච අහු, සතුටුසිත් අත්තෝ දවී.

184 ගතො නු චිත්තකූටං වා කෙලාසං වා යුගන්ධරං,
න නො දක්ඛාම සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං.

184 චිත්තකූටං වා, සිත්‍රකූළපර්වතටහෝ; ගතො නු, වැඩියේද්ද; කෙලාසං වා, කෛලාසපර්වතයටහෝ; (වැඩියේද්ද); ලොකජෙට්ඨං, ලොකජ්‍යෙෂ්ඨවූ; නරාසභං, නරශ්‍රෙෂ්ඨවූ; සම්බුද්ධං, සම්බුද්ධයන්වහන්සේ; න නො දක්ඛාම, නොදක්මු. ("නො" යනුවචනාලඞ්කාරනිපාතපදයි.)

185 පවිවෙකරතො ධීරො නයිමං ලොකං පුනෙහිති,
න නො දක්ඛාම සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං.

185 ධීරො, ධෘතිසම්පන්නවූ; (සම්‍යක් සම්බුද්ධතෙම); පවිවෙකරතො, ප්‍රකෂ්ටවූ කායචිත්තවිවෙකයෙහි ඇලුනේය; (එහෙයින්); ඉමං ලොකං, මේසත්වලොකයට; පුන, නැවත; න එහිති, (උන්වහන්සේ) නොවඩින්නේය; ලොකජෙට්ඨං, ලොකජ්‍යෙෂ්ඨවූ; නරාසභං, නරශ්‍රෙෂ්ඨවූ;(සම්බුද්ධයන් වහන්සේ);න නො දක්ඛාම,නොදක්නෙමුමය.

186 තාවතිංසෙ යදා බුද්ධො සිලායං පණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තක මූලම්හි විහාසි පුරිසුත්තමො.

186 යදා, යම්කලෙක්හි; පුරිසුත්තමෝ, පුරුෂොත්තමවූ; සම්බුද්ධො, සර්වඥතෙම; තාවතිංසෙ, තව්තිසා දෙව්ලෙව්හි, පාරිච්ඡත්තකමූලසමිං, පරසතුරුකසමිපයෙහිවූ; පණ්ඩුකම්බලෙ සිලායං, පාණ්ඩුකම්බලශෛලාසනයෙහි; විහාසි, වැඩහුන්සේක්ද; (එකල්හි).

187 දසසු ලොකධාතුසු සන්නිපතිත්වාන දෙවතා,
පයිරුපාසන්ති සම්බුද්ධං වසන්තං නභමුද්ධනි.

187 දසසු ලොකධාතුසු, දශසහස්‍රීලොකධාතුන්හිවූ; දෙවතා, දෙව්යෝ; සන්නිපතිත්වාන, රැස්ව; නභමුද්ධනි, ආකාශමස්තකයෙහි; වසන්තං, වැඩවසන්නාවූ; සම්බුද්ධං, සම්බුද්ධයන්වහන්සේ; පයිරුපාසන්ති, පර්යුපාසනයකරත්.

188 න කොචි දෙවො වණ්ණෙන සම්බුද්ධස්ස විරොචති,
සබ්බෙ දෙවෙ අධිගය්හ සම්බුද්ධොව විරොචති.

188 කොචි දෙවො, කිසිදෙවියෙක්, සම්බුද්ධස්ස, සම්බුද්ධන්ගේ; වණ්ණෙන, ඡවිවර්ණය කරණකොටගෙණ; න විරොචති, නොබබලයි; සබ්බෙ දෙවෙ, හැමදෙවියන්; අධිගය්හ, මැඩ; (සිව්වණින් යටත්කොට); සම්බුද්ධො එව, සම්බුද්ධයන්වහන්සේම; විරොචති, බබලනසේක.

189 ඔලොකෙත්වාන සම්බුද්ධො අඞ්කුරං චාපි ඉන්දකං,
දක්ඛිණෙය්‍යපපභාවෙන්තො ඉදං වචනමබ්‍රවි.

189 සම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධතෙම; අඞ්කුරං ච, අඞ්කුරදිව්‍යපුත්‍රයාද; ඉන්දකං අපි, ඉන්දකනම් දිව්‍යපුත්‍රයාද; ඔලොකෙත්වාන, බලා; දක්ඛිණෙය්‍යං; දක්ෂිණීයවූ නිසි පුහුලන්, පභාවෙන්තො, වණ්ණනසේක්; ඉදං වචනං, මේ(මතුපළවන)බස්; අබ්‍රවී, වදාළසේක.

190 මහාදානං තයා දින්නං අඞ්කුර දීඝමන්තරෙ,
සුවිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකං.

190 අඞ්කුර, අඞ්කුරය; තයා, තාවිසින්; දීඝමන්තරෙ, දීර්ඝකාලයක් අතරෙහි; මහාදානං, මහදන්; දින්නං, දෙනලද්දේය; සුවිදූරෙ, ඉතාදුර; නිසින්නො අසි, හුන්නේවෙහිය; මම සන්තිකං, මාවෙතට; ආගච්ඡ, එව.

191 චොදිතො භාවිතත්තෙන අඞ්කුරො එතදබ්‍රවී,
කිං මය්හං තෙන දානෙන දක්ඛිණෙය්‍යෙන සුඤ්ඤකං.

191 භාවිතත්තෙන, භාවිතාත්මයන් (සර්වඥයන්) වහන්සේ විසින්; චොදිතො, මෙහෙයන ලද්දුවූ; අඞ්කුරො, අඞ්කුරදිව්‍යපුත්‍රතෙම; එතං, මෙවදන්; අබ්‍රවී, කීයේය; මය්හං, මාගේ; තෙන දානෙන, ඒදනින්; කිං, කවරප්‍රයෝජනද (එයවූකල්හි); දක්ඛිණෙය්‍යෙන, දක්ෂිණාර්හ (ප්‍රතිග්‍රාහක)යාගෙන්; සුඤ්ඤකං, හිස්වූවකි.

192 අයං සො ඉන්දකො යක්ඛො දජ්ජා දානං පරිත්තකං,
අතිරොචති අම්හෙහි චන්දො තාරාගණෙ යථා.

192 අයං ඉන්දකො යක්ඛො, මේ ඉන්ද්‍රකායක්ෂතෙම, හි, යම්හෙයකින් පරිත්තකං දානං, ස්වල්පමාත්‍රදානයක්; දජ්ජා, (දුන්නේද; (එහෙයින්); චන්දො, චන්ද්‍රතෙම; තාරාගණෙ; තාරකාසමූහයන් (ඉක්මවා); යථා, යම්සේ බබලාද; (එමෙන්) සො, හෙතෙම; අම්හෙ, අප ඉක්මවා; අතිරොචති, බබලයි.

193 උජ්ජඞ්ගලෙ යථා ඛෙත්තෙ බීජං බහුකම්පි රොපිතං,
න ඵලං විපුලං හොති නපි තොසෙති කස්සකං.

193 උජ්ජඞ්ගලෙ, රළු (පඊතකණ්ටකාදියෙන් නොසරු) වූ, ඛෙත්තෙ, කෙතෙක්හි; බහුකම්පි බීජං, බොහෝවූද බිජු; රොපිතං වපුළේ (නුමුත්); යථා, යම්සේ; ඵලං, ඵලය; න විපුලං හොති, විපුලනොවේද; යථා, යම්සේ; කස්සකං, ගොවියා; නපි තොසෙති, නොතොස්වාද;

194 යථාපි භද්දකෙ ඛෙත්තෙ බීජං අප්පම්පි රොපිතං,
සම්මාධාරං පවෙච්ඡන්තෙ ඵලං තොසෙති කස්සකං.

194 භද්දකෙ ඛෙත්තෙ, සරු කෙතෙහි; අප්පම්පි, ස්වල්පවූද; බීජං, බිජුවටක්; රොපිතං, වපුළේද; සම්මා මනාකොට; ධාරං පවෙච්ඡන්තෙ,(මේඝය) ධාරානුප්‍රවෙශ කරණකල්හි;(වස්නාකල්හි); ඵලං, ඵලයතෙම; කස්සකං, ගොවියා; යථාපි තොසෙති, යම්සේ සතොස්වාද;

195 තථෙව සීලවන්තෙසු ගුණවන්තෙසු තාදිසු,
අප්පකම්පි කතං කාරං පුඤ්ඤං හොති මහප්ඵලං.

195 තථෙව, යථොක්තාකාරයෙන්ම; (එපරිද්දෙන්ම); සීලවන්තෙසු, සිල්වත්වූ; ගුණවන්තෙසු, ගුණවත්වූ; තාදිසු, තාදීගුණවත් වූ; (දක්ෂිණාර්හයන් විෂයෙහි) කතං, කරණලද; අප්පකම්පි කාරං, අල්පවූද සත්කාරය; මහප්ඵලං, මහප්ඵලඇති; පුඤ්ඤං හොති, පුණ්‍යය වේ.

196 විචෙය්‍ය දානං දාතබ්බං යත්ථ දින්නං මහප්ඵලං,
විචෙය්‍ය දානං දත්වාන සග්ගං ගච්ඡන්ති දායකා.

196 යත්ථ, යම්තැනෙක්හි; නොහොත්-යම්තැනකට; දින්නං, දෙනලද දානය; මහප්ඵලං, විපුලඵලද; (එසේ) විචෙය්‍ය, සොයා; නොහොත්-දක්ෂිණීයන් නුවනින් පිරික්සාලා; දානං, දානය; දාතබ්බං, දියයුතුසි; දායකා, දායකයෝ; විචෙය්‍ය, සොයා; දානං දත්වාන, දන්දී; සග්ගං, ස්වර්ගයට; ගච්ඡන්ති, උත්පත්තිවශයෙන් යෙත්.

197 විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ.

197 විචෙය්‍ය, (දක්ෂිණාර්හයන්) පිරික්සා (සොයා); දානං, දන්දීම; සුගතප්පසත්ථං, සම්බුද්ධයන්වහන්සේ විසින් පසස්නාලද්දේය; ඉධ ජීවලොකෙ, මේසත්වලොකයෙහි; යෙ, යම්කෙණෙක්; දක්ඛිණෙය්‍යා, දක්ෂිණෙයෝවෙද්ද; එතෙසු, මොවුන්ට; දින්නානි, දෙනලද්දානයෝ; මහප්ඵලානි, මහත්ඵලඇත්තාහුවෙත්; සුඛෙත්තෙ, සොඳුරුසරුකෙතෙහි; වුත්තානි, වපුළාවූ; යථා බීජානි, බීජයන්මෙනි.

198 තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා,
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං.

198 ඛෙත්තානි, ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (මාරතෘණ ආදී) තණදොස්කොට ඇත්තාහුද; (එමෙන්) අයං පජා, මේ ප්‍රජාතොමෝ; රාගදොසා, රාදොස්කොට ඇත්තීය; තස්මා හි, එහෙයින්ම; වීතරාගෙසු, වීතරාගීක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද්දානය; මහප්ඵලං හොති, විපුලඵලඇතිවේ.

199 a තිණදොසානි ඛෙත්තානි b ඉච්ඡාදොසා අයං පජා,
තස්මා හි c විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං.

199 ඛෙත්තානි, ශාලික්ෂෙත්‍රාදී ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, තණදොස්කොට ඇත්තාහුද; (එමෙන්) අයං පජා, මේප්‍රජාතොමෝ; ඉච්ඡාදොසා, (අලබ්ධලාභයෙහි බලවත් ගෘද්ධතාසඞ්ඛ්‍යාත) ඊප්සාදෝෂකොට ඇත්තිය; තස්මා හි, එහෙයින්ම; විගතිච්ඡෙසු, පහකළ ඊප්සාඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද්දානය; මහප්ඵලං හොති, මහත්ඵලවත්වෙයි.

200 න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ නස්සුතො උද කස්සචි,
එවං වග්ගුවදො සත්ථා තුසිතා ගණිමා ගතො.

200 මෙ, මාවිසින්; ඉතො පුබ්බෙ, මින්පෙර; නදිට්ඨො, (මෙවැනි බුදුසපුවහායෙදුම්) නොදක්නාලද්; උද, යලි; කස්සචි, කාවක්හුවිසින් (කියනලද්දක්හුත්); නස්සුතො, නොඅසනලදි; එවං, මෙසේ; වග්ගුවදො, මියුරුතෙපුල්ඇති; ගණිමා, (අනෙකශ්‍රාවක) ගණයාඇති; සත්ථා,

---

a තිණානං දොසා තිණානි එව දොසා වා යෙසං තානි තිණදොසානි. b ඉච්ඡායෙව දොසො එතායා'ති ඉච්ඡාදොසා. c විගතා ඉච්ඡා එතෙසං එතෙහී'ති වා, විගතිච්ඡා; තෙසු.

ශාස්තෘන්වහන්සේ; තුසිතා, තුසිතනම් දෙව්නිකායෙන් (සැව); ආගතො, (පිළිසඳවිසින් මෙලොවට) ආසේක.

201 යෙ ච සඞ්ඛාතධම්මා සෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස.

201 මාරිස, නිදුකානෙනි (සර්වඥයන්වහන්ස); ඉධ, මේ (ඔබ) ශාසනයෙහි; යෙ ච, යම්කෙනෙක්; සඞ්ඛාතධම්මා සෙ, අනිත්‍යාදිවශයෙන් පරිවීමංසිත ධර්මඇත්තාහුද; හෙවත්-ඥාතතුලිතතීරිතසඞ්ඛ්‍යාත ධර්මඇත්තාහුද;(රහත්වෙත්ද); පුථූ, බොහෝවූ; යෙ ච සෙඛා, (ත්‍රිශික්ෂාවෙහි හික්මෙන්නාවූ) යම්සප්තවිධශෛක්ෂකෙනෙක්වෙද්ද; තෙසං, ඔවුන්ගේ; ඉරියං, ආචාරගොචරවිහාරප්‍රතිපත්තිසඞ්ඛ්‍යාත ප්‍රවෘත්තිය; මෙ, මාවිසින්; පුට්ඨො, විචාරණලද්ද, නිපකො, ප්‍රඥසම්පන්නවූ; හෙවත්-පණ්ඩිතවූ (බුද්ධවහන්සේ); පබ්‍රෑහි, විසඳුව දුළමැන.

202 ගඞ්ගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා ඛීයෙ ලක්ඛෙ න මම බුද්ධියා.

202 මම බුද්ධියා, මානුවනව; ලක්ඛෙ න, ලක්වීමෙන්; ගඞ්ගාය, එනම් ගඟෙහි; වාලුකා, වැලි; ඛීයෙ, ගෙවෙන්නිය; මහණ්ණවෙ, මහාර්ණවයෙහි; උදකං, වතුර; ඛීයෙ, ක්ෂීණවන්නේය; මහියා, පොළොවෙහි; මත්තිකා, මැටි, ඛීයෙ, ගෙවෙන්නීයි.

203 පරොසහස්සම්පි සමාගතානං
කන්දයන්තං තෙ වස්සසතං අපඤ්ඤා,
එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො
යො භාසිතස්ස විජානාති අත්ථං.

203 සමාගතානං, රැස්වූවවුන් සම්බන්ධිවූ; පරොසහස්සම්පි, දහසකට අධිකදවූ; අපඤ්ඤා, නොපැණැත්තාවූ; තෙ, ඔව්හු; වස්සසතං, අවුරුදු සියයක්මුළුල්ලෙහි; කන්දයන්තං, හඬන්නාහුද; යො, යමෙක්; භාසිතස්ස; කියනලද්දසම්බන්ධිවූ; අත්ථං, අර්ථය; විජානාති, දනීද; සපඤ්ඤො, සප්‍රාඥවූ; (සො) (පුරිසො, (ඒ) පුරුෂතෙම; එකො එව, හුදකලාවූයේම; සෙය්‍යො, ඔවුන්ටවඩා ශ්‍රෙෂ්ඨයි.

**යමකපාටිහාරිය වත්ථු.**

---

204 කිංසු අධිපතී රාජා කිංසු රාජා රජස්සරො,
කථංසු විරජො හොති කථං බාලො'ති වුච්චති.

204 කිංසු අධිපති, කිනමක්හි අධිපතිවූයේ; රාජා, රජනම්වේද;

කිංසු, කෙසේනම්; රාජා,රජතෙම; රජස්සරෝ,රජස්සරවේද; කථංසු, කෙසේනම්; විරජෝහොති, විරජවේද; කථං, කෙසේ; බාලොති වුච්චති, බාලයයිකියනු ලැබේද;

205 ඡවාරාධිපති රාජා රජ්ජමානො රජස්සරො,
අරජ්ජං විරජො හොති රජ්ජං බාලො'ති වුච්චති.

205 ඡවාරාධිපති, (යමෙක් චක්ඛුරාදී) සදෙරට අධිපතිද; හෙවත්-එකදෙරෙකත් රූපාදීන් විසින් අනභිභූතද; රාජා,හෙතෙම රජනම්; රජ්ජමානො, ඒඡවාරාරම්මණයන්හි ඇලෙන්නේ; රජස්සරො, රජස්සරනම්; අරජ්ජං, නොඇලෙන්නේ; විරජො හොති, විරජවේ; රජ්ජං, ඇලෙන්නේ; බාලොති වුච්චති, බාලයයිකියනු ලැබේ.

206 කෙනස්සු වුය්හති බාලො කථං නුදති පණ්ඩිතො,
යොගක්ඛෙමී කථං හොති තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

206 බාලො, අඥනජනතෙම; කෙන, කිමෙකින්; වුය්හති, හය නුලැබේද; පණ්ඩිතො, පණ්ඩිතජනතෙම; කථං නුදති, හයනුවා කිසෙයින් පහකෙරේද; කථං, කෙසේ; යොගක්ඛෙමී හොති, යොගක්ෂෙම ඇත්තේවේද; මෙ, මාවිසින්; පුච්ඡිතො, විචාරණලද මොබවහන්සේ; තං, එය; අක්ඛාහි, විසඳවදාළමැන.

207 ඔඝෙන වුය්හති බාලො යොගා නුදති පණ්ඩිතො,
b සබ්බයොගවිසංයුත්තො යොගක්ඛෙමී'ති වුච්චති.

207 ඔඝෙන, කාමෞඝාදි චතුර්විධෞඝයෙන්; බාලො, බාලජනතෙම; වුය්හති, හයනුලැබේ; පණ්ඩිතො, නුවනැති ජනතෙම; යොගා, සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍ය සංඛ්‍යාතයොගයෙන්; නුදති, ඝඨෞඝෞඝය පහකෙරෙයි; සබ්බයොගවිසංයුත්තො, සබ්බයොග, සියලුකාමයොගාදී සතරයොගයන් කෙරෙන්; විසංයුත්තො, විනිර්මුක්තවූ ක්ෂීණාශ්‍රව තෙම; යොගක්ඛෙමීති, යොගක්ෂෙමියයි; වුච්චති, කියනුලැබේ.

## චිරකාපසන්න නාගරාජවත්‍ථු.

---

208 යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා,
සබ්බෙව දාසා මන්ධාතු යෙ පාණා පථවිනිස්සිතා.

208 යාවතා, යම්තාක්; චන්දිමසූරියා,චන්‍ද්‍රසූර්‍ය්‍යයෝ; පරිහරන්ති, මහමෙරසිසාරා ඇවිදිද්ද; දිසා භන්ති, දිසාවන්හි බබලන්ද; විරොචනා,ආලොකකරණබැවින් විරොචන සවභාවඇත්තාහුද;(මෙතෙක්

---

b සබ්බෙ ච තෙ යොගා චෙති සබ්බයොගා තෙහි විසංයුත්තො සබ්බයොගවිසංයුත්තො.

පෙදෙස්හි) පඨවිනිස්සිතා, පෘථිවිනිශ්‍රිතවූ; යෙ පාණා, යම් ප්‍රාණීහු වෙත්ද; නොහොත්–යම් මනුෂ්‍යකෙණෙක් වෙත්ද;(තෙ) සබ්බෙව,ඒසියල්ලෝම; මන්ධාතු, එනම්රජහුගේ; දසා,දසයෝවෙත්; (නොහොත්) මන්ධාතා, මන්ධාතුතෙම; (අපටසවාමිහයි උපගතහෙයින්)තෙ සබ්බෙව, ඒසියල්ලෝම; දසා, (ඔහුගේ) දසයෝවෙත්.

**අඞ්ගීරස භික්ඛුවත්ථු.**

---

209 තිට්ඨන්තෙ නිබ්බුතෙ චා'පි සමෙ චිත්තං සමං ඵලං,
චෙතොපසාදහෙතුං හි සත්තා ගච්ඡන්ති සුගතිං,

209 තිට්ඨන්තෙ, (පූජාගීතථාගතයන්හා තථාගතශ්‍රාවකයන්) වැඩසිටින (ජීවමාන) කල්හිද; නිබ්බුතෙවඅපි, පිරිනිවීකල්හිද; සමං චිත්තං, සමානසිත්වේනම්, සමං ඵලං, සමානවිපාකඵලවෙයි; හි, යම් හෙයකින්; සත්තා, සත්වයෝතුමූ; චෙතොපසාදහෙතුං, චිත්තප්‍රසාදය ම හෙතුකොටගෙණ; සුගතිං, සුගතියට; ගච්ඡන්ති, යෙද්ද (එහෙසිනි.)

**කස්සපදසබලස්ස සුවණ්ණචෙතිය වත්ථු.**

**චුද්දසමොවග්ගො.**

---

210 මිද්ධී යදා හොති මහග්ඝසො ච
නිද්දායිතා සම්පරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

210 යදා, යම්කලෙක්හි; මහග්ඝසො ච,(ආහාරහස්තාදීන් අතුරෙන් එකෙකුමෙන් (පමණනොදැන) මහත්කොට බුදින්නේ; මිද්ධී, පචලායිකාසඞ්ඛ්‍යාත කායගෙලඤ්ඤය (බහුලකොට) ඇත්තේ; නිද්දායිතා, හුන්සිටිතැන නිදන්නේ; සම්පරිවත්තසායී, එක් සැටියකින් පවත්නට අසමර්ථවපෙරලි පෙරලී වැදහෙ:නේ; හොති, වේද; නිවාපපුට්ඨො, කුඩුකාදිශූකර භක්තයෙන් පොෂණය කරණලද්දාවූ; මහාවරාහොව, මහගම් ඌරෙකුමෙන් (ලොකාමිෂයෙන් පුෂ්ටවූ); මන්දො, (අනිත්‍යාදීත්‍රිලකුණු මෙනෙහි කරන්ට නොපොහොනා ඒ) අඥන් තෙම; පුනප්පුනං, නැවත නැවත; ගබ්භං, මවුකුසකරා; උපෙති, උත්පත්ති වශයෙන් එළඹෙයි.

211 මනුජස්ස සදා සතීමතො
මත්තං ජානතො ලද්ධභොජනෙ,
තනු තස්ස භවන්ති වෙදනා
සනිකං ජීරති ආයුපාලයං.

211 භොජනෙ, බොජුන්; ලද්ධා, ලැබ; නොහොත් ලද්ධභොජනෙ, ලත්බොජුන්හි; මත්තං ජානතො, (සතරපස්පිඩක් තබාවැලදී යගුතුය යන) පමණදන්නාවූ (පමණදන වලදකරන්නාවූ); සදා, සැමකල්හි; සතිමතො, සම්‍යසිසම්පන්නවූ; නොහොත්-පමණින් වැලදියයුතුය යනසිහිඇති; තස්ස මනුජස්ස, ඒ සත්හුගේ; වෙදනා, අනිභුක්තප්‍රත්‍යයයෙන්වන ඖදරිකවෙදනාවෝ; තනු භවන්ති, තුනී වෙත්; ආයුපාලයං,(මෙසේ වැලඳුබොජුන) ආයුසරකිමින්; සනිකං, ජීරති, සෙමෙන් දිරයි.

පසෙනදිකොසලවත්‍ථු.

---

212 පූච්ඡ වාසව මං පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි,
තස්ස තස්සෙව පඤ්හස්ස අහං අන්තං කරොමි තෙ.

212 වාසව, ශක්‍රය; මනසා,තාසිතින්; යං කිඤ්චි, යම්කිසිපැණක්; ඉච්ඡසි; (අසනු) කැමැත්තෙහිද; (තං) පඤ්හං, (ඒ) පැණ; මං, මා පුච්ඡ, විචාරව; අහං,මම; තෙ,තාගේ; තස්ස තස්සෙව පඤ්හස්ස, ඒ ඒ ප්‍රශ්නයාගේ; අන්තං, කෙළවර (විසඳීම); කරොමි, කරමි.

සක්කදෙවරාජවත්‍ථු

පකිණ්ණකවග්ගො.

---

213 උරගොව තචං ජිණ්ණං හිත්වා ගච්ඡති e සන්තනුං,
එවං සරීරෙ නිබ්භොගෙ පෙතෙ කාලකතෙ සති.

213 ජිණ්ණං, දිරුණාවූ; තචං, සැවය; (හැරපියායන්නාවූ; උරගො ඉව, සර්පයෙකුමෙන්; සන්තනුං, සියසිරුර; හිත්වාන, නිරපෙක්ෂාකොට (හැර); ගච්ඡති,යේ; එවං, එපරිද්දෙන්, සරීරෙ, සිරුර; නිබ්භොගෙ,ජීවිතෙන්ද්‍රියය නොමැතිහෙයින් නිර්භොගකල්හි; පෙතෙ, පරලොව ගියකල්හි; කාලකතෙ, කළමරණ ඇතිකල්හි;-

214 ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං.
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගති.

214 ඩය්හමානො,(සිරුර)දනුලබන්නේ; ඤාතීනං, නැයන්ගේ;

---

e සං අත්තනො තනු සන්තනු-තං.

පරිදෙවිතං, හැඬීම; න ජානාති, නොදනී; තස්මා, එහෙයින්; එතං, මොහුගැණ; නාසොචාමි, ශෝකානොකරමි; තස්ස, ඔහුගේ; යා ගති, යම්ගතියක්ඇද්ද; (ඒවූපරිද්දෙන්) සො, හෙතෙම; ගතො; ගියේය.

### අඤ්ඤතර කුටුම්බිකවත්ථු.

### සොළසමො වග්ගො.

---

215 යස්මිං මනො නිවිසති චිත්තං චා'පි පසීදති,
අදිට්ඨපුබ්බකෙ පොසෙ කාමං තස්මිංපි විස්සසෙ.

215 යස්මිං, යම්කිසි පුද්ගලයෙක් කෙරෙහි; මනො, සිත; නිවිසති, දුටුකෙණෙහි සෙනෙහසින් වැදගණීද; චිත්තංචාපි, හිතහෝ; පසීදති, (දෘෂ්ටමාත්‍රයෙන් යම්පුද්ගලයෙක් කෙරෙහි) පහදීද; (මෘදු වේද); අදිට්ඨපුබ්බකෙඅපි, අදෘෂ්ටපූර්වකවූ; (ප්‍රකෘතියෙන් නාදුතම භාවයෙහි නුදුටුවූවරු'); තස්මිං පොසෙ, ඒ පුරුෂයාකෙරෙහි; කාමං, එකාන්තයෙන්; විස්සසෙ, (අනුභූත පූර්වකස්නෙහයෙන්) විශ්වාසකරන්නේය; (විශ්වාසයටපැමිණෙන්නේයයි සේති).

පුබ්බෙව සන්නිවාසෙන පච්චුප්පන්න හිතෙන වා,
එවං තං ජායතෙ පෙමං උප්පලං ව යථොදකෙ.

(83-අඞ්කයබලනු.)

216 අප්පං වත ජීවිතං ඉදං ඔරං වස්සසතාපි මීයති,
යොචෙපි අතිච්ච ජීවති අථ ඛො සො ජරසාව මීයති.

216 ඉදං ජීවිතං, මේමිනිස්දිවි; වත, එකාන්තයෙන්; අප්පං, ස්වල්පයි; වස්සසතාපි ඔරං, වර්ෂශතයකින් මොබින්; මීයති, මියෙයි; චෙ, ඉදින්; යො අපි, යමෙක්හුත්; අතිච්ච, (වාසියය) ඉක්ම; ජීවති, ජීවත් වේද; අථඛො, එකල්හි; සො, හෙතෙම; ජරසා එව, ජරාවෙන්ම; මීයති, මියෙයි.

### සාකෙතක බ්‍රාහ්මණවත්ථු.

---

217 භුත්වා තිණපරිඝාසං භුත්වා ආචාමකුණ්ඩකං,
එතං තෙ භොජනං ආසි කස්මා 'දානි න භුඤ්ජසි.

217 තිණපරිඝාසං, (ඒ ඒ අශ්වවෘෂභාදීන් විසින් කාඉතිරිවූ) ඉඳුල්තණ; භුත්වා, කා; ආචාමකුණ්ඩකං, ආචාමතිය හුනුකැන්දිය හා කුඩුද; භුත්වා, අනුභවකොට; (තෝ වැඩුනෙහිය) (එහෙයින්) තෙ, තට; එතං භොජනං, (පෙර) මේබොජුන්; ආසි, වූයේය; ඉදානි, දැන්; කස්මා, කවරහෙයකින්; න භුඤ්ජසි, (මාවිසින් දෙනලද ආචාමාදිය) නොනුබුදිනෙහිද?

218 යත්‍ථ පොසං න ජානන්ති ජාතියා විනයෙන වා,
බහූ තත්‍ථ මහාබ්‍රහ්මෙ අපි ආචාමකුණ්ඩකං.

218 යත්‍ථ, යම්තැනෙක්හි; බහූ, බොහෝදෙන; පොසං, පුරුෂ (ජන) යෝ; ජාතියා, (මෙතෙම ජාතිසම්පන්නයෙකැයි)ජාතියකරණකොටගෙණද; විනයෙනවා,(මෙතෙම ආචාරවිනය යුක්තයෙකැයි) විනයකරණකොටගෙණද; න ජානන්ති, ස්වරූපවශයෙන් මෙසේ නොහඳුනත්ද; මහාබ්‍රහ්මෙ, ගරුවූමහාබ්‍රහ්මය; තත්‍ථ, එතැන්හිදී; ආචාමකුණ්ඩකං අපි,උලුකැන්දියහා කුඩුත්;(බුදිමි)(තමන් ස්වරූපදත් නවුන් නැතිතෙනදී ලදයමක්ම බුදින්නෙමියයි සේයි.)

219 ත්වං ච ඛො මං විජානාසි යාදිසායං හයුත්තමො,
ජානන්තො ජානමාගම්ම න තෙ භක්ඛාමි කුණ්ඩකං.

219 අයං හයුත්තමො, මේඅශ්වරාජවූ (මම); යාදිසො, යම්බඳුවෙම්ද; මං,(එබඳුවූ) මා;ත්වං ච ඛො, තෝදවනාහි; විජානාසි,(කුලප්‍රදෙශාදිවශයෙන්) දන්නෙහිය; ජානන්තො, තමන්බලයදන්නාවූ (මම); ජානං, (මාගේ උත්තමාශ්වස්වභාවය තන්වූපසිද්දෙන්) දන්නා (නාකරා); ආගම්ම,අවුත්; තෙ, තාගේතුවූ; කුණ්ඩකං,කුඩු;න භක්ඛාමි, නොකමි.

**පූර්ණාවත්‍ථු.**

**සත්තරසමො වග්ගො.**

---

220 චතුප්පදො අහං සම්ම ත්වම්පි සම්ම චතුප්පදො,
එහි සීහ නිවත්තස්සු කිංනු භීතො පලායසි.

220 සම්ම, යහලුව; අහං, මම; චතුප්පදො, සිව්පාඇත්තෙක්වෙමි; සම්ම, සබඳ; ත්වම්පි, තෝද; චතුප්පදො, සිව්පාඇත්තේවෙහිය; සීහ, සිංහය; එහි, මෙහි එව; නිවත්තස්සු, නැවතුව; භීතො, බියපත්වූයෙක්ව; කිංනු පලායසි, කිමපලායෙහිද?

221 අසුචි පූතිලොමොසි දුග්ගන්ධො වාසි සූකර,
සචෙ යුජ්ඣිතුකාමොසි ජයං සම්ම දදාමි තෙ.

221 අසුචි, පිවිතුරුනොවූ; පූතිලොමො අසි, මලතැවරුණුහෙයින් දුගඳ ලොම් ඇත්තේවෙහිය; දුග්ගන්ධො වාසි, අනිටුපිළිකුල්දුගඳ ඇතිදවෙහිය; සම්ම සූකර, සබඳහූර; සචෙ, ඉදින්; යුජ්ඣිතුකාමොසි, මාහායුදකරණු කැමැත්තෙහිනම්; තෙ, තට; ජයං දදාමි, ජයදෙමි,

**ලාළුදායිථෙරවත්‍ථු.**

---

222 යථා නදී ච පන්ථො ච පානාගාරං සභා පපා,
එවං ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති.

222 නදී ච, ගඞ්ගාවද; පන්ථො ච, මාර්ගයද; පානාගාරං, සුරාපාන ශාලාවද; සභා, බොහෝදෙන සැතපෙන්නට කළ ශාලාවද; පපා, පින්පැන්මඩුවද; (යනමොහු); යථා, යම්සේ උත්තමාධමාදී සර්වජන යන්ට සාධාරණවෙත්ද, ලොකෙ, ලොකයෙහි; ඉත්ථියො නාම, ස්ත්‍රීහුද; එවං, එසේම; සියල්ලන්ට පොදුවෙත්; එහෙයින්; තාසං, ඒ ස්ත්‍රීන්ට; වෙලා, කාලයක් (නොහොත්) කුලාචාරසීමාවක්; න විජ්ජති, නැති.

**අඤ්ඤතර කුලපුත්තවත්ථු.**

---

223 බහුම්පි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො
අන්වාගන්ත්වාන දූසෙය්‍ය භුඤ්ජ භොගෙ කටාහක.

223 සො, ඒ පුරුෂතෙම; අඤ්ඤං ජනපදං, තමන්ජාතිභූමියාදිය හැර අන්දනව්වකට; ගතො, ගියේ; බහුම්පි, බොහෝකොටත්; විකත්ථෙය්‍ය, පරිභව වචනයන් කියන්නේය; අනු ආගන්ත්වාන, නැවත පෙරලා ප්‍රතිපථයට අවුත්; දූසෙය්‍ය, තාහිම් දූෂණයකරන්නේය; කටාහක, කටාහකය; භොගෙ, සම්පත්තීන්; භුඤ්ජ, අනුභවකර.

**තිස්සදහරකවත්ථු.**

**අට්ඨාරසමො වග්ගො.**

---

224 අධිචෙතසො අප්පමජ්ජතො
මුනිනො මොනපථෙසු සික්ඛතො,
සොකා න භවන්ති තාදිනො
උපසන්තස්ස සදා සතිමතො.

224 අධිචෙතසො, අධිසමාධිඇත්තාවූ; අප්පමජ්ජතො, ස්මෘතිවිප්‍රවාසනැත්තාවූ (ප්‍රමා නොවන්නාවූ); මොනපථෙසු, ඵලසමාපත්තියෙහි හා විදර්ශනාරම්මණයෙහි; සික්ඛතො, අධිප්‍රඥශික්ෂාවෙන් හික්මෙන්නාවූ; හෙවත් හික්මුනාවූ; තාදිනො, තාදීගුණවත්වූ; උපසන්තස්ස, රාගාදිව්‍යුපසමයෙන් උපශාන්තවූ; සතිමතො, ස්මෘතිමත්වූ (වෛපුල්‍යප්‍රාප්තස්මෘති ඇත්තාවූ); මුනිනො, ක්ෂීණාශ්‍රවර්ෂීහට, සොකා, ශොකයෝ; න භවන්ති, නොවෙත්.

**එකුදානඛීණාසවත්ථෙර වත්ථු.**

**එකූනවීසතිමො වග්ගො.**

---

225 යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
වරුණකකට්ඨහාරොව ස පච්ඡා මනුතප්පති.

225 යො, යම් පසිවෙක්; පුබ්බෙ, පූර්වයෙහි; කරණීයානි, කතී ව්‍යයන්; පච්ඡා, පසුව; කාතුං, කරන්නට; ඉච්ඡති, කැමතිවේද; ව රුණකට්ඨහාරො ඉව, වරුණ දඹුබිදීඅභියුක්තකයාමෙන්; සො, ඒ පුද්ගලතෙම; පච්ඡා, පසුව; අනුතප්පති, තැවෙයි.

**පධානකම්මිකතිස්සත්ථෙරවත්ථු.**

---

226 අපිනු හනුකා සන්තා මුඛං ච පරිසුස්සති,
ඔරමාම න පාරෙම පූරතෙව මහොදධි.

226 නොඅපි, අපගේවතාහි; හනුකා, හනුදෙක; සන්තා, මහෙනා ඥයහ; මුඛං ච, මුහුනද; පරිසුස්සති, වියලෙයි; ඔරමාම, වියඝීයකර මිහ (දියඅදුම්හ); නපාරෙම; වියඝීයකොට නිෂ්ඨාවකට නොයෙම්හ; මහොදධි, සමුද්‍රය; පූරති එව, (ඉසිපමණින්) පිරේමැයි.

**මහල්ලකභික්ඛුවත්ථු.**

---

227 අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං * තෙන මහාසෙනෙන මච්චුනා.

227 ආතප්පං, (කෙලශාතාපන පරිතාපනයෙහි ආතප්පයයි ලද නම්ඇති) වීර්‍ය්‍යය; අජ්ජඑව, අදම; කිච්චං, කටයුතුයි; සුවෙ, සෙටදි න; මරණං, මරණවනුනොවනු (ජීවත්වීමහෝ මැරීමහෝ); කො, කව රෙක්; ජඤ්ඤා, දනීද; මහාසෙනෙන, (මරණට කරුණු බොහෝබැ වින්) මහසෙනගඇති, තෙන මච්චුනා, ඒමරහුහා; නො, අපට; සංග රං, මිත්‍රාකාරලවදන බලරාශිසඞ්ඛ්‍යාත සඞ්ගරයක්; නයි(අත්‍යි), නහ මක් ඇති.

228 එවං විහාරිං ආතාපිං අහොරත්තම තන්දිතං,
තං වෙ a භද්දෙකරත්තො'ති සන්තො ආචික්ඛතෙ මුනි.

228 සන්තො, සන්සුන්රාගාදීන් ඇති; මුනි, සම්බුද්ධමුනිතෙම, එවං විහාරිං, එසෙයින්වසනසුළුවූ, ආතාපිං, කෙලශාතාපන පරිතාප නස්වභාවඇත්තාවූ, අහොරත්තං, දිවාරාත්‍රදෙක්හි; අතන්දිතං, අනලසවූ,

---

a භද්දො එකරත්තො අස්සා'ති භද්දෙකරත්තො.

---

* "සඞ්ගරො"ති හි මිත්තාකාර ලවදනබලරාසීනං නාමං.

හං, මෙසේපිළිපන්පුද්ගලයා, හැ ඥකරනෙහා'හි,(විදශීනානුයොගය මණ ග නාඛායෙන්) හාළෙද්‍රක රකා ඇ.නිසේක්යයි; ආවිකාලංතෙ, වැද රයි.

**මහාඩිනඩාණිජවතු.**

229 යො ච වසස සතං ජීවෙ අපසසං අමතං පදං,
එකාහං ජීවිතං සෙයෙ‍්‍යා පසසතො අමතං පදං.

229 යො, යම්පුද්ගලයෙක්; අමතං පදං, අසංස්කෘතවූ අමෘතපදය; අපසසං, නොදකිමින්; වසසසතං, වර්‍ෂශතයක් මුලුල්ලෙහි; ජීවෙ, ජීවත්විනමුත්; (ඔහුගේඒජීවත්විමටවඩා); අමතං පදං, අමෘතපදය; පසසතො, නුවනැසින්දක්නා පුහුලාගේ; එකාහං, එක්දවසකුදු; ජීවිතං, ජීවත්විම; සෙයෙ‍්‍යා, ශ්‍රෙෂ්ඨයි.

**කිසාගොතමිවතු.**

230 යො ච වසස සතං ජීවෙ අපසසං උදයබ්බයං
එකාහං ජීවිතං සෙයෙ‍්‍යා පසසතො උදයබ්බයං.

230 උදයබ්බයං, රූපාදීපඤ්චසකාඣයන්ගේ උදයව්‍යයය; අපසසං, නොදක්නාවූ; යො, යම්කිසි පුහුලෙක්; වසසසතං, වර්‍ෂශතයක්; ජීවෙ, ජීවත්විනමුත්; (ඔහුගේජීවත්විමටවඩා); උදයබ්බයං, සකාඣයන් ගේ උදයභාව්‍යයය; පසසතො, ඥනවක්‍ෂුසින්දක්නා භික්‍ෂුහුගේ; එකාහං, එක්දිනක්; ජීවිතං, ජීවත්විම; සෙයෙ‍්‍යා, ශ්‍රෙෂ්ඨයි.

**පටාචාරාවතු**

**විසතිමො වගෙගා.**

231 එකසා මයං අරඤ්ඤෙ විහරාම අපවිඩංච වනාසම්ං දාරුකං,
එතාදිසිකාය රත්‍රියා කොසුදනි අමෙහහි පාපියො.

231 වනාසම්ං, වෙනෙහි; අපවිඩං, පියනලද; දාරුකං ඉව, දාවද ණ්ඩක්මෙන්; මයං, අපි; එකසා, එකලාවම, අරඤ්ඤෙ, වෙනෙහි; විහරාම, වෙසෙමු; ඉදානි, දැන්, එතාදිසිකාය, මෙබඳුවූ; රත්‍රියා, රාත්‍රියෙහි, කොසු, කවරෙක්; අමෙහහි, අපටවඩා; පාපියො, පව්වුද; (අපවරාපවිඇතියේක්ද).

232 එකකො ත්වං අරඤ්ඤෙ විහරසි අපවිඩංච වනාසම්ං දාරුකං,
තසස තෙ බහුකා පිහයනාති නෙරයිකා විය සගගගාමිනං.

232 වනාසම්ං, වෙනෙහි; අපවිඩං, පියනලද; දාරුකං ඉව, දරද ඩක්මෙන්; ත්වං, තෝ; එකකො, එකලාවම; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි;

විගරසී, වෙසෙහිය; සග්ගගාමිනං, ස්වර්ගගාමීන්පතන්නාවූ, නෛරයි කං විය, නිරිසතුන්සෙයින්; තස්ස තෙ, ඒ තා; බහුකා, බොහෝදෙ නෝ; පිහයන්ති, පතත්.

## වජ්ජිපුත්තක භික්ඛුවත්ථු.

---

233 කීදිසා සමණා තුය්හං බාලහං බො තෙ පසංසසි,
කිංසීලා කිං සමාචාරා තං මෙ අක්ඛාහි පුච්ඡිතා.

233 ත්වං, තී; තෙ, ඔවුන්, බාලහං බො, දැඩිකොටම, පසංසසි ප්‍රසංසාකෙරෙහිය. තුය්හං, තීගේ; සමණා, ඒමහණනු; කීදිසා, කෙබ ඳුද; කිංසීලා, කෙබඳුසිල්ඇත්හෝද; කිංසමාචාරා, කෙබඳුසදාචාර ඇත්තෝද; මෙ, මාවිසින්; පුච්ඡිතා, පුලුවුත්නාති, තං, එය; අක්ඛා හි, විස්තරකොටකිය.

234 සන්තින්ද්‍රියා සන්තමානසා සන්තං තෙසං ගතං ඨිතං,
ඔක්ඛිත්තචක්ඛු මිතභාණී තාදිසා සමණා මම.

234 සන්තින්ද්‍රියා, සන්හුන්ඉඳුරන් ඇත්තෝය; සන්තමානසා, සන්හුන්සිත් ඇත්තෝය; තෙසං, උන්වහන්සේලාගේ; ගතං, ගම න්ද; ඨිතං, සිටීම්ද; සන්තං, (සන්සුන් සිහින් පවත්නාබැවින්) ශා න්තය; ඔක්ඛිත්තචක්ඛු, යටටලූ ඇස්ඇත්තෝය; මිතභාණී, පමණි න්යුත්තෙපුල් ඇත්තෝය; (හෙවත්-පමණදැන බණනසුලුය); මම, මාගේ; සමණා, ඒ ශ්‍රමණයින්වහන්සේලා; තාදිසා, එබඳුගුණ ඇත් තාන.

235 කායකම්මං සුචි තෙසං වාචාකම්මං අනාවිලං,
මනොකම්මං සුවිසුද්ධං තාදිසා සමණා මම.

235 තෙසං, උන්වහන්සේලාගේ; කායකම්මං, කායකර්මය; සුචී, (විශුද්ධචිත්තවත්හෙයින්) පිරිසිදුය; වාචාකම්මං, වාක්කර්මයද; අනාවි ලං, නොකැලතිය; මනොකම්මං, මනොකර්මයද; සුවිසුද්ධං, අතිවිශුද්ධ ය; මම, මාගේ; සමණා, ශ්‍රමණයින් වහන්සේලා; තාදිසා, එබඳු ගුණ ඇත්තෝය.

236 විමලා සඞ්ඛමුත්තාභා සුද්ධා අන්තරබාහිරා,
පුණ්ණා සුද්ධෙහි ධම්මෙහි තාදිසා සමණා මම.

236 විමලා, නිර්මලයහ; සඞ්ඛමුත්තාභා, විසුදුගුණෙන් සක්මුතුවැන් නාහ; අන්තරබාහිරා, ඇතුළුබැහැරින්; සුද්ධා, පරිශුද්ධයහ; සුද්ධෙහි, (කෙලෙස්මල සුන්හෙයින්)විශුද්ධවූ; ධම්මෙහි, ධර්මයන්ගෙන්; පුණ්ණා, සම්පූර්ණයහ; මම, මාගේ; සමණා, ශ්‍රමණයින් වහන්සේලා; තාදිසා, එබඳු ගුණඇත්තෝය.

237 ලාභෙන උනනාතො ලොකො අලාභෙන ච ඔනතො,
ලාභාලාභෙන එකඪා තාදිසා සමණා මම.

237 ලොකො, ලෝවැසිජනතෙම; ලාභෙන, ලාභයෙන්; උනන තො, උනනත්වේ (උස්වීය); අලාභෙනච, අලාභයකරණකොටගෙණ; ඔනතො; අවනතවෙයි; (එබෙය); ලාභා ලාභෙන, ලාභා ලාභදෙකකරණකොට ගෙණ; එකඪා, එකම ආකාරයෙන් සිටියාහ; මම, මාගේ; සමණා, ශ්‍රමණයින්වහන්සේලා, තාදිසා, එබඳුගුණඇත්තෝය.

238 යසෙන උනනතො ලොකො අයසෙන ච ඔනතො,
යසායසෙන එකඪා තාදිසා සමණා මම.

238 ලොකො, ලෝවැසිදනතෙම; යසෙන, යසසින්; (පිරිවරින්); උනනතො, උනනතය; අයසෙන ච, අයසින්ද; ඔනතො, අවනතය; යසායසෙන, යසස් අයසස්යන දෙකින්; එකඪා, එකඅප්වෙන්; මම, මාගේ; සමණා, ශ්‍රමණයින් වහන්සේලා; තාදිසා, එබඳුගුණ ඇත්තෝය.

239 පසංසාය උනනතො ලොකො නින්‍දය ච ඔනතො,
සමා නින්‍දාපසංසාසු තාදිසා සමණා මම.

239 ලොකො, ලෝවැසි දනතෙම; පසංසාය, පැසසීමෙන්; උනනතො, උනනතය; නින්‍දය ච, නින්‍දාවෙන්ද; ඔනතො, අවනතය; නින්‍දාපසංසාසු, නින්‍දාප්‍රසංසාදෙක්හි; සමා, උන්වහන්සේලා සමවෙත්; මම, මාගේ; සමණා, ශ්‍රමණයින්වහන්සේලා; තාදිසා, එබඳුගුණඇත්තෝය.

240 සුඛෙන උනනතො ලොකො දුක්ඛෙන ච ඔනතො,
අකම්පා සුඛදුක්ඛෙසු තාදිසා සමණා මම.

240 ලොකො, ලෝවැසිජනතෙම; සුඛෙන, සුවයෙන්; උනනතො, උඩගුය; දුක්ඛෙන ච, දුකින්ද; ඔනතො, අවනතය; සුඛදුක්ඛෙසු, සුවදුක්දෙක්හි; අකම්පා, මොහුවෙවුලුම්නැත්තෝය; මම, මාගේ; සමණා, ශ්‍රමණයින් වහන්සේලා; තාදිසා, එබඳුගුණඇත්තෝය.

**චූලසුභද්දවත්ථු**
**එකවීසතිමො වග්ගො.**

---

241 යෙහි ජාතෙහි නාන්දිෘසං යෙසං ච භවමිච්ඡිසං,
තෙ මං දුරෙහි සම්මූච්ඡා සාච වාරෙනාති ඝූකරං.

241 ජාතෙහි, උපන්නාවූ; යෙහි, යම්කෙණෙකුන් කරණකොට

ගෙණ; නාඥිස්සං, සතුටුවූයෙම්ද; යෙසං ච, යම්කෙණෙකුන්ට; භ වං, වැඩ; (වෘඩිය), ඉච්ඡිසං, පැතුයෙම්ද; දූරෙහි, සියදූරියනාවිසින්; සම්මුච්ඡා, මුසපත්වූ; තෙ, ඔහුතුමූ; සූකරං, හූරනූ (හඬවන); සා ඉ ච, හණක් හුසෙසින්; මං, මා, වාරෙනති, වළකත්(හඬවත්).

242 අසන්තා කිර මං ජම්මා තාතතාතා'ති භාසරෙ,
රක්ඛසා පුත්තරූපෙන තෙ ජහන්ති වයොගතං.

242 අසන්තා, අසත්පුරුෂවූ; ජම්මා, ලාමකවූවාහු; පුත්තරූපෙ න, දරුවෙසින් (සිව්යාවූ); රක්ඛසා, රකුසෝ; මං, මට; තාතතාතඉ ති, පියානෙනි පියානෙනිකියා; භාසරෙ, කියත්; තෙ, ඔහුතුමූ; ව යොගතං, ගිය තුන්වයස් ඇති මා;ජහන්ති,අත්හරිත්.

243 අස්සාව ජිණ්ණා නිබ්භොගො ඛාදනා අපනීයති,
බාලානම්පි තථා ථෙරො පරාගාරෙසු භික්ඛති.

243 බාලානං,බාලයන්පියවූ; ථෙරො,මහලුතෙම, නිබ්භොගො, පරිභොගයට නොනිසිවූ; ජිණ්ණා අස්සා ඉව,දිරුණුඅසෙකුසෙසි න්;ඛාදනා,කනුයෙන් (කෑමෙන්); අපනීයති, පහකරණුලැබේ; ත ථා, එසේම (ඒමහලුතෙම කෑමෙන් පියනලදුව); පරාගාරෙසු, මෙර මාගෙවල; භික්ඛති, සිගයි.

244—245 දණ්ඩාව කිර මෙ සෙය්‍යො යමෙ පුත්තා අනස්සවා,
චණ්ඩම්පි ගොණං වාරෙති අථො චණ්ඩම්පි කුක්කුරං.
අන්ධකාරෙ පුරො හොති ගම්භීරෙ ගාධමෙධති,
දණ්ඩස්ස ආනුභාවෙන ඛලිත්වා පතිතිට්ඨති.

244—245 මෙ, මාගේ; (යෙ) පුත්තා (යම්) දරුකෙණෙක්; වෙ, ඉදින්;අනස්සවා,නොකීකරුවෙත්ද(අවසවර්තීවෙත්ද ඔවුන්ට වඩා); දණ්ඩව,සැරයටිදණ්ඩ; සෙය්‍යො, උතුම්;(හෙතුකවරේදයත්) චණ්ඩං, දරුණුවූ;ගොණං,ගොණෙකුත්;වාරෙති,වළහාද; අථො,නැවත;චණ්ඩං කුක්කුරං අපි,සැඩබල්ලෙකුත්(වළහාද);අන්ධකාරෙ, අඳුරෙහි; පුරො හොති,පෙරටුවේද; ගම්භීරෙ, ගැඹුරු දියෙහි;ගාධං,පිහිට්ටාව;එධති, ලබාද;දණ්ඩස්ස ආනුභාවෙන, දණ්ඩානුභාවයෙන්; ඛලිත්වා, පැකිලී; පති තිට්ඨති, පිහිටාසිටීද; (එහෙයිනි).

අසැදෑ නරබ්‍රාහමණ පුත්‍ර වාස්තු.

---

246 චාතුද්දසිං පණ්ණරසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං;
උපොසථං උපවසන්ති බ්‍රහ්මචරියං චරන්ති යෙ.

246 චාතුද්දසිං, තුදුස්වක්හිද; පණ්ණරසිං, පසළොස්වක්හිද; පක්ඛස්ස, අඩවස්සම්බන්ධවූ; යාව අට්ඨමි, යම්අටවකකුත්වේද; (ඒවක් හිද) පාටිහාරියපක්ඛං ච, ප්‍රාතිහාර්‍ය්‍යපක්‍ෂයෙහිද; යෙ, යම්කෙණෙක්; අට්ඨඞ්ගසුසමාගතං, අෂ්ටාඞ්ගයෙන් සම්ප්‍රයුක්තවූ; උපොසථං, පෙහෙවස්; උපවසන්ති, වෙසෙත්ද; බ්‍රහ්මචරියං, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවෙහි(බඹසර); චරන්ති, හැසිරෙත්ද;

247 න තෙහි යක්ඛා කීළන්ති ඉති මෙ අරහතං සුතං,
සාදනි අජ්ජ පස්සාමි යක්ඛා කීළන්ති සාණුනා.

247 යක්ඛා, යක්‍ෂයෝ; තෙහි, ඔවුන්හා; න කීළන්ති ඉති, නො කෙළෙතියත; (යක්‍ෂයෝ මොවුන්ගෙණ නොකෙළෙතිසිසේයි) අරහතං, රහතුන්ගේබස්; මෙ, මාවිසින්; සුතං, අසනලද්දේය; සා, ඒ මම; ඉදනි අජ්ජ, දූන්ම(එ කරුණ); පස්සාමි, දකිමි; සාණුනා, සාණුසාමණෙරයන්සමග; යක්ඛා, යක්‍ෂයෝ; කීළන්ති, කෙළිත්.

248 චාතුද්දසිං පණ්ණරසිං යා ච පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛං ච අට්ඨඞ්ගසුසමාගතං;
උපොසථං උපවසන්ති බ්‍රහ්මචරියං චරන්ති යෙ,

242 චාතුද්දසිං, තුදුස්වක්හිද; පණ්ණරසිං, පසළොස්වක්හිද; පක්ඛස්ස, පක්‍ෂයසම්බන්ධවූ, යා ච අට්ඨමි, යම්අටවකකුත්වේද, (ඒ වක් හිද) පාටිහාරියපක්ඛං ච, ප්‍රාතිහාර්‍ය්‍යපක්‍ෂයෙහිද;යෙ, යම්කෙණෙක්; අට්ඨඞ්ගසුසමාගතං, අෂ්ටාඞ්ගයෙන්සුසංයුක්තවූ; උපොසථං, පෙහෙවස්;උපවසන්ති; වෙසෙත්ද; බ්‍රහ්මචරියං චරන්ති, බඹසරහැසිරෙද්ද.

249 න තෙහි යක්ඛා කීළන්ති සාධු තෙ අරහතං සුතං.
සාණු මා බුද්ධං වජ්ජාසි යක්ඛානං වචනං ඉදං,
මාකාසි පාපකං කම්මං ආවී වා යදි වා රහො.

249 තෙහි, ඔවුන්හා; යක්ඛා, යක්‍ෂයෝ; නකීළන්ති, නොකෙළිත්;තෙ, තීවිසින්; අරහතං, රහතුන්ගේ (බස්); සාධු, මනාකොට; සුතං, අසනලද්දේය;සාණු,සාණුසාමණෙරයෙනි;බුද්ධං,බුදුන්;මා වජ්ජාසි, නොකියව; යක්ඛානං,යකුන්ගේ;ඉදං වචනං, මේකීමවේ; පාපකං කම්මං,ලාමකපව්කම්; (ගිහිවෙමියනසිතයයි සේයි) ආවීවා, (කිසිවෙකුගේ)සම්මුඛයෙහිහෝ; යදි, ඉදින්;රහො වා, පරාඞ්මුඛයෙහිහෝ); මා අකාසි, නොකරව.

250 යං චෙව පාපකං කම්මං කරිස්සති කරොති වා,
න තෙ දුක්ඛා පමුත්‍යත්ථි උපපච්චාපි පලායතො.

250 යං චෙව පාපකං කම්මං, යම්පාපකර්මයක්; කරිස්සති, කරන්නේද; කරොති වා, කරයිද; උපපච්ච, (අහසට) පැනනැගී; (වහාය නළුණියෙක්මෙන්); පලායතො අපි, පලායන්නාවූද; තෙ, තට; දුක්ඛා, දුකින්; පමුත්ති, ප්‍රමුක්තියක් (මිදීමක්); න අත්ථි, නගමක් ඇත්තේය.

251 මතං ව අම්ම රොදන්ති සො ව ජීවං න දිස්සති,
ජීවන්තං අම්ම පස්සන්ති කස්මා මං අම්ම රොදසි.

251 අම්ම, මෑනියෙනි; මතං ව, යම්මළඑකෙකුනිසාම; රොදන්ති, හඬනෙහිද; සොච, ඒ මමම; ජීවං, ජීවත්වන්නෙම්; නදිස්සති, නොපෙණේද; අම්ම, මෑනියෙනි; ජීවන්තං, ජීවත්වනමා; පස්සන්ති, බලනුමැන; අම්ම, අම්මේ; මං, මාතිසා; කස්මා, කුමක්හෙයින්; රොදසි, හඬනෙහිද.

252 මතං ව පුත්ත රොදන්ති සොව ජීවං න දිස්සති,
යො ච කාමෙ වජ්ජිත්වාන පුනරාවත්තතෙ ඉධ;
තං වාපි පුත්ත රොදන්ති පුන ජීවං මතො හි සො.

252 පුත්ත, පුත, මතංව, මළඒ තොපනිසාම; රොදන්ති, හඬමී; ජීවං, ජීවත්වන; සොව, හේතෙමෙම්ම; න දිස්සති, නොපෙණේ; යො ච, යමෙක්හුත්; කාමෙ, විවිධකාමයන්; වජ්ජිත්වාන, පියා; පුන, නැවත; ඉධ, මෙහි; (මේගිහිබවට) ආවත්තතෙ, (විභ්‍රමනවශයෙන්) ආගමනයකෙරේද; පුන, නැවත; ජීවං, (සිවුරුහැර) ජීවත්වන්නාවූ, සො, හෙතෙම; මතො හි, මළඑකෙක්මවේ; පුත්ත, පුත්‍රය; තං වාපි, ඒතොපනිසාම; රොදන්ති, හඬම්සිකීය.

253 කුක්කුලා උබ්බහතො තාත කුක්කුලෙ පතිතුමිච්ඡසි,
නරකා උබ්බහතො තාත නරකං පතිතුමිච්ඡසි.

253 තාත, පුත, කුක්කුලා, උණුහලුනිරයෙන්; උබ්බහතො, නගනලද (තෝ); කුක්කුලෙ, උණුහලුනිරයෙහි; පතිතුං, (නැවත) හෙන්නට; ඉච්ඡසි, කැමැත්තෙහිද; තාත, පුත; නරකා, නරකයෙන්; උබ්බහතො, නගනලද්දවූ (තෝ); නරකං, ඒ නිරයෙහි; පතිතුං, (නැවත) හෙන්නට; ඉච්ඡසි, කැමැත්තෙහිද.

254 අභිධාවථ භද්දං තෙ කස්ස උජ්ඣාපයාමසෙ,
ආදිත්තා නීහටං භණ්ඩං පුන ඩය්හිතුමිච්ඡසි.

254 අභිධාවථ, වහාදුවව්; තෙ, තට; භද්දං, යහපතක්වේවා; (මයං,

අපි); කස්ස, කවරෙකුට; උජ්ඣාපයාමසෙ, අවඥකරවමුද; (කාඅවඥකරවම්හ) ආදිත්තා, ගිනිගත්ගෙයින්; නීහටං, බැහැරකළ, භණ්ඩං, බඩු; පුන, නැවත; ඩය්හිතුං, දවනුවට; ඉච්ඡසි, කැමැත්තෙහිද?.

### සාණුසාමණෙරවත්‍ථු.

---

256 පබ්බතස්ස සුවණ්ණස්ස ජාතරූපස්ස කෙවලී,
විත්තා'පි නාලමෙකස්ස ඉති විද්වා සමං චරෙ.

256 සුවණ්ණස්ස, ස්වර්ණසම්බන්ධවූ; කෙවලී, හුදකලාවූ; පබ්බතො අස්ස, පර්වතයක්වන්නේද; ජාතරූපං අස්ස, (පර්වතයහෝ හුදකලාවූ) ස්වර්ණවන්නේද; විත්තාපි, විභාවයෙනුත්;(හෙවත්-එක්ස්වර්ණ පර්වතයක්තබා එපමණ මහත් ස්වර්ණපර්වත දෙකක්වන්නේනමුත්); එකස්ස, එකෙකුට, නඅලං, පමණනොවෙයි; ඉති විද්වා, මෙසේ (දන්නාවූ) පණ්ඩිතතෙම; සමං චරෙ, සමවහැසිරෙන්නේය; (සමචර්‍යායෙහියෙදෙන්නේයි).

257 යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං
කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
උපධිං විදිත්වා සඞ්ගො'ති ලොකෙ
තස්සෙව ජන්තු විනයාය සික්ඛෙ.

257 යො, යම්කිසිවෙක්; යතො නිදානං, යම්පඤ්චකාමගුණයක් නිදන්කොටඇති; දුක්ඛං, දුක; අද්දක්ඛි, දුටුයේද; සො ජන්තු, ඒ සත්ව තෙම; කාමෙසු, ඒ දුකටනිදන්වූ කාමයන්හි; කථං, කවරකාරණයෙන්; නමෙය්‍ය, නැමෙන්නේද; ජන්තු, සත්වතෙම; ලොකෙ, ලෙව්හි; උපධිං, කාමගුණොපධිය; සඞ්ගො ඉති, ලග්නයෙකැයි; විදිත්වා, දැන; තස්ස එව, ඒ කාමගුණො පධිහුගේම; විනයාය, විනයනයපිණිස; සික්ඛෙ, හික්මෙන්නේය.

### මාරවත්‍ථු
### තෙවීසතිමො වග්ගො.

---

ආතුරං අසුචිං පූතිං පස්ස ඛෙමෙ සමුස්සයං,
උග්ඝරන්තං පග්ඝරන්තං බාලානං අභිපත්‍ථිතං.

171–අඞ්කයබලනු.

### ඛෙමාථෙරිවත්‍ථු.

258 ඉඞ්ඝ පස්ස නටපුත්තක උග්ගසෙන මහබ්බල,
කරොහි රඞ්ගං පරිසාය හාසයස්සු මහාජනං.

258 ඉඞ්ඝ, එහෙයින්; මහබ්බල, මහත්බල ඇත්තාවූ; නටපුත්තක,

නළුපුත්‍රවූ; උග්ගසෙන, උග්ගසේනය; පස්ස, බලව; පරිසාය, පිරිසෙහි; රඞ්ගං, රඟ; කරොමි, කරව; මහාජනං, මහජනයා; හාසයස්සු, සතුටුකරව.

259 ඉද්ධිපස්ස මහාපඤ්ඤ මොග්ගල්ලාන මහිද්ධික,
කරොමි රඞ්ගං පරිසාය හාසයාමි මහාජනං.

259 මහාපඤ්ඤ, මහප්‍රඥාඇත්තාවූ; මහිද්ධික, මහත් සෘද්ධිඇත්තාවූ; මොග්ගල්ලාන, මොග්ගල්ලානයෙනි; ඉද්ධිපස්ස, එකැඟියෙන් මෙහි බල; පරිසාය, පිරිස්හි; රඞ්ගං කරොමි, රඟකරමි; මහාජනං, මහජනයා; හාසයාමි, සතුටුකරවමි.

260 සබ්බසඤ්ඤොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති,
සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.

260 යො, යම්කිසිවෙක්; සබ්බසඤ්ඤොජනං, සියලුදසවිධ සංයොජනය; ඡෙත්වා, (චතුරාර්‍ය්‍යමාර්ගයෙන්)සිඳ, වෙ, එකාන්තයෙන්; න පරිතස්සති, (ජීවිතනිකාන්ත්‍යභාවයෙන්) බියනොවේද; සඞ්ගාතිගං, රාගාදී සඞ්ගයන් ඉක්මනියාවූ; විසංයුත්තං, කෙලශබන්ධනයන් කෙරෙන්විදුනාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං, බ්‍රාහ්මණයයි; බ්‍රූමි, කියමි.

උග්ගසෙන සෙට්ඨිපුත්තවත්ථු.

---

261 සබ්බං භණ්ඩං සමාදාය පාරං තිණ්ණොසි බ්‍රාහ්මණ,
පච්චාගච්ඡ ලහුං ඛිප්පං මම්පි තාරෙහි දානිතො.

261 බ්‍රාහ්මණ, බමුණ; සබ්බං භණ්ඩං, හැම්බඩු; සමාදාය, රැගෙණ; පාරං, පරතෙරට; තිණ්ණො අසි, තීර්ණවූයේ(පැමිණියේ)වෙහිය; ලහුං, වහා; පච්චාගච්ඡ, ආපසුහැරී (පෙරලා)එව; ඉදනි, දැන්; ඉතො, මෙසින්; මං අපි, මාත්; ඛිප්පං, වහා; තාරෙහි, එතරකරව.

262 අසන්ථුතං මං චිරසන්ථුතෙන නිමිනාසි හොතී අධුවං ධුවෙන,
මයාපි හොතී නිමිනෙය්‍ය අඤ්ඤං ඉතො අහං දූරතරං ගමිස්සං.

262 හොතී, පින්වතිය; අසන්ථුතං, විශ්වාසනොවූ; අධුවං, අධ්‍රැවවූ; මං, මා; චිරසන්ථුතෙන, චිරපරිචිතවූ; ධුවෙන, එකාන්තපුරුෂයා කාරණකොටගෙණ; නිමිනාසි, පෙරලාගත්තීය; හොතී, පින්වතුනි; මයාපි, මාකාරණකොටගෙණත්; අඤ්ඤං අන්‍යප්‍රියවත්‍යයෙකු; නිමිනෙය්‍ය, පෙරලාගන්නීය; අහං, මම; ඉතො, මෙතනින්; අඤ්ඤං දූරතරං, අන් ඉතාදුර දෙසකට; ගමිස්සං, නැඟීයන්නෙමි.

263 කායං එලගලාගුම්බෙ කරොති අහුහාලියං,
නයිධ නච්චං වා ගීතං වා තාලං වා සුසමාහිතං;
අනම්හකාලෙ සුසොණි කිනනු ජග්ඝසි සොභනෙ.

263 එලගලාගුම්බෙ, කලිල්ලැහැප්හිද; අහුහාලියං කරොති, දත්විදහා මහසිනාකෙරෙයි; ත්‍ා අයං, මෝ කවරියක්ද; (යමක් ද ක තොසෙයිද එසේවූ සිනාවට සුදුසුවූ) නච්චං වා, නෘත්‍යයක් හෝ; ගීතං වා, ගීතයක්හෝ; සුසමාහිතං, මොනවට අත්එකතුකොට කර ණලද; තාලංවා, අත්තලක්හෝ; ඉධ, මෙහි; න, නැත්තේය; සුසොණි, සොඳුරුඳුවන්ඇති; සොභනෙ,සොභමානාවෙනි; අනම්හකාලෙ, හැඬුවමනාකල්හි; කිනනු ජග්ඝසි, කුමක්හෙයින් හස්නෙහිද?.

264 සිගාල බාල දුම්මෙධ අප්පපඤ්ඤොසි ජම්බුක,
ජීනො මච්ඡං ච පෙසිං ච කපණො විය ඣායසි.

264 සිගාල, ශෘගාලය; බාල, අඥනය; දුම්මෙධ, දුර්මේධය; ජම්බුක, ජම්බුකය; අප්පපඤ්ඤොසි,තෝනොපැණැත්තෙහිය;මච්ඡං ච, මස්ද; පෙසිං ච, මාංසපෙසියද,(යන මේ දෙකින්)ජීනො,පිරිහුම්කෙළේ; කපණො විය,දහසින් පැරදුනු දුගියෙක්මෙන්; ඣායසි; ශොකයෙන් සිත්විලිසිතන්නෙහිය.

265 සුදස්සං වජ්ජං අඤ්ඤසං අත්තනො පන දුද්දසං,
ජීනා පතිං ච ජාරං ච ත්වම්පි මඤ්ඤෙව ඣායසි.

265 අඤ්ඤසං, අන්‍යයන්ගේ, වජ්ජං, වද්‍යය; සුදස්සං, සුවසේ දක්කහැක්කේය; අත්තනො පන, තමාගේවරදවනාහි; දුද්දසං, දක්නට නොපිළිවන; (එසේහෙයින්) ත්වම්පි, තීද; පතිං ච, සැමියාද; ජාරං ච, සොරසැමියාද; (යනමේ දෙදෙනාකෙරෙන්) ජීනා, ජානිප්‍රාප්තියක්ව; මං එව, මාමෙන්ම; ඣායසි, සිතන්නෙහිය.

266 එවමෙතං මිගරාජ යථා භාසසි ජම්බුක;
සා නූනාහං ඉතො ගන්ත්වා හත්තු හෙස්සං වසානුගා.

266 මිගරාජ, මෘගරාජය; ජම්බුක, ජම්බුකය; යථා භාසසි, යම් සේ තෝකීයෙහිද; එතං, මේ කාරණය; එවං, මෙසේමය; සා අහං, ඒ මම,නූන,එකාන්තයෙන්;ඉතො ගන්ත්වා,මෙසින්ගොස්(අන්හිමියෙක් ලදින්)හත්තු, ස්වාමිහුගේ; වසානුගා හෙස්සං, විසී බවට පැමිණියක් වන්නෙමි.

267 යො හරෙ මත්තිකාථාලං කංසථාලම්පි සො හරෙ,
කතංයෙව තයා පාපං පුනපෙවං කරිස්සසි.

267 යො, යම්ක්සිවෙක්; මත්තිකාථාලං, මැටිතලියක්; හරෙ, පැහැරගන්නේද; සො, හෙතෙම; කංසථාලම්පි, රන්තලක්ද; හරෙ,

පැහැරගන්නේය (සොරාගන්නේය); තයා, තීවිසින්; පාපං, පාපය; කතං එව, කෙළේමය; (එහෙයින්) පුනපි, නැවතද; එවං, මෙසේ; කරිස්සසි, කරන්නෙහිය.

**දහරකාගිකාවුවත්ථු.**

---

විචෙය්‍ය දානං දාතබ්බං යත්ථ දින්නං මහප්ඵලං,
විචෙය්‍ය දානං දත්වාන සග්ගා ගච්ඡන්ති සුග්ගතිං.
විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ.

196–197. අඩකබලනු.

**අඞ්කුරවත්ථු.**

---

268 කුසලූපදෙසෙ ධිතියා දළ්හාය ච
අවත්ථිතත්තා භයභීරුතාය ච,
න රක්ඛසීනං වසමාගමිම්හ
සසොත්ථිභාවො මහතා භයෙන මෙ.

268 කුසලූපදෙසෙ, සෙදහල් පසේබුදුවරයන්ගේ උපදෙසයෙහි (අවවාදයෙහි); දළ්හාය, දෘඪවූ; ධිතියා ච, ධෛර්‍ය්‍යයෙන්ද; භයභීරුතාය, භයජනකකාරණයෙන් භායනශීලිභාවයෙහි; හෙවත් චිත්තොත්‍රාසමාත්‍රසඞ්ඛ්‍යාත භයජා ශරීරකම්පා සඞ්ඛ්‍යාතමහත්භය යනමෙහි; අවත්ථිතත්තා ච, අවස්ථාසහිත හෙයින්ද; රක්ඛසීනං, යකින්නන්ගේ; වසං, විසීබවට; න ආගමිම්හ, නොපැමිණියෙමු; මෙ, මට; මහතා භයෙන, මහත්බියෙන්; සො සොත්ථිභාවො, හේසෙත් බැව්වී.

**පචනිකාබූතං වත්ථු.**

**චතුවීසතිමොවග්ගො.**

---

269 තව සද්ධං ච සීලං ච විදිත්වාන ජනාධිප,
වණ්ණං අජිනවණ්ණෙන කාලිඞ්ගස්මිං විනිමහසෙ,

269 ජනාධිප, ජනශ්‍රෙෂ්ඨය; තව, තාගේ; සද්ධං ච, කම්ඇදහීම් යයි කියනලද ඔකප්පනශ්‍රද්ධාවද; සීලං, සංවර අව්‍යතික්‍රමශීලවශයෙන් දෙවැදෑරුම්ශීලයද; වණ්ණං, හිරණ්‍යසුවණ්ණධනධාන්‍යයද; (නොහොත්, ගුණයද); විදිත්වාන, දැන; අජිනවණ්ණෙන, අඳුන්පිඩක්බඳු හස්තිරාජයාකරණකොටගෙණ; කාලිගස්මිං, කලිඟුරටරජ්ජුසම්පයෙහි; විනිමහසෙ, විනිමය වශයෙන් මේසියල්ලගතිමු.

270 ගණිකා උප්පලවණ්ණා පුණ්ණා දෙවාරිකො තදා,
රජ්ජුගාහො ච කච්චානො දොණාමච්චො ච කොලිතො.

270 තදා, එසමයෙහි; ගණිකා, ගණිකාංගනාමෝ; උප්පලවණ්ණා, දැන් උපුල්වන්මහතෙරනිය; දෙවාරිකො, දොරටුපල්තෙම; පුණ්ණා, පුණ්ණසථ්විරයෝය; රජ්ජුගාහො, ක්ෂෙත්‍රරජ්ජුගාහකතෙම; කච්චානො, මහාකාත්‍යායන සථ්විරයෝය, දොණාමච්චො, ද්‍රෝණ මානාමාත්‍යතෙම; කොලිතො, (දැන්) මහාමොග්ගල්ලායන සථ්විරයෝය.

271 සාරිපුත්තො තදා සෙට්ඨි අනුරුද්ධො ච සාරථි,
බ්‍රාහ්මණො කස්සපො ථෙරො උපරාජානන්ද පණ්ඩිතො.

271 තදා, එසමයෙහි; සෙට්ඨි, සිටුතෙම; සාරිපුත්තො, (දැන්) සාරිපුත්‍රසථ්විරයෝය; සාරථි, සාරථිතෙම; අනුරුද්ධො, අනුරුද්ධසථ්විරයෝය; බ්‍රාහ්මණො, පුරොහිත බ්‍රාහ්මණතෙම; කස්සපො ථෙරො, කාශ්‍යපසථ්විරයෝය; උපරාජා, යුවරජතෙම; ආනන්ද පණ්ඩිතො, ආනන්දනම්පණ්ඩිතසථ්විරයෝය.

272 මහෙසී රාහුලමාතා මායාදෙවී ජනෙත්තිකා,
කුරුරාජා බොධිසත්තො එවං ධාරෙථ ජාතකං.

272 මහෙසි, (එකල) මෙහෙසීනම්; රාහුලමාතා, (දැන්) රාහුලමාතාවෝය: ජනෙත්තිකා, (එකල) මව්නම්; මායාදෙවී, (දැන්) මහාමායාදෙවිය; කුරුරාජා, (එකල) කුරුරජනම්; බොධිසත්තො, බොධිසත්ත්වූමම වෙමිසි; එවං, මෙසේ; ජාතකං, ජාතකය; ධාරෙථ, (සිත්හි) දරව්.

**හංසසාතක ගිජ්ඣවත්ථු.**

---

273 අවධී වත අත්තානං කච්ඡපො ව්‍යාහරං ගිරං,
සුග්ගහීතස්මිං කට්ඨස්මිං වාචාය සකියා වධී.

273 කච්ඡපො, කැසුප්තෙම; ගිරං, තෙපුල්; ව්‍යාහරං, බණන්නේ අත්තානං, තමා; වත, එකාන්තයෙන්; අවධි, නැසීය. සුග්ගහිතස්මිං, මුවෙන් මොනවට ඩැහැගන්නාලද; කාෂ්ඨස්මිං, කාෂ්ඨයෙහි; (ඩැහගත් තැන හැර) සකියා වාචාය, සිය බසින්; අවධී (තෙමේම තමා) නැසීය.

274 එතම්පි දිස්වාන නරවිරියසෙට්ඨ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං;
පස්සසි බහුභාණෙන කච්ඡපං ව්‍යසනං ගතං.

274 නරවිරියසෙට්ඨ, නරවීර්‍ය්‍යශ්‍රෙෂ්ඨය; එතම්පි, මේකාරණයද;

දිස්වාන, දැක; කුසලං වාචං, සත්‍යාදීන්ප්‍රතිසංයුක්තතෙපුල්; පමුචෙ, හරණේය; (නිදෙස්කොට බණන්නේය); අතිවෙලං, වෙලාතික්‍රමණය කොට; (නුසුදුසුකල්හි) න මුචෙ, (සුබැසිනුමුත්) නොබණන්නේය; බහුභාණේන, බොහෝකොට බිණීමෙන්; ව්‍යසනං ගතං, ව්‍යසනයට ගියාවූ; කාවජපං, කුම්භීය; පස්සසි, ප්‍රත්‍යක්‍ෂවශයෙන් දක්නෙහිද?

### කොකාලික වත්ථු.

---

275 පුරාණචොරාන වචො නිසම්ම
මහිලාමුඛො පොථයමානුචාරී,
සුසඤ්ඤතානං හි වචො නිසම්ම
ගජුත්තමො සබ්බගුණෙසු අට්ඨා.

275 මහිලාමුඛො,(හස්තිනීමුඛසදෘශත්වයෙන් හෝ අභිමුඛදර්ශනත්වයෙන් හෝ බනාහෙයින්) මහිලාමුඛනම්ඇති හස්තිරාජතෙම; පුරාණචොරානං, පුරාණචෞරයන්ගේ; වචො, රළුබස්; නිසම්ම, අසා, පොථයං,පහරදෙන්නේ;මනනුචාරී,කොපයෙන් යුක්තව හැසිරෙන්නේවිය; (නොහොත්-අනුචාරී, සොරුන්ගේ රළුබසට අනුව හැසුරුණේය; සුසඤ්ඤතානං, කායවාඞ්මනඃසමාචාරයෙන් සුසංයතශීලවන්තයන්ගේ; වචො, සන්හුන්බස්;නිසම්මහි,අසාවනාහි;ගජුත්තමො, ගජොත්තමතෙම;(මඟුලැත්තෙම); සබ්බගුණෙසු, සියළු පුරාණ ගුණයන්හි; අට්ඨා, පිහිටියේය.

### විපක්ඛ සෙවක භික්ඛුවත්ථු.

---

276 යදග්ගතො මජ්ඣතො සෙසතො වා
පිණ්ඩං ලභෙථ පරදත්තූපජීවී,
නාලත්ථ තං නොපි නිපච්චවාදී
තං වාපි ධීරා මුනිං වෙදයන්ති.

276 අග්ගතො වා, අග්‍රවශයෙන්හෝ; මජ්ඣතො වා, මධ්‍යවශයෙන්හෝ; සෙසතො වා, ශෙෂවශයෙන්(අන්තිමවශයෙන්)හෝ;පරදත්තූපජීවී; පරදත්තූපජීවි ප්‍රෙතයෙක්සෙයින්;යං පිණ්ඩං, යම්පිඬක්;ලභෙථ, ලබන්නේද;තං,ඒ පිඬය; නඅලත්ථඅපි, නොලැබීනමුත්; නොනිපච්චවාදී, ප්‍රතිවිරුඬබස් (ගරහතෙපුල්) නොබණන්නේවේද; ධීරා ධෘතිමත්හු;තංවාපි, ඔහුද; මුනිං, මුනියයි, වෙදයන්ති; දනිත්.

### පචග්ග දායකබ්‍රාහ්මණ වත්ථු.

---

277 එහි වක්කලි මා භායි ඔලොකෙන්තො තථාගතං,
අහං තං උද්ධරිස්සාමි පඞ්කෙ සන්නංව කුඤ්ජරං.

277 වක්කලි, වක්කලිය; තථාගතං, තථාගතවූ (මා); ඔලොකෙන්තො, බලමින්; එහි, (මෙහි) එව; මා භායි, බියපත්නොවෙව; පඞ්කෙ සන්නං, මඩෙහිඑරුණු; කුඤ්ජරං ඉව, ඇතෙකු (උගුලන්නාවූ ඇතරුවෙක්) මෙන්; අහං, මම; තං, තා; උද්ධරිස්සාමි, උදුරන්නෙමි.

278 එහි වක්කලි මා භායි ඔලොකෙන්තො තථාගතං,
අහං තං උද්ධරිස්සාමි රාහුගහිතංව චන්දිමං.

278 වක්කලි, වක්කලිය; තථාගතං, තථාගතවූ (මා); ඔලොකෙන්තො, බලමින්; එහි, (මෙහි) එව; මා භායි, නොබව; රාහුගහිතං, රාහුවිසින් ගන්නාලද්දාවූ; චන්දිමං ඉව, චන්ද්‍රයා (මුදවන්නාක්) මෙන්; අහං, මම; තං, තා; උද්ධරිස්සාමි, උදුරන්නෙමි (මුදවන්නෙමි).

වක්කලි ථෙරවත්ථු.

---

279 ඉමිනා පන දනෙන මා මෙ දළිද්දියං අහු,
නත්ථී'ති වචනං නාම මා අහොසි භවාභවෙ.

279 ඉමිනා දනෙන පන, මේදනය කරණකොටගෙණවනාහි, මෙ, මට; දළිද්දියං, දිළිඳුබවක්; මා අහු, නොවේවා; නත්ථි ඉති වචනං නාම, නැතයනබසක් නම්; භවාභවෙ, භවෙන්භවෙහි හෙවත් කිසිභවයෙක්හි; මා අහොසි, (අසන්ට) නොවේවා.

280 පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං,
තෙවිජ්ජා ඉද්ධිපත්තොම්හි කතං බුද්ධස්ස සාසනං.

280 පුබ්බෙනිවාසං, පෙරවිසූ කඳපිළිවෙළ; ජානාමි, දනිමි; දිබ්බචක්ඛු, දිවැස්; විසොධිතං, වෙසෙසින් ශුද්ධකරගන්නාලද්දේය; තෙවිජ්ජා, ත්‍රිවිද්‍යාඇත්තේ; ඉද්ධිපත්තො අම්හි, සෘද්ධිප්‍රාප්තවූයේ වෙමි (විසීපතුයෙම්); බුද්ධස්ස, සම්‍යක්සම්බුද්ධයන්වහන්සේගේ; සාසනං, අනුශාසනය; කතං, කරණලද්දේය.

281 අන්නභාරො පුරෙ ආසිං දළිද්දො කාජහාරකො
පිණ්ඩපාතො මයා දින්නො උපරිට්ඨස්ස යසස්සිනො,

281 පුරෙ, පෙර; කාජහාරකො, තණකදගෙණයන්නාවූ; අන්නභාරො අන්නභාරනම්වූ; දළිද්දො, ආසිං, දිළින්දෙක්වූයෙමි; මයා, (ඒ අන්නභාරනම්වූ) මාවිසින්; යසස්සිනො, යසපිරිවරඇති; උපරිට්ඨස්ස, උපරිට්ඨනම් පසේබුදුන්ට; පිණ්ඩපාතො, පිණ්ඩපාතයක්; දින්නො, දෙනලද්දේය.

282 සුණොහි මෙ නාගරාජ උග්ගතෙජ මහබ්බල,
දෙහි මෙ පානීයඝටකං * භෙසජ්ජත්ථම්හි ආගතො.

282 උග්ගතෙජ, උග්‍රතෙජස්ඇති; මහබ්බල, මහත්බලඇති; නාගරාජ, නාරජ; මෙ, මාවදන්; සුණොහි, අසනුමැනව; මෙ, මට; පානීයඝටකං, පැන්කලයක්; දෙහි, දෙව; භෙසජ්ජත්ථං, බෙහෙත්පිණිස; ආගතො අම්හි; ආයේවෙමි.

283 පුරත්ථිමස්මිං දිසාභාගෙ ගඞ්ගා නාම මහානදී,
මහාසමුද්දං අප්පෙති තතො ත්වං පානියං හර·

283 පුරත්ථිමස්මිං දිසාභාගෙ, පූර්වදිශාභාගයෙහි; ගඞ්ගා නාම, ගඞ්ගානම්වූ; මහානදී, මහාගඞ්ගාතොමෙ; මහාසමුද්දං, මහමුහුදට; අප්පෙති, පැමිණෙයි; තතො, එයින්; ත්වං, ඔබ; පානීයං, පැන්; හර, ගෙණයව.

284 ඉතොව පානීයං හරිස්සං ඉමිනාවම්හි අත්ථිකො,
යදි තෙ ථාමබලං අත්ථි නාගරාජ නිවාරය.

284 ඉතො එව, මේනූතත්විලින්ම, පානීයං, පැන්; හරිස්සං, ගෙණයන්නෙමි; ඉමිනා එව, මෙයින්ම; අත්ථිකො අම්හි, අර්ථඇත්තේවෙමි; නාගරාජ, නාරජ; යදි, ඉදින්; තෙ, තට, ථාමබලං අත්ථි, චෛතසික ශක්තියක් හා කායිකශක්තියක් ඇත්නම්; නිවාරය වළක්ව.

285 සාමණෙර සචෙ අත්ථි තව වික්කමපොරිසං,
අභිනන්දාමි තෙ වාචං හරස්සු පානියං මම.

285 සාමණෙර, හෙරණ; සචෙ, ඉදින්; තව, තාගේ; වික්කමපොරිසං, වික්‍රම පෞරුෂයක් (විකුම්පුරිස්බවක්); අත්ථි, ඇත්නම්; තෙ වාචං, තාබස්; අභිනන්දාමි, සතුටින් පිළිගණිමි; මම පානීයං, මා පැන්; හරස්සු, හැකිනම් හැරගණු.

**සුමනසාමණෙර වත්ථු.**
**පඤ්චවීසතිමො වග්ගො.**

---

286 සමණං තං මඤ්ඤමානො උපගච්ඡිං අසඤ්ඤතං,
සො මං දණ්ඩෙන පාහාසි යථා අස්සමණො තථා.

216 සමණං, ශ්‍රමණයෙකැයි; මඤ්ඤමානො, හඟිමින්; අසඤ්ඤතං, කායචාරාදීන් අසංයතවූ; තං, තාකරා; උපගච්ඡිං, එළඹියෙමි; සො, ඒතෝ; මං, (එසේඑළඹි) මා, අස්සමණො, අශ්‍රමණයෙක්, යථා, යම්සේද; තථා, එපරිද්දෙන්; දණ්ඩෙන, මුද්ගරයෙන්; පාහාසි, ගැසීය.

---

* "පානීයවාරකං, පැන්අත්ලක්" යි ගැටපද.

287 කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහණං බාහිරං පරිමජ්ජසි.

287 දුම්මෙධ, එම්බා අඥානය; තෙ, තට, ජටාහි; දළමඩුල්ලෙන්; කිං, කිනම්පලද; අජිනසාටියා, (එකස්කොටපෙරවූ) අඳුන්දිවිසමින්; තෙ, තට; කිං, කිනම්ප්‍රයොජනද; තෙ, තාගේ; අබ්භන්තරං, අභ්‍යන්තරය(සිත); ගහණං, (ලොභාදීන්) ගැවසීගත්තේය; බාහිරං, හුදෙක්පිටත; පරිමජ්ජසි, පිරිමැදුම්කෙරෙහිය.

288 එහි ගොධෙ නිවත්ථස්ස භුඤ්ජ සාලීනමොදනං,
තෙලං ලොණං ච මෙ අත්ථි පහූතං මය්හ පිප්ඵලිං.

288 ගොධෙ, ගොධාව; එහි, (මෙහි) එව; නිවත්ථස්සු, නවතු; මය්හං, මට; පහූතං, බොහෝවූ; තෙලං, තෙල්ද; ලොණං, ලුණුද, පිප්ඵලිං, වගපුල්ආදියද; අත්ථි, ඇත; සාලීනං ඔදනං, (එයින් අභිසංස්කෘතවූ) හැල්බත; භුඤ්ජ, වළඳව.

289 එස භීයො පවෙක්ඛාමි වම්මිකං සතපොරිසං,
තෙලං ලොණං ච කිත්තෙසි අහිතං මය්හ පිප්ඵලිං.

289 එසො, මේමම; සතපොරිසං, ශතපෞරුෂප්‍රමාණවූ, වම්මිකං, තුඹසට; භීයො, නැවත; පවෙක්ඛාමි, ප්‍රවිෂ්ටවන්නෙමි; මය්හං, මට; අහිතං, අපථ්‍යවූ. තෙලං, තෙල්ද; ලොණං, ලුණුද; පිප්ඵලිං, වගපුල්ඇතුළුබඩුද; කිත්තෙසි, මට ඇතැයිකීර්තනයකොළෙහිය.

## කුහක බ්‍රාහ්මණවත්ථු

290 කිංසු ඣත්වා සුඛංසෙති කිංසු ඣත්වා න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතම.

291 කිංසු, කුමක්; ඣත්වා, නසා; සුඛං සෙති, සුවසේ සයනය කෙරේද;? කිංසුඣත්වා, කුමක්වධකොට; නු සොචති, ශොකනොකෙරේද ? ගොතම, ගෞතමයෙනි; කිස්සස්ස එකධම්මස්ස, මෙකිනම්එකධර්මයක්හුගේ; වධං, විනාශය; රොචෙසි, රුස්නෙහිද;

291 කොධං ඣත්වා සුඛං සෙති කොධං ඣත්වා න සොචති,
කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ;
වධං අරියා පසංසන්ති තං හි ඣත්වා න සොචති.

291 බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; කොධං, ක්‍රොධය; ඣත්වා, නසා; සුඛං සෙති, සුවසේසයනයකරයි; කොධං, ක්‍රොධය; ඣත්වා, නසා, නසොචති, ශොකනොකරයි; විසමූලස්ස, විසමුල්ඇති; මධුරග්ගස්ස, මිහිරිඅගඇති; කොධස්ස, ක්‍රොධයාගේ; වධං, නැසීම; අරියා, ආර්‍ය්‍යයෝ; පසංසන්ති, පසත්; හි, යම්හෙයකින්, තං, එය, ඣත්වා, නසා; න සොචති, ශොක නොකෙරේද; (එහෙයිනි).

## අක්කොසක භාරද්වාජවත්ථු.

292 විසුද්ධො වත මෙ වාසො නිම්මලං මං තපස්සිතං,
මා ත්වං විසුද්ධං දූසෙසි නික්ඛමා'පි වනා තුවං.

292 මෙ, මාගේ; වාසො, වාසයතෙම; වත, ඒකාන්තයෙන්, විසුද්ධො, පිරිසිදුය; තපස්සිතං, (මා) මහණබැවි; නිම්මලං, (රාගාදිමලරහිතහෙයින්)නිර්මලය; ත්වං, තෝ; විසුද්ධං, පිරිසිදුවූ; මං, මා; මා දූසෙසි, දූෂණයනොකරව; අපි, වැලි; තුවං, තෝ; වනා, වනයෙන්; නික්ඛම, නික්මෙව.

### පතිගාරවාසිභික්ඛුවත්ථු.

293 අලත්තකකතා පාදා පාදුකාරුය්හ වෙසියා,
ත්වම්පි දහරො මම අඞ්ගම්පි දහරා තව;
උභො'පි පබ්බජිස්සාම පච්ඡා ජිණ්ණා දණ්ඩපරායණා.

293 අලත්තකකතාපාදා, ලතුවිලස්පාඇති, වෙසියා, වෙශ්‍යාතොමෝ; පාදුකාරුය්හ, මිරිවැඩිනැගී; (මෙසේකියයි); ත්වම්පි, තුඹවහන්සේද; මම, මටනිසිවූ; දහරො, තරුණයෙක්වෙහිය: අඞ්ගම්පි, මමද; තව, තුඹවහන්සේට (නිසි); දහරා, තරුණියක්වෙමි, පච්ඡා, පසුව; උභොඅපි, අපිදෙදෙනම; ජිණ්ණා, ජරාජීර්ණවූවාහු; දණ්ඩපරායණා, දණ්ඩපරායණවූවාහු; පබ්බජිස්සාම, පැවිදිවන්නෙමු.

294 න කි රත්ථි රසෙහි පාපියො ආවාසෙහි ච සන්ථවෙහි වා,
වාතමිගං ගෙහනිස්සිතං වසමානෙසි රසෙහි සඤ්ජයො.

294 ආවාසෙහි ච, ආවාසයෙහිද (ඡන්දරාගය), පාපියො, ලාමකය, සන්ථවෙහි වා, මිත්‍රසන්ථවයෙහිද (ඡන්දරාගය); පාපියො, ලාමකය, (එදෙතැන්හි ඡන්දරාගයටවැඩිවූ); රසෙහි, ජිහ්වාවිඥෙයරසයෙහි (ඡන්දරාගයටවඩා); පාපියො, පාපතරයෙක්, න අත්ථි කිර, නොමැත්තේල; (ඒඑසේමැයි); සඤ්ජයො, එනම්උයන්පල්හුතෙම; ගෙහනිස්සිතං, ගෘහස්ථානාශ්‍රිතවූ; වාතමිගං, වාතමෘගයා. රසෙහි, රසකරණපකාට ගෙණ, අත්තනො වසං, තමාපිසිබවට, ආනෙසි, ගෙණාවිය; (පැමිණෙවිය.

### සුන්දරසමුද්දථෙරවත්ථු.

295 කස්ස දජ්ජා දෙය්‍යධම්මං කස්ස දින්නං මහප්ඵලං,
කථං හි යජමානස්ස කථං ඉජ්ඣති දක්ඛිණා.

295 දෙය්‍යධම්මං, දෙයධර්මය; කස්ස, කවරෙකුට, දජ්ජා, දෙන්නේද; කස්ස, කවරෙකුට; දින්නං, දෙනලද්දේ; මහප්ඵලං, මහත්විපාකඵල ඇත්තේද; කථං හි, කවරාකාරයකින්; යජමානස්ස, යාගකරන්නා (දෙන්නා)හට; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; කථං ඉජ්ඣති, කෙසේ නිපදීද


### දෙවභගිකබ්‍රාහ්මණවත්ථු.

### ඡබ්බීසතිමො වග්ගො.

රත්මලානේ
**පරම ධම්මචෙතිය පරිවෙණ වාසි සූරියගොඩ සුමඞ්ගල**
සාමීන් විසින් ලියනලද ධම්මපදට්ඨකථා ගාථා සන්නය.

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු